පායාසිරාජඤ්ඤ සූත්‍රය

පායාසිරාජඤ්ඤ සූත්‍රය.

කොළඹ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ

උප ප්‍රධානාචාර්‍ය්‍ය

බද්දෙගම පියරතන ස්වාමිපාදයන් වහන්සේ

විසින් ලියන ලද

සවිස්තර භාවසන්න සහිතයි.

කීර්ත්තිශේෂගත ශෝගිස්ථාණේ

කුලතිලක අධිනායක හේරත් රණසිංහ

කොර්ණර් රාලහාමිට නිවන් සැප ප්‍රාර්ථනා කොට

පින් පැමිණවීම සඳහා

(විතීය සංවත්සර දිනයෙහි)

ධර්මදාන වශයෙන් බෙදාදීම පිණිස

තත් ප්‍රියපත්නී වූ

ඇස්. ජේ. සිල්වා රණසිංහ හාමිනේ

සහ.

තත් ප්‍රිය දුහිතෘ වූ

සෝමාවති මුණසිංහ හාමිනේ විසින්

මුද්‍රණය කරවන ලදී.

2479
1935

සවිස්තර භාවසන්න
සහිත
පයාසිරාජඤ්ඤ සූත්‍රය.

ශුද්ධියක්

"මාතෘපිතෘපස්ථානය" යනු "මාතෘපිතෲපස්ථානය" කියා ද
"අකුශල්" යනු "අකුසල්" කියා ද විය යුතුයි.

සංඥාපනය.

සවිස්තර භාවසන්න

සහිත

පයාසිරාජඤ්ඤ සූත්‍රය.

මේ වනාහි දීඝනිකාය (=දික්සඟි) නම් පොත් වහන්සේම අයත් මහාවග්ගයේ 10 වෙනි සූත්‍රයයි. මෙහි පායාසිරාජඤ්ඤයන් "පරලොවෙක් නැත, මැරී උපදනා සත්ත්වයෝ නැත, පින් පව්වල විපාක නැත" කියා මිථ්‍යාදෘෂ්ටි ගෙණ සිටි බවත්, ඒ ගැණ ඔහු නොයෙක් කරුණු ගෙණ හැර දක්වා තර්ක කළ බවත්, ඒ සියල් ලක්ම ඊට ප්‍රතිවිරුද්ධව නොයෙක් උපමා ගෙණ හැර දක්වීමෙන් කුමාරකාශ්‍යප රහතන් වහන්සේ විසින් බිඳ හැරි බවත්, ඉන් පසු පායාසිරාජඤ්ඤයන් ඒ ලාමක දෘෂ්ටිය අත්හැර තෙරුවන් සරණ ගොස් (නොසකස්ව දන් දී) චාතුර්මහාරාජික (පාත) දිව්‍ය ලොකයේ උපන් බවත්, ඔහුගේම දානයෙහි ව්‍යාපෘතව (සකස් කොට දන් දුන්) උත්තර නම් මාණවකයා (ඊට ඉහලින් තිබෙන) තව්තිසා දෙව්ලොව උපන් බවත්, චාතුර්මහාරාජික දිව්‍යලොකයේ ශූන්‍යවූ සෙරිස්සක නම් දිව්‍ය විමානයට දිවාවිහරණය පිණිස වැඩියාවූ ගවම්පති නම් රහතන් වහන්සේ වෙත පායාසි දිව්‍ය පුත්‍රයා එළඹ නොසකස්ව දන් දීමෙන් තමන් පාත දිව්‍යලොකයේ උපන් බව හා ස්වකීය දානයෙහිම ව්‍යාපෘතව සකස් කොට සැදැහැයෙන් දන් දී උත්තර මාණවකයා ඉහල දෙව්ලොව උපන් බවත් කියා ඒ බව මිනිස්ලොවට වැඩ මිනිසුන්ට සැලකර "සකස් කොට දන් දෙව්, සැදැහැයෙන් දන් දෙව්" යයි මිනිසුන්ට වදාරණ ලෙස ආරාධනා කළ බවත්, එසේම උන්වහන්සේ මනුෂ්‍යලොකයට වැඩ මිනිසුන්ට එසේ වදාළ බවත්, විස්තර වශයෙන් ප්‍රකාශ වේ.

සිරිනාථ කුමාරදාස මුණසිංහ මහතා විසින් ධර්මදාන වශයෙන් බෙදා දීම පිණිස මෙබඳු ධර්ම පුස්තකයක් ලියා දුන මැනවැයි ආරාධිත වූ අප විසින් ඒ සඳහා මේ සූත්‍රය තෝරා ගෙණ ඊට සවිස්තර භාවසන්නයක් ලියා– එහි අගට විශෙෂවශයෙන් මාතෘ පිතෘපස්ථානය ද– ශීල– සමාධි– ප්‍රඥා– යන ශික්ෂාත්‍රය ද පිළිබඳව ලියනලද සාමාන්‍ය විභාගයකුත් යොදා මෙසේ මෙය සකස් කරණ ලදී.

මෙහිදී මාගේ කීකරු උගත් ශිෂ්‍යයෙකු වන **හැගොඩ ධම්මින්ද භික්ෂු** නමගේ උපකාරය මාගේ පහසුව පිණිස වූ බවද සතුටින් සඳහන් කරමි.

මේ පොත යෝගියාණේ **සිංහගිරි** මන්දිරාධීශ්වරව සිට 1933 ජූනිමස 23 වෙනි දින කීර්ත්තිශේෂත්වොපගත වූ **කුලතිලක අභිනායක පේරන් රණසිංහ කොරණර්** රාලහාමිගේ ස්වර්ගස්ථ වීමෙන් දෙවසක් පිරීම නිමිති කොට එම රාලහාමිට සගමොක් සුව පතා ධර්මදාන වශයෙන් බෙදා දීම සඳහා එම රාලහාමිගේ ප්‍රියතර පත්නී වූ **ඇස්. ජේ. සිල්වා රණසිංහ** හාමිනේ ද- ආදරණීය දුහිතෘ වූ **සෝමාවතී මුණසිංහ** හාමිනේ ද යන දෙදෙනා විසින් ස්වකීය වියදමින් මහාබෝධි යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණ ලදී.

යථොක්ත රාලහාමි වනාහි ඒ පලාතේ විසූ ඉතා ධර්මිෂ්ඨ ජාතිහිතෛෂී සැදැහැවත් ගුණසම්පන්න බෞද්ධොපාසක තුමෙකු බව පලාත් වැසි සියල්ලෝම දනිත්. එසේම එතුමා, යෝගියාණේ ජයසුන්දරාරාම විහාරස්ථානයේ ප්‍රධාන දායක මහතෙකි. යථොක්ත විහාරස්ථානයෙහි පිහිටුවා තිබෙන ශ්‍රී ශාරීරික චෛත්‍යරාජයානන් වහන්සේ ද මෙතුමාගේ මූලිකත්වයෙන් කර වන ලද්දකි. එපමණක් නොව පලාත්වාසීන්ට ආධාරොපකාර කිරීමාදියෙන් ද සියල්ලන්ගේ සිත් දිනා ගනිමින් විසූ උතුමෙකි.

යම් යම් හිතවතුන් මිය පරලොව ගියකල කෙළෙහි ගුණ සලකන ඥාතිමිත්‍රාදීන් විසින් කටයුතු එකම යුතුකම නම් ඔවුනොවුන්ගේ ගුණ සලකා ධර්මදාන- ආමිෂදානාදී පින්කම් කොට පින් දීම මැයි. ඉන්පුත් ධර්මදානය ම ශ්‍රේෂ්ඨ වේ. එබැවින් මේ පොත සම්පාදනය කරවා බෙදාදීමෙන් ලැබියයුතු මහානිසංසය එකී රාලහාමිටත්- ඊට සහභාගී වූ පින්වතුන්ටත් අයිති වීමෙන් සගමොක් සුව පිණිස හෙතු වේ මැයි.

මේ පොත ලබන සියලුම සැදැහැවතුන් ද මෙහි ඇතුළත් උතුම් ධර්ම කාණ්ඩය හොඳින් පුහුණු කරගෙණ පින්දහම් කිරීමෙන් දුකසේ ලබාගත් මේ මනුෂ්‍යජීවිතය සඵල කරගෙණ දෙව් මිනිස් සැප සහ ශාන්ත සුඛ නිර්වාණ සම්පත්තියත් ලබා ගත යුතුයි.

මීට, හිතාභිලාෂී

බද්දෙගම පියරතන ස්ථවිර.

ශ්‍රී බුද්ධවර්ෂ 2479
ක්‍රි: ව: 1935 ජූනි 13
වෙනි දිනදීය.

සවිස්තර භාව සන්න
සහිත
පායාසිරාජඤ්ඤ සූත්‍රය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

---

1. **එවං මෙ සුතං එකං සමයං ආයස්මා කුමාරකස්සපො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන සෙතබ්‍යා නාම කොසලානං නගරං තදවසරි. තත්‍ර සුදං ආයස්මා කුමාරකස්සපො සෙතබ්‍යායං විහරති උත්තරෙන සෙතබ්‍යං සිංසපාවනෙ.**

---

1. (ආනන්ද නම් වූ) මා විසින් මෙසේ අසන ලදී. නොහොත් මාගේ ඇසීම මෙසේයි. (ශ්‍රීමත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජයන් වහන්සේගේ අශීති මහා ශ්‍රාවකයන් වහන්සේ අතරෙහි විචිත්‍ර කථික භික්ෂූන් කෙරෙන් අග තැන්පත් ආයුෂ්මත් කුමාර කාශ්‍යප (මහ රහතුන්) වහන්සේ එක් සමයෙක්හි පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා සමග කොසොල් දනව්වෙහි සැරිසරණ සේක් සෙතව්‍යා නම් කොසොල් රජුන්ගේ නගරයට පැමිණිසේක. එහි පැමිණද උන්වහන්සේ සෙතව්‍යා නුවරට උතුරු දිග පිහිටි ඇට්ටේරිය වනයෙහි වැඩ වාසය කෙරෙති.

(කුමාරකාශ්‍යප යන මේ නාමය වනාහි උන් වහන්සේ ළදරු කල්හි පැවිදි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් "කාශ්‍යපයා කැඳවව්- මේ පල හෝ කෑ යුතු දේ කාශ්‍යපයාට දෙව්" යනාදින් වදාළ කල්හි කවර කාශ්‍යපයෙකුට දැයි විචාරී මෙන් "කුමාර කාශ්‍යපයාට" යයි මෙසේ ගන්නා ලද නම් ඇති බැවින් එතැන් පටන් මහලු කල්හි ද එපරිද්දෙන් ම කියනු ලැබේ. ඒ හැර රජහු විසින් පෝෂණය කරගත් පුතකු බැවින් ද උන්වහන්සේ කුමාරකාශ්‍යප යයි කියාම පතළ වූහ. ඒ පිළිබඳ අනුපිළිවෙළ කථාව මෙසේ දතයුතු.

මේ කුමර කසුප් තෙරණුවෝ පියුමතුරා බුදුන් සමයෙහි සිටු පුත්‍රයෙක් වූහ. ඉක්බිති එක් දිනක් බුදුහු විසිතුරු කථා ඇති සවකීය ශ්‍රාවකයෙකු අග්‍රස්ථානයෙහි තබනු දැක සද්දවසක්

මහදත් දී "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මම ද අනාගතයෙහි එක් බුදුකෙනෙකුන් සමීපයෙහි මේ තෙරුන් මෙන් විචිත්‍රකථික ශ්‍රාවකයෙක් වන්නෙමිවා"යි ප්‍රාර්ථනා කොට පින් කරන්නාහු කසුප් බුදුන්ගේ සස්නෙහි පැවිදිව විශෙෂ ගුණයක් උපදවන්ට නොහැකි වූහ. එකල පිරිනිවියාවූ කසුප් බුදුන්ගේ ශාසනය පිරිහෙන කල්හි භික්ෂූන් පස් නමක් කතිකා කොට ගෙණ පර්වතයකට නැගි මහණදම් පිරූහ. ඉන් වැඩිමහලු තෙරුන් වහන්සේ තුන්වෙනි දවස්හි රහත් බවට පැමිණිසේක. ඊළඟ තෙරනු සිවුවෙනි දින අනාගාමී වූහ. ඉතිරි තුන් නම විශෙෂයක් උපදවන්ට නොහැකි වන්නෝ දෙව්ලොව උපන්හ. එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දෙව් මිනිස් සැප අනුභව කරන්නා වූ ඔවුනතුරෙන් එක් නමක් තක්සලා නුවර රජකුලෙහි ඉපිද පුක්කුසාති නම් රජව බුදුන් උදෙසා පැවිදිව රජගහනුවරට එන්නේ අතර මග කුඹල්හලකදී බුදුන්ගේ බණ අසා අනාගාමී ඵලයට පැමිණියේය.

එක් නමක් එක්තරා මුහුදු පටුනෙක (මූදුබඩ ප්‍රධාන තොටුපොළක) කුල ගෙයක ඉපිද නැව් නැග අතරමග බුන්නැව් ඇත්තේ දුව වස්ත්‍ර හැඳ ලාභ සම්පත්තියට පැමිණියේ "මම රහත්මි" යි සිත් උපදවා "නුඹ රහතෙක් නොවෙහි යව බුදුන්ගෙන් ප්‍රශ්න විචාරව" යි වැඩ කැමති දෙවියකු විසින් මෙහෙයන ලද්දේ එසේ කොට රහත් බවට පැමිණියේය.

අනික් තැනැත්තේ රජගහනුවර එක් කුල දූරියක කුස උපන. ඒ කුලදූරිය වනාහි පළමු කොට මවුපියන් යැද පැවිද්දට අවකාශ නොලබන්නී කුලගෙයකට ගොස් ගැබක් පිහිටි නමුදු ඒ බැව් නොදන්නී හිමියා සතුටු කොට ඔහු විසින් අනුදන්නාලද්දී මෙහෙණින් කෙරෙහි පැවිදි වූවාය. මෙහෙණිනු ඇගේ ගැබ් නිමිති දැක දෙව්දත් තෙරුන්ගෙන් පිළිවිසූහ. හෙතෙමේ ඈ නොමෙහෙණකැයි කීය. ඉන් පසු බුදුන් ගෙන් විචාළහ. උන්වහන්සේ උපාලි තෙරුන් එහි යෙදූහ.

ඉක්බිති උපාලි තෙරනු සැවැත් නුවර වැසි කුලයන් හා විසාඛා උපාසිකාව ද කැඳවා අධිකරණය විසඳන්නාහු "ගැබ පළමු පිහිටියේය-පැවිද්ද නිරෝගි" යයි කීහ. ශාස්තෘන් වහන්සේ අධිකරණය මනාකොට විසඳන ලද්දේ යයි තෙරුන්ට සාධුකාර දුන්හ. ඒ මෙහෙණ තොමෝ ද රන් රුවක් වැනි පුතකු වැදුවාය. පසේනදි කොසොල් රජ තෙමේ ඒ ළදරුවා ගෙණ

2. තෙන ඛො පන සමයෙන පායාසි රාජඤ්ඤො සෙතබ්‍යං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. තෙන ඛො පන සමයෙන පායාසිස්ස රාජඤ්ඤස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: ඉතිපි නත්ථි පරෙ ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති.

පොෂණය කෙළේය. පසුකලෙක කාශ්‍යප යයි නම් කොට සරසවා බුදුන් වෙත පමුණුවා පැවිදි කරවීය. මෙසේ හෙතෙම රජු විසින් ඇති දැඩි කරගත් පුතකු බැවින් ද කුමාර කාශ්‍යප යයි ප්‍රසිද්ධ විය.

එක් දවසක් අන්ධ වනයෙහි මහණදම් කරණ උන් වහන්සේට වැඩ කැමති දෙවියෙක් ප්‍රශ්න සමූහයක් උගන්වා බුදුන් විචාරණ ලෙස කීය. ස්ථවිර තෙමේ එසේ කොට පැන විසඳුම් කෙළවර රහත්බවට පැමිණියේය. භාග්‍යවතුන්වහන්සේ ද තෙරනු චිත්‍රකථික භික්ෂූන් කෙරෙහි අග්‍රස්ථානයෙහි තැබූසේක. ඒ මේ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එක් කලෙක මහ ජනයාට ධර්මදෙශනා කරමින් හැසිරෙණ අතර සෙතව්‍යා නුවරට පැමිණ ඊට උතුරු දිග ඇට්වේරිය වනයෙහි වැඩ වාසය කරණසේක.)

2. එසමයෙහි වනාහි පායාසිරාජඤ්ඤ තෙමේ හෙවත් පායාසි නම් අභිෂේක නොලත් රජ තෙමේ සත්වයන්ගෙන් උත්සන්න වූ හෙවත් මිනිසුන්ගෙන් හා වෙනත් ඇතිකරණ හස්ති- අශ්ව- ආදි සතුන්ගෙන් ගැවසීගත්- තණ දව දිය ආදියෙන් විසිතුරු ලෙස සමෘද්ධ වූ බොහෝ ධාන්‍ය රැස්කිරීම් ඇති- පසේනදි කොසොල් රජතුමන් විසින් ශ්‍රෙෂ්ඨ වශයෙන් හෙවත් ඡත්‍ර නංවා රජකු විසින් මෙන් අනුභව කටයුතු ලෙස පරිත්‍යාග කරණ ලද රාජභොග්‍යයක් වූ, එසේම කොසොල් රජුගේ දෑවැද්දක් වූ සෙතව්‍යා නම් නුවර අධිපතිව වෙසේ. එකල්හි වනාහි ඒ පායාසි රාජන්‍යහට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන. කෙසේ ද යත්? (ඒ ඒ කරුණු දක්වා) මේ මේ කරුණුදු පරලොවක් නැත. ඔපපාතික (මැරී උපදනා) සත්වයෝ නැත්තාහ. සුකෘත දුෂ්කෘත හෙවත් කුශලාකුශල කර්මයන්ගේ ඵල විපාක නැතැයි කියායි. (මෙසේ ඒ පායාසි රාජන්‍යහට කොසොල් රජුගෙන් ලැබුනු සෙතව්‍යා නගරයෙහි රජකු මෙන්

3. අස්සොසුං ඛො සෙතබ්‍යකා බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භො කුමාරකස්සපො සමණස්ස ගොතමස්ස සාවකො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සෙතබ්‍යං අනුප්පත්තො සෙතබ්‍යායං විහරති උත්තරෙන සෙතබ්‍යං සිංසපාවනෙ. තං ඛො පන භවන්තං කුමාරකස්සපං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො වුද්ධො චෙව අරහා ච. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති. අථ ඛො සෙතබ්‍යකා බ්‍රාහ්මණගහපතිකා සෙතබ්‍යාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා උත්තරෙනමුඛා ගච්ඡන්ති යෙන සිංසපාවනං.

මහත් සැපතින් මහත් සමෘද්ධියෙන් වාසය කරණ අතර යම් යම් කරුණු ගැණ සැලකීමෙන් පරලොවක් නැත, ඕපපාතික සත්ත්වයෝ නැත- යනාදීන් නාස්තිකවාද සඞ්ඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටියක් ඇති විය.)

3. (එකල්හි) සෙතව්‍යා නුවර වැසි බමුණු ගැහැවියෝ (මෙසේ ප්‍රවෘත්තියක්) ඇසූහ.(කෙසේ ද යත්?) පින්වත්නි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවක වූ කුමාර කාශ්‍යප ශ්‍රමණ තෙමේ පන්සියයක් පමණ භික්ෂූන් සමග කොසොල් දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙමින් සෙතව්‍යා නුවරට පැමිණ ඊට උතුරු දිග පිහිටි ඇට්වේරිය වනයෙහි වාසය කෙරෙයි. උන්වහන් සේගේ වනාහි මෙබඳු කීර්ති ඝොෂාවක් පැන නැග තිබේ.(එනම්) කුමාර කාශ්‍යප තෙමේ පණ්ඩිතය හෙවත් මෙලෝ පරලෝ අර්ථයන් දැනීමේ සමර්ථය. බුහුටි තෙපුල් ඇත්තේය. නුවණැත් තේය. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේය. විසිතුරු කථා ඇත්තේය. යහපත් වැටහීම් ඇත්තේය. සීලාදී ගුණධර්මයන් ගෙන් වැඩිහිටියෙක. රහත් කෙනෙක, (එබැවින්) එවැනි රහතුන් දැකීම යහපත් වේයි කියායි. ඉක්බිති සෙතව්‍යා නුවර වැසි බ්‍රාහ්මණගෘහපතීහු එනුවරින් නික්ම සමූහ සමූහව (=රැස්වූ රැස්වූව) උතුරුදිගට මුහුණ ලා ඇට්වේරිය වනය දෙසට ගමන් කෙරෙති.

(කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සෙතව්‍යා නුවර සිංසපා වනයෙහි වැඩ වාසය කරණ බවත්, එසේම උන් වහන්සේ මෙබඳු ව්‍යක්ත බහුශ්‍රැත ගුණසම්පන්න කෙනෙකැයි පතළ මහත් යශොඝොෂ ඇත්තෙකු බවත් එබඳු රහතුන් වහන්සේලා දැකීම මෙලෝ පරලෝ යහපත පිණිස පවතින

4. තෙන ඛො පන සමයෙන පායාසි රාජඤ්ඤො උපරිපාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දසා ඛො පායාසි රාජඤ්ඤො සෙතව්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ සෙතබ්‍යාය නික්ඛමිත්වා සඞ්ඝ සඞ්ඝී ගණීභූතෙ උත්තරෙනමුඛෙ ගච්ඡන්තෙ යෙන සිංසපාවනං, දිස්වා ඛත්තං ආමන්තෙසි. කින්නුඛො භො ඛත්තෙ සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා සෙතබ්‍යාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා උත්තරෙනමුඛා ගච්ඡන්ති යෙන සිංසපාවනන්ති? අත්ථි ඛො භො සමණො කුමාරකස්සපො-පෙ-සිංසපාවනෙ. තං ඛො පන -පෙ- අරහා වාති. තමෙතං තෙ භවන්තං කුමාරකස්සපං දස්සනාය උපසඞ්කමන්තීති

බවත් එනුවර වැසි බ්‍රාහ්මණයන්ට හා තදන්‍ය ගිහි මිනිසුන්ටත් අසන්ට ලැබී ඔව්හු එතැන් පටන් උන්වහන්සේ දක්නා පිණිස මහත් සේ සමූහ සමූහව ඇටිවේරිය වනය වෙතට යන්ට පටන් ගත්හ.)

4. එසමයෙහි වනාහි පායාසිරාජන්‍ය තෙමේ මතුමහල් තෙලෙහි දිවාසයනයට පැමිණියේ වෙයි. (එසේ සයනය කරණ හෙතෙමේ) සෙතව්‍යා නුවරින් නික්ම සමූහසමූහව උතුරුදිග ඇටිවේරියවනය දෙසට යන බමුණු ගැහැවියන් දුටුවේය. දැක ඛත්තාය හෙවත් විචාළ දෙයකට පිළිතුරු දියහැකි මහාමාත්‍යයා කැඳවීය. එසේ කැඳවා, පින්වත ! කුමක්හෙයින් මේ නුවර මිනිස්සු මෙසේ ඇටිවේරිය වනය දෙසට යෙද්දැයි පිළිවිසීය. (එවිට හෙතෙමේ) පින්වත! ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකවූ කුමාරකාශ්‍යප මහණතෙමේ කොසොල්දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙමින් මේ නුවරට පැමිණ උතුරුදිග ඇටිවේරිය වනයෙහි වාසය කෙරෙයි. එසේම හෙතෙමේ පණ්ඩිතය, ව්‍යක්තය, බහුශ්‍රැතය, චිත්‍රකථිය, වැඩිහිටියෙක, රහතෙකැයි පතළ ගුණඝොෂාවක් ඇත්තේය. එබැවින් ඒ මේ කුමාරකාශ්‍යපයන්වහන්සේ දැකීමට ඔව්හු එලඹෙත් යයි(පිළිතුරු දින.)

(පායාසිරාජඤ්ඤ තෙමේ ස්වකීය මහාප්‍රාසාදයෙහි මතුමහල්තලයෙහි දිවාසයනය කරන්නේ හෙවත් දහවල් ආහාර අනුභවයෙන් පසු සැතපෙන්නේ පූර්වොක්ත පරිදි සිංසපාවනයට යන මිනිසුන් දැක තමන්ගේ ප්‍රධාන ඇමතියා කැඳවා මෙසේ මේ මිනිසුන් ඉතා ඕනෑකමින් එහි යාමට ඇති හේතුව කුමක් දැයි විචාළේය. එකල ඒ ඇමතිතෙමේ එම කාරණය තත්වූ පරිද්දෙන් ප්‍රකාශ කෙළේය. ඒ ඇසූ පායාසි රාජඤ්ඤ තෙමේ ස්වකීය මහාමාත්‍යයාට මෙසේ කීය.)

5. තෙන හි භො ඛත්තෙ යෙන සෙතබ්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා සෙතබ්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි: පායාසි භො රාජඤ්ඤො එවමාහ: ආගමෙන්තු කිර භවන්තො පායාසිපි රාජඤ්ඤො සමණං කුමාරකස්සපං දස්සනාය උපසඞ්කමිස්සති පුරා සමණො කුමාරකස්සපො සෙතබ්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ බාලෙ අබ්‍යත්තෙ සඤ්ඤාපෙති: ඉතිපි අත්ථි පරෙ ලොකො, අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. නත්ථි හි භො ඛත්තෙ පරෙ ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. එවං භොති ඛො සො ඛත්තා පායාසිස්ස රාජඤ්ඤස්ස පටිස්සුත්වා යෙන සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සෙතබ්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච: පායාසි භො රාජඤ්ඤො එවමාහ: ආගමෙන්තු කිර භවන්තො පායාසිපි රාජඤ්ඤො සමණං කුමාරකස්සපං දස්සනාය උපසඞ්කමිස්සතීති.

---

5. එසේ වීනම් පින්වත් ඛත්තය! සෙතව්‍යානුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ යම් තැනෙක්හිද එහි එළඹෙව. එළඹ ඔවුන්ට මෙසේ කියව. කෙසේ ද යත්? පින්වත්නි! පායාසිරාජන්‍ය තෙමේ මෙසේ කියයි. පායාසිරාජන්‍ය තෙමේද කුමාරකාශ්‍යප ශ්‍රමණයන් දැකීම පිණිස එළඹෙන්නේය. පින්වත්හු ඒතාක් බලාපොරොත්තු වෙත්වායි කියායි. කුමාරකාශ්‍යප මහණතෙමේ අඥනවූ අව්‍යක්තවූ සෙතව්‍යා නුවරවැසි බමුණුගැහැවියන්ට මේ කාරණයෙනුදු පරලොවක් ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහ. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇතැයි කියා වහා (දූත් දූත්) හඟවයි. පින්වත් ඛත්තය! පරලොවක් නැත. ඔපපාතික සත්වයෝ නැත්තාහ. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක නැතැයි කීය. එවිට ඒ ඛත්තතෙමේ හෙවත් ඒ මහාමාත්‍යතෙමේ පින්වත! එසේ යයි පායාසිරාජන්‍යහට පිළිවදන් අස්වා සෙතව්‍යක බ්‍රාහ්මණගෘහපතීන් වෙත එළඹියේය. එළඹ පින්වත්නි! පායාසිරාජඤ්ඤ තෙමේද කුමාරකාශ්‍යප මහණුන් දැකීමට පැමිණෙන්නේය. පින්වත්හු ඒතාක් බලාපොරොත්තු වෙත්වා යි මෙසේ කීය.

(පායාසිරාජන්‍ය තෙමේ සිය මහඇමතියාට මෙසේ කීය: පින්වත් ඛත්තය! මෙලොව සිටියහුට පරලොවක් නැත. චුතව උපදනා (=ඔපපාතික) සත්වයෝ නැත්තාහ. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක නැත. එහෙත් මේ කුමාරකාශ්‍යප මහණ

6. අථ ඛො පායාසි රාජඤ්ඤො සෙතබ්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි පරිවුතො යෙන සිංසපාවනං යෙන ආයස්මා කුමාරකස්සපො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා කුමාරකස්සපෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. සෙතබ්‍යකාපි ඛො බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ ආයස්මන්තං කුමාරකස්සපං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ ආයස්මතා කුමාරකස්සපෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ යෙනායස්මා කුමාරකස්සපො තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නො ඛො පායාසි රාජඤ්ඤො ආයස්මන්තං කුමාරකස්සපං එතදවොච:

තෙමේ අනුවණ බමුණුගැහැවියන්ට මේ කාරණයෙනුදු පර ලොවක් ඇත යනාදීන් වහා අවබෝධ කරන්නේය. එබැවින් ඊට පළමු නුඹ ඔවුන් වෙත ගොස් මාද උන්වහන්සේ දකීමට යන බවත් ඒතාක් නවතින ලෙසත් ඔවුන්ට කියව යනුයි. එවිට ඒ ඇමතිතෙමේ ද එපරිද්දෙන් ගොස් ඔවුන්ට කීය. ඔහුද නැවතුනහ.)

6. ඉක්බිති පායාසිරාජන්‍ය තෙමේ සෙතව්‍යානගරවාසී බ්‍රාහ්මණ ගෘහපතියන් විසින් පිරිවරණලදුව ඇට්ටේරිය වනය යම් තැනෙකද ආයුෂ්මත් කුමාරකාශ්‍යපයන් වහන්සේ යම් තැනෙකද එහි එළඹියේය. එළඹ උන්වහන්සේ සමග (සැපදුක් ආදිය පිළිවිසීමෙන්) සතුටු විය. එසේ කලක් මුළුල්ලෙහි සිහිකිරීමට සුදුසුවූ ද ඇසීමට ප්‍රියවූ ද පිළිසඳර කථාව අවසාන කොට එකත් පසෙක හිඳගත්තේය. එසේම සෙතව්‍යා නුවර වැසි බමුණුගැහැවියෝද සමහරු ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මනා කොට වැඳ එකත් පසෙක හිඳගත්හ. සමහරු උන්වහන්සේ සමග සතුටු වූහ. සතුටුවියයුතුවූ ද සිහිකටයුතුවූ ද කථාව නිමවා එකත් පසෙක හිඳගත්හ. නවත් සමහරු කුමාරකාශ්‍යපයන් වහන්සේ වැඩහිඳිනා දිසාවට ඇඳිලි බැඳ එකත් පසෙක හිඳගත්හ. ඇතැම්හු "අපි මෙනම් ඇත්තෝ වෙමු අපි අසවල් ගොත්‍ර ඇත්තෝ වෙමු" යි මෙසේ ස්වකීය නම්ගොත් කියා එකත් පසෙක හිඳගත්හ. කිසිකෙනෙක් තුෂ්ණීම්භූතව එකත් පසෙක හිඳගත්හ. ඉන් පසු එකත් පසෙක හුන්නාවූ ඒ පායාසිරාජන්‍ය තෙමේ ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙරුන්ට මේ කාරණය සැළ කෙළේය.

7. අහං හි භො කස්සප එවංවාදී එවංදිට්ඨි: ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. නාහං රජඤ්ඤ එවංවාදිං එවංදිට්ඨිං අද්දසං වා අස්සොසිං වා. කථං හි නාම එවං වදෙය්‍ය: ඉතිපි නත්ථි පරෙ ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකට

(නුවණැත්තෝ ගරුකටයුත්තකු වෙත පැමිණි විට, ඉතා දුරය, ඉතා ළඟය, උඩුසුළඟය, උස්පෙදෙසය, ඉතා ඉදිරිය, ඉතා පස්සය යන සවැදෑරුම් නිසදා දොෂයන් දුරු කොට සුදුසු තැනෙක හිඳගණිති. එකත්පසෙක හිඳීම වනුයේ එවිටය. මේ පායාසිරාජන්‍ය ද එවැන්නෙකු හෙයින් එසේ එකත්පසෙක හිඳගත්තේය. ඔහු සමග ගිය පිරිසෙහි නානාදෘෂ්ටිකයෝ වෙති. එබැවින් සමහරු කුමාරකාශ්‍යපයන් වහන්සේ නො වැඳ තන්අයුරින් හිඳගත්හ. එහි ඇඳිලිබැන්දෝ බෞද්ධ අබෞද්ධ දෙපක්‍ෂයම සතුටු කරන්නෝ වෙති. ඔවුන්ගේ අදහස මෙසේ විය. ඉදින් මිථ්‍යාදෘෂ්ටිකයෝ, "තෙපි මහණ ගොයුම් හුගේ ශ්‍රාවකයන් වඳිව් දෑ" යි ඇසූහු නම් "කිම? ඇඳිලිබැඳි පමණකින් වැන්දෙ වමු" දැයි කියම්හ. සම්‍යග්දෘෂ්ටිකයෝ කුමක්හෙයින් අපේ ශ්‍රමණයන් නොවඳිව් දැයි ඇසූ නම්- කිම? හිස බිම පහරවාම වැඳියයුතුද? අත් ඔසවා වැඳීම වැඳුම් නො වේ දැයි කියම්හ යනුයි. නම්ගොත් කියන්නෝ දුප්පත්වූ ප්‍රසිද්ධ කුලවල උපන්නෝ වෙති. මහපිරිසෙහි නාමගොත්‍ර වශයෙන් වත් ප්‍රකට වෙමු යයි සිතා එසේ කළහ. නිශ්ශබ්දවූවෝ කෛරාටිකයන් හා අඥබාලයෝයි. එයින් කෛරාටිකයෝ- එක් වචනයක් දෙකක් වත් කථාකිරීමෙන් විශ්වාස වෙයි. එවිට දවසක් දෙකක් සඞ්ග්‍රහ කළයුතු ද වේ යයි තුෂ්ණිම්භූතව හුන්හ. අඥ බාලයෝ නුවණනැති බැවින් කියයුත්තක් නොදන්නෝ නිශ් ශබ්දව හිඳගත්හ. එසේ සියල්ලන්ම එකත්පස්ව හුන්කල්හි පායාසිරාජන්‍ය තෙමේ කුමාරකාශ්‍යප තෙරණුවන්ට මෙසේ කිය:

7. පින්වත් කාශ්‍යපය! මම වනාහි මෙබඳු වාද ඇත්තෙක්මි. මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වෙමි. කෙබඳු ද යත්? මේ කාරණයෙනුදු මෙලොව සිටියහුට පරලොවක් නැත. චුතව උපදනා සත්ත්වයෝ නැත්තාහ. කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක නැත යනුයි. එවිට කුමාරකාශ්‍යප ස්ථවිර තෙමේ, රාජන්‍යය, මෙබඳු වාදඇත්තකු මෙබඳු දෘෂ්ටිඇත්තකු මම මීට පළමු කිසිකලෙක නුදුටුවෙමි. කිසිකලෙක නෑසුවෙමි. මේ කරණයෙනුදු පරලොවක් නැත්තේය. ඔපපාතික සත්ත්වයෝ

දුක්කටානං කම්මානං ඵලං විපාකොති. තෙන හි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි රාජඤ්ඤ ඉමෙ චන්දිමසූරියා ඉමස්මිං වා ලොකෙ පරස්මිං වා, දෙවා වා තෙ මනුස්සා වාති? ඉමෙ භො කස්සප චන්දිමසූරියා පරස්මිං ලොකෙ න ඉමස්මිං, දෙවා තෙ න මනුස්සාති. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි අත්ථි පරො ලොකො, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවං මෙ එත්ථ හොති ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

නැත්තාහ. කුශලාකුශලකර්‍මයන්ගේ විපාක නැතැයි කෙසේ නම් මෙසේ කියන්නේද? එසේ විනම් රාජන්‍යය! මෙහි ලා නාම විචාරන්නෙමි, යම් පරිද්දකින් නුඹට වැටහෙන්නේ නම් එපරිද්දෙන් එය ප්‍රකාශ කරව. රාජන්‍යය! ඒ කුමකැයි සිතන්නෙහිද? මේ සඳ හිරු දෙදෙන මෙලොව හෝ වෙද්ද? පරලොව හෝ වෙද්ද? ඔව්හු දෙවියෝ හෝ වෙද්ද? මනුෂ්‍යයෝ හෝ වෙත් දැයි කීය. එවිට රාජන්‍යතෙමේ පින්වත් කාශ්‍යපය! මේ සඳ හිරු දෙදෙන පරලොව වෙති. මෙලොව නොවෙති. ඔව්හු දෙවියෝ වෙති. මිනිස්සු නොවෙතියි කීය. එකල්හි ස්ථවිර තෙම මෙසේ වදාළේය. රාජන්‍යය! මේ කාරණයෙන් ද නුඹට මෙබඳු සිතෙක් ඇති වේවා. මේ කාරණයෙනුදු පරලොවෙක් ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහ. කර්‍මයන්ගේ ඵලවිපාක ඇතැයි කියාසි. එවිට රාජන්‍යතෙම කියනුයේ- පින්වත්වූ කාශ්‍යපතෙමේ යම්කිසි කාරණයක් සලකා මෙසේ කියයි. නමුත් මේ කාරණයෙහි ලා මාගේ අදහස මෙබඳු වෙයි. මේ කාරණයෙන් ද පරලොව නැත. චුතව උපදනා සත්වයෝ නැත්තාහ. කුශලාකුශලකර්‍මයන්ගේ විපාක නැත යනුයි.

(කුමාරකාශ්‍යප තෙරණුවන් මේ සඳ හිරු දෙදෙන මෙලොවද පරලොවද දෙවියෝද මිනිස්සු දැයි පිළිවිසූකල පායාසිරාජන්‍ය තෙමේ මෙසේ සිතීය. මේ මහණතෙමේ පළමුකොට චන්ද්‍රසූර්‍ය්‍යෝ පමාව ගෙණහැර දක්විත. නුවණින් අනිකෙකු විසින් නොමැඩ ලියහැක්කෝ සඳ හිරු වැනි වන්නේය. ඉදින් මම වනාහි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ මේ ලොකයෙහි වෙත් යයි කියන්නෙම් නම් මොව්හු කුමක් ඇසුරු කළාහුද? කෙතෙක් ප්‍රමාණ වෙද්ද? කොපමණ උසද යනාදීන් නැවත නැවත විචාරන්නේය. මම වනාහි ඒව

8. අත්ථි පන රාජඤ්ඤ පරියායො යෙන තෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි පරෝ ලොකො -පෙ- විපාකොති? අත්ථි භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි -පෙ- විපාකොති. යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණවාචා ඵරුසවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ බ්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී, තෙ අපරෙන සමයෙන

නිසි පරිදි පිළිතුරු දෙන්ට නොහැකි වන්නෙමි. එබැවින් ඔව්හු පරලොව වෙතියි කියාම කියන්නෙමියි සිතා එසේ කීය. එසේම භාග්‍යවතුන් වහන්සේ මීට ටිකකලකට පෙර සුධාභොජනිය ජාතකය වදාළසේක. එහි චන්‍ද්‍රයා කෙරෙහි චන්‍ද්‍රදිව්‍යපුත්‍රයා යයිද සූර්‍ය්‍යයා කෙරෙහි සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා යයිද වදාරණලද්දේය. බුදුනු විසින් වදාළ ජාතකය හෝ සූත්‍රාන්තය හෝ මුළුදඹදිව පතළේද වෙයි. එහෙයින් ඒ රාජන්‍යතෙමේ මේ චන්‍ද්‍රසූර්‍ය්‍ය මණ්ඩලයන්හි වැසි දෙවියෝ නැත්තාහයි නොකියහැක්කේ යයි සිතා ඔව්හු දෙවියෝ වෙති, මිනිස්සු නොවෙතියි කීය. පායාසිරාජඤ්ඤයා සඳහිරු පරලොව වෙති යනාදිය කීකල එයින් පරලෝ ආදිය ඇතිබව පිළිගතයුතු යයි තෙරනු වදාළ නමුත් හෙතෙමේ එය නොපිළිගෙණ තමාගේ දෘෂ්ටිය එසේම බව කීය. එවිට කුමරකසුප් තෙරණුවෝ මෙසේ වදාළහ.)

8. රාජන්‍යය, යම් කාරණයකින් නුඹට "මේ කාරණයෙනුදු පරලොවෙක් නැත. චුතව උපදනා සත්ත්වයෝ නැත, කර්මයන්ගේ විපාක නැතැ"යි මෙබඳු සිතෙක් වේද? ඊට කාරණයක් ඇත්තේද යනු (කුමාරකස්‍යප තෙරණුවෝ විචාළහ. එවිට රාජන්‍ය තෙමේ) භවත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද පරලොවෙක් නැතැයි යම් කාරණයකින් මට මෙබඳු සිතෙක් වේද? ඊට කාරණයෙක් ඇත්තේ යයි කීය. (තෙරනු,) රාජන්‍යය, ඒ කෙබඳු කාරණයක් දැයි පිළිවිසූහ. එවිට හෙතෙම මෙසේ කීය: පින්වත් කාශ්‍යපය, ප්‍රාණඝාත කරණ සුලු වූ හෙවත් සතුන් මරණ සුලු වූ ද, නුදුන් දේ ගන්නා සුලු වූ ද, කාමයන්හි වරදවා හැසිරෙණ සුලු වූ ද, බොරු කියන්නා වූ ද, කේලාම් කියන්නා වූ ද, ඵරුස වචන කියන සුලු වූ ද ප්‍රලාප හෙවත් නිෂ්ඵල තෙපුල් බණනා සුලු වූ ද, විෂම ලොභය හෙවත් අනුන් සම්පතෙහි දැඩි ලොභය ඇත්තා වූ ද, ක්‍රොධ සිත් ඇත්තා වූ ද, මිථ්‍යාදෘෂ්ටි ගත්තා වූ ද, මාගේ මිත්‍රාමාත්‍යයෝ ද සහලේ නෑයෝ ද, මේ ලොකයෙහි ඇත්තාහ. පසු කලෙක්හි ඔව්හු විසභාග වෙදනා

ආබාධිකා හොන්ති දුක්ඛිතා බාළ්හගිලානා, යදාහං ජානාමි න දානිමෙ ඉමම්හා ආබාධා වුට්ඨහිස්සන්තීති, ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සන්ති ඛො භො එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො- යෙ තෙ පාණාතිපාතී -පෙ- මිච්ඡාදිට්ඨී, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සන්තීති.

9. භවන්තො ඛො පන පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණවාචා ඵරුසවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ බ්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී. සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං, භවන්තො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සන්ති. සචෙ ඛො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං

සඞ්ඛ්‍යාත රොගයෙන් යුක්ත වූවෝ දුකට පැමිණියාහු අතිශයින් ගිලන් වූවාහු වෙති. යම් කලෙක වනාහි මම දැන් මොව්හු මේ රෝගයෙන් නැවත නොනැගිටින්නාහු යයි දැන ගණිම් ද එකල්හි මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි. පින්වත්නි! යම් ඒ සත්ත්ව කෙනෙක් ප්‍රාණඝාත කරන්නාහු, නුදුන් දේ ගන්නාහු, කාමයන්හි වරදවා හැසිරෙන්නාහු, බොරු, කේලාම් පරුෂ වචන සම්ප්‍රලාප කියන්නාහු, විෂම ලොභ ඇත්තාහු, ක්‍රොධ සිත් ඇත්තාහු මිසදිටු ගත්තාහු වෙත්ද, ඔව්හු ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම් වූ ද, නපුරු ගති ඇති හෙයින් දුගති නම් වූ ද, (උඩුකුරු පා ඇතිව යටිකුරු හිස ඇති ව පතිත වන හෙයින්) විනිපාත නම් වූ ද, නරකයෙහි උපදින්නාහු යයි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය.

9. පින්වත්හු වනාහි ප්‍රාණඝාත කරන්නාහුය. නුදුන් දේ ගන්නෝය. කාමයන්හි වරදවා හැසිරෙණ සුලුය. බොරු, කේලාම්, පරුෂ වචන, හිස් බස් බණන්නෝ වෙති, විෂම ලොභ ඇත්තෝය, ක්‍රොධ සිත් ඇත්තෝය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝය. ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍ය වේ නම්; පින්වත්හු කාය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ විවශව පතිත වන්නා වූ නරකයෙහි උපදින්නාහුය. ඉදින් පින්වත්නි, තෙපි මරණින් මතු අපායෙහි උපන්නාහු නම් මා වෙත පැමිණ මේ කාරණයෙන් ද පරලොවක් ඇත්තේය, චුතව උපදනා සත්ත්වයෝ ඇත්තාහ, කුශලාකුශල කර්මයන්ගේ විපාක ඇතැයි මට සැල කරව්. පින්වත්නු වනාහි මා විසින් ඇදහිය යුතු

උපපජ්ජෙය්‍යාථ, යෙන මෙ ආගන්ත්වා ආරොචෙය්‍යාථ ඉතිපි අත්ථි පරො ලොකො, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. භවන්තො ඛො පන මෙ සද්ධායිකා පච්චයිකා, යං භවන්තෙහි දිට්ඨං, යථා සාමං දිට්ඨං එවමෙතං භවිස්සතීති. තෙ මෙ සාධූති පටිස්සුත්වා නෙව ආගන්ත්වා ආරොචෙන්ති. න පන දූතං පහිණන්ති. අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති

10 තෙන හි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි රාජඤ්ඤ? ඉධ තෙ පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙය්‍යුං: අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි, තං දණ්ඩං පණෙහිති; තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුර

වචන ඇත්තෝය. විශ්වාස කටයුතු වචන ඇත්තෝය. පින්වතුන් විසින් යමක් දක්නා ලදද? එය යම්සේ තමා විසින් දක්නා ලද්දේ ද, එපරිද්දෙන්ම වන්නේය (පින්වතුන් විසින් දක්නා ලද්ද මා විසින් දක්නාලද්දක් සේම පිළිගණිමි) යි කියාසි. ඔව්හු මාගේ වචනය යහපතැයි පිළිගෙණ නැවත විත් නොම සැළ කෙරෙති. දූතයකුදු නොම එවති. පින්වත් කාශ්‍යපය, පරලොවෙක් නැත, චුතව උපදනා සත්ත්වයෝ නැත්නාහ, කර්මයන්ගේ විපාක නැතැයි යම් කාරණයකින් මට මෙබඳු සිතෙක් වේ ද, මෙය ද ඊට එක් කාරණයෙක් වෙයි කීය. (එවිට තෙරණුවෝ මෙසේ විදාළහ.)

10. එසේ වී නම් රාජන්‍යය, මෙ කාරුණෙහිලා තාම විචාරන්නෙමි. යම් පරිද්දකින් තුඹට වැටහෙන්නේ නම් එපරිද්දෙන් එය ප්‍රකාශ කරව, රාජන්‍යය, ඒ කුමකැයි තුඹ හඟනෙහිද? මේ ලොකයෙහි තාගේ මෙහෙකරු මිනිස්සු අපරාධ කරණ සුලු වූ සොරෙකු ගෙණවුත්- ස්වාමිනි! මෙ තෙමේ තමුන්නාන්සේගේ ආඥවට විරුද්ධව අපරාධ කරණ සුලු වූ සොරෙක. මොහුට යම් දඬුවමක් කරන්ට කැමැත්තහු නම් ඒ දඬුවම් පණවන සේක්වා යි කියා දක්වන්නාහු නම් තුඹ ඔවුන්ට මෙසේ කියන්නෙහිය. එසේ නම් පින්වතුනි, මේ පුරුෂයා දැඩි රැහැනින් පිටිතල හයා දැඩි බැම්මෙන් බැඳ

මුණ්ඩං කාරෙත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස ආඝාතනෙ සීසං ඡින්දථාති. තෙ සාධූති පටිස්සුත්වා තං පුරිසං -පෙ- ආඝාතනෙ නිසීදාපෙය්‍යුං.

11. ලභෙය්‍ය නු ඛො සො චොරො චොරඝාතෙසු: ආගමෙන්තු තාව භවන්තො චොරඝාතා අමුකස්මිං මෙ ගාමෙ වා නිගමෙ වා මිත්තාමච්චා ඤාතිසාලොහිතා, යාවාහං තෙසං උද්දිසිත්වා ආගච්ඡාමීති? උදාහු විප්පලපන්තස්සෙව චොරඝාතා සීසං ඡින්දෙය්‍යුන්ති? න හි සො භො කස්සප චොරො ලභෙය්‍ය චොරඝාතෙසු: ආගමෙන්තු -පෙ- ආගච්ඡාමීති. අථ ඛො තං

ඛුරයෙන් (දැලිපිහියෙන්) හිස මුඩු කොට තපුරු නාද ඇති වද බෙරය ගසමින් වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙණ ගොස් දකුණු දෙරින් නික්මවා නුවරට දකුණු දිගින් පිහිටි වධස්ථානයෙහි දී හිස සිඳිව් යනුයි. එකල්හි ඔව්හු යහපතැයි පිළිවදන් අස්වා ඒ පුරුෂයා දැඩි වූ රැහැනින් පිටිතල හයා දැඩි බැම්මෙන් බැඳ ඛුරයෙන් හිස මුඩු කොට කෲර වූ නාද ඇති වද බෙරය ගසමින් වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙණ ගොස් දකුණු දෙරින් නික්මවා නුවරට දකුණු දිගින් පිහිටි වධස්ථානයෙහි හිඳුවන්නාහු නම්;

11. ඒ සොරතෙම- භවත් චොරඝාතකයෙනි, අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි හෝ මාගේ මිත්‍රාමාත්‍යයෝ ද සහලේ නෑයෝ ද ඇත්තාහ. මම ඔවුන් වෙත ගොස් මා පිළිබඳ මේ පුවත ද දන්වා රැකියයුතු දේ ද ඔවුන්ට භාර කොට යම්තාක් එම් ද, ඒ තාක් බලාපොරොත්තු වෙත්වා හෙවත් ඉවසත්වායි චොරඝාතකයන් කෙරෙහි අවකාශයක් ලබන්නේ ද? එසේ නැත හෙ ත්; චොරඝාතකයෝ විලාප කියද්දී ම ඔහුගේ හිස සිඳින්නාහු දැයි. එවිට පායාසිරාජන්‍ය තෙමේ- පින්වත් කාශ්‍යපය, ඒ සොර තෙමේ චොරඝාතකයන් කෙරෙහි එබඳු අවකාශයක් නොලබන්නේය. නැවත කුමක් කෙරෙද්ද යත්? ඔහු විලාප කියද්දීම චොරඝාතකයෝ ඔහුගේ හිස සිඳින්නාහ යි කීය. එකල තෙරණුවෝ: රාජන්‍යය, මිනිසෙක් වූ ඒ සොරතෙමේ චනාහි පින්වත් චොරඝාතකයෙනි, අසවල් ගමෙහි සිටිනා මාගේ යහලු

විප්පලපන්තස්සෙව චොරඝාතා සීසං ඡින්දෙය්‍යුන්ති. සො හි නාම රාජඤ්ඤ චොරෙ මනුස්සො මනුස්සභූතෙසු චොරඝාතෙසු න ලභිස්සති ආගමෙන්තු -පෙ- ආගච්ඡාමීති.

12. කිං පන තෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතී -පෙ- මිච්ඡාදිට්ඨී. තෙ කායස්ස -පෙ- උප්පන්නා ලභිස්සන්ති නිරයපාලෙසු ආගමෙන්තු තාව භවන්තො නිරයපාලා! යාව මයං පායාසිස්ස රාජඤ්ඤස්ස ගන්ත්වා ආරොචෙම: ඉතිපි අත්ථි පරො ලොකො, -පෙ- විපාකොති? ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි අත්ථි පරො ලොකො. -පෙ- විපාකොති කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවං මෙ එත්ථ හොති ඉතිපි නත්ථි පරො ලොකො -පෙ- විපාකොති

වන්ට හා නෑදෑයන්ට කියා එනතුරු ඉවසන්වා යි මෙපමණ අවකාශයක් මිනිස් වූ ඒ චොරඝාතකයන් කෙරෙහි නොලබන්නේය. (එය එසේ නම්)

12. කිමෙක්ද වනාහි ප්‍රාණඝාත කරන්නා වූ ද, සොරකම් කරන්නා වූ ද, කාමයන්හි වරදවා හැසිරෙන්නා වූ ද බොරු, කේලාම්, පරුෂ වචන, හිස් තෙපුල් බණන්නා වූ ද, අභිධ්‍යා ව්‍යාපාද ඇත්තා වූ ද, මිසදිටු ගත්තා වූ ද, තාගේ ඒ මිත්‍රාමාත්‍ය යෝත් සහ ලේ නෑයෝත් කාය බිඳීමෙන් මරණින් මතු නිරයෙහි උපන්නාහු, පින්වත් නිරයපාලයෙනි, මේ කාරණයෙන් ද පරලොවක් ඇත්තේය. චුතව උපදනා සත්‍වයෝ ඇත්තාහ. කුශලාකුශල කර්‍මයන්ගේ විපාක ඇතැයි මෙසේ මම යම්තාක් පායාසිරාජන්‍යහට සැළ කෙරෙම් ද? ඒතාක් ඉවසන්වා යි මෙබඳු අවකාශයක් ඒ නිරයපාලයන් කෙරෙහි ලබන්නාහු ද යනු විතාළහ. (පායාසි තෙමේ නො ලබන්නාහු මැයි) කීය. රාජන්‍යය, මේ කාරණයෙන් ද නුඹට “පරලොවක් ඇත. ඔප පාතික සත්‍වයෝ ඇත්තාහ. කර්‍මයන්ගේ විපාක ඇතැයි මෙසේ සිතක් වියයුතුයයි වදාළසේක. එවිට රාජන්‍ය තෙමේ, භවත් කාශ්‍යපයන් වහන්සේ කරුණක් සලකා මෙසේ වදාරති. එහෙත් මේ කාරණයෙන් ද මට පරලොවක්- චුතව උපදනා සත්‍වයෝ- කර්‍මයන්ගේ විපාක නැත්තාහයි කියාම අදහස් වේයයි කීහ.

(කාලක්‍රියා කරන්ට පළමු තමාගේ ඉල්ලීම පිළිගත් නෑදෑ මිත්‍රයන් කාලක්‍රියා කිරීමෙන් පසු නැවත විත් නොදන්වන හෙයින් පරලෙව් ආදිය නැත්තේ යයි විශ්වාස කාරණ බව පායාසි රාජන්‍යයා කී කල්හි, කුමාරකාශ්‍යප තෙරුන් වධකො

13. අත්ථි පන රාජඤ්ඤ පරියායො යෙන තෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි -පෙ- විපාකොති? අත්ථි භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි -පෙ- විපාකොති යථා කථං විය රාජඤ්ඤති? ඉධ මෙ භො කස්සප මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා

පමාවක් ගෙණහැර පාමින්, යම් සේ මරණු පිණිස වධස්ථාන යට පමුණුවනු ලැබූ අපරාධකාරයාට නැවත තමන්ගේ හිත මිත්‍රාදීන් වෙත ගොස් එන්ට අවකාශයක් නො වේ ද? එපරිද්දෙන් ම අකුසල් කිරීමෙන් නිරයෙහි උපන් නිරිසතුන්ට ද නැවත මිනිස් ලොවට විත් තොප හමු වී යනු පිණිස එන්ට නිරය පාලයන්ගෙන් කොහෙත්ම අවකාශයෙක් නැත. එහෙ සින් පරලෙව් ආදිය ඇත්තේම යයි වදාළ නමුත් හෙතෙමේ එය නො පිළිගත්තේය. එබැවින් තෙරනු නැවත මෙසේ වදාරති.)

13. රාජන්‍යය, යම් කරුණකින් තුඹට "මේ කාරණයෙනුදු පරලොවක් නැත, චුතව උපදනා සත්ත්වයෝ නැත්තාහ, කුශලා කුශලකර්මයන්ගේ විපාක නැතැයි මෙසේ සිතෙක් වේ ද, ඊට අනික් කාරණයෙකුත් ඇත්තේදැ? යි (විචාළහ.) එවිට රාජන්‍ය තෙමේ, පින්වත් කාශ්‍යපය, යම් කරුණකින් මට පරලොවක්- චුතව උපදනා සත්ත්වයෝ-කර්මයන්ගේ විපාක නැත්තාහයි අදහස් වේ ද, ඊට අනික් කාරණයෙක් ද ඇත්තේ යයි කීය. තෙරනු රාජන්‍යය, ඒ කෙබඳු කරුණක්දැයි පිළිවිසූහ. රාජන්‍යතෙමේ භවත් කාශ්‍යපය, ප්‍රාණඝාත කිරීමෙන් වැළකුනා වූ, නුදුන් දේ ගැණීමෙන් තොර වූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන් වූ, බොරු කීමෙන් තොර වූ, කේලාම් නොකියන්නා වූ, පරුෂ වචන නොකියන්නා වූ, නිෂ්ඵල තෙපුල් නො බණන්නා වූ, විෂම ලොභ නැත්තා වූ, ක්‍රොධ සිත් නැත්තා වූ, සම්‍යග් දෘෂ්ටි ඇත්තා වූ ම ගේ මිත්‍රාමාත්‍යයෝ ද සහ ලේ නෑයෝ ද මේ ලොකයෙහි ඇත්තාහ. පසු කලෙක්හි ඔව්හු දරුණු ආබාධ ඇත්තානු දුකට පැමිණියාහු දැඩිලෙස ගිලන් වූවාහු වෙති. යම් කලෙක්හි මම දැන් ඉතින් මොව්හු මේ ආබාධයෙන් නැවත නොනැගිටින්නාහු යයි දැන ගණිම් ද? එකල්හි මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි. කෙසේ ද යත්? පින්වත්නි, යම් ඒ සත්ත්ව කෙනෙක් ප්‍රාණඝාත නොකරන්නාහු ද, නුදුන් දේ නොගන්නාහු ද, කාමයන්හි වරදවා නො හැසිරෙන්නාහු ද, බොරු නො කියන්නෝ ද

පිසුණාය වාචාය පටිවිරතා ඵරුසාය වාචාය පටිවිරතා සම්ඵප්ප ලාපා පටිවිරතා අනභිජ්ඣාලූ අබ්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨිකා අපරෙන සමයෙන ආබාධිකා -පෙ- එවං දිට්ඨිනො- යෙ තෙ පාණාතිපාතා පටිවිරතා -පෙ- සම්මාදිට්ඨී, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

14. භවන්තො ඛො පාණාතිපාතා පටිවිරතා -පෙ- සම්මාදිට්ඨී සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං භවන්තො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සන්ති සචෙ ඛො කායස්ස භෙදා -පෙ- ලොකං උපපජ්ජෙය්‍යාථ, යෙන මෙ ආගන්ත්වා ආරොචෙය්‍යාථ. ඉතිපි අත්ථි පරො -පෙ- විපාකොති. භවන්තො ඛො -පෙ- මෙ තං භවිස්සතීති තෙ මෙ සාධූති පටිස්සුත්වා නෙව -පෙ- විපාකොති

කේලාම්- පරොස් බස්- හිස් තෙපුල්- නොබණන්නාහු ද, විෂම ලොභ නැත්තාහු ද, ක්‍රොධ සිත් නැත්තාහු ද, සම්‍යග්දෘෂ්ටි ගත්තාහු ද, ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති හෙයින් සුගති නම් වූ, ස්වර්ගලොකයෙහි උපදිත් යයි මෙසේ කියන සුලු වූ මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුමය.

14. පින්වත්නු වනාහි සතුන් මැරීමෙන් තොරවූවෝය; සොරකම් කිරීමෙන් වෙන් වූවෝය, කාමයන්හි වරදවා නො හැසිරෙන්නෝය. බොරු කීමෙන් තොර වූවෝය, පරොස් බස් නො බණන්නෝය. කේලාම් නොකියන්නෝය, නිෂ්ඵල වචන නොකියන්නෝය, අධික ලොභයෙන් වෙන් වූවෝය, ක්‍රොධ සිත් නැත්තෝය, සම්‍යග් දෘෂ්ටි ගත්තෝය. ඉදින් ඔබුන්ගේ වචනය සැබෑ නම්: පින්වත්හු මරණින් මතු යහපත් ගති ඇති. දෙව් ලොව උපදින්නාහුය. ඉදින් පින්වත්නි, තෙපි මරණින් මතු එසේ දෙව්ලොව උපන්නාහු නම්: මා වෙත විත් ‘මේ කාරණයෙන් ද පරලොවෙක් ඇත්තේය, චුතව උපදනා සත්ත්වයෝ ඇත්තාහ, කර්මයන්ගේ විපාක ඇතැ යි” මට සැළ කරව්. පින්වත්හු වනාහි මා විසින් ඇදහිය යුතු වචන ඇත්තෝය” -පෙ- කියායි. ඔව්හු මාගේ වචනය යහපතැයි පිළිගෙණ නැවත විත් නොම සැළ කෙරෙති. දූතයකුදු නො එවති පින්වත් කාශ්‍යපය! යම් කරුණකින් මට පරලෙව් ආදිය නැතැයි අදහස් වේද, මේ ඊට අනික් කරුණකැයි කීය.

16. තෙන හි රාජඤ්ඤ උපමං තෙ කරිස්සාමි උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි රාජඤ්ඤ පුරිසො ගූථකූපෙ සසීසකො නිමුග්ගො අස්ස, අථ ත්වං පුරිසෙ ආණාපෙය්‍යාසි: තෙන හි භො තං පුරිසං තම්හා ගූථකූපා උද්ධරථාති. තෙ සාධූති පටිස්සුත්වා තං පුරිසං තම්හා ගූථකූපා උද්ධරෙය්‍යුං තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තස්ස පුරිසස්ස කායා වෙළුපෙසිකාහි ගූථං සුනිම්මජ්ජිතං නිම්මජ්ජථාති. තෙ සාධූති පටිස්සුත්වා තස්ස පුරිසස්ස කායා වෙළුපෙසිකාහි ගූථං සුනිම්මජ්ජිතං නිම්මජ්ජෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තස්ස පුරිසස්ස කායං පණ්ඩුමත්තිකාය තික්ඛත්තුං සුබ්බට්ටිතං උබ්බට්ටෙථාති. තෙ තස්ස පුරිසස්ස කායං පණ්ඩුමත්තිකාය තික්ඛත්තුං සුබ්බට්ටිතං උබ්බට්ටෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තං පුරිසං තෙලෙන අබ්භඤ්ජිත්වා සුඛුමෙන චුණ්ණෙන තික්ඛත්තුං සුප්පධොතං කරොථාති. තෙ තං පුරිසං තෙලෙන අබ්භඤ්ජිත්වා සුඛුමෙන චුණ්ණෙන තික්ඛත්තුං සුප්පධොතං කරෙය්‍යුං.

---

15. එසේ වීනම් රාජන්‍යය, තට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි පණ්ඩිත පුරුෂයෝ උපමාවෙන්ද කියනලද්දෙහි අර්ථය දැන ගණිත්. රාජන්‍යය, යම්සේ පුරුෂයෙක් අසුචිවළෙක හිස සහිතව ගිලුනේ වේද, එකල්හි තුඹ-එසේ වී නම් පින්වතුනි! ඒ පුරුෂයා ඒ අසුචිවළෙන් ගොඩ ගණිව්"යයි මෙහෙකරු පුරුෂයන්ට අණ කරන්නෙහිය. ඔව්හු යහපතැයි පිළිගෙණ ඒ පුරුෂයා ඒ අසුචිවළෙන් ගොඩ ගන්නාහුය. ඉන්පසු තුඹ ඔවුන්ට-එසේනම් පින්වත්නි! ඔහුගේ ශරීරයෙන් අසුචි මනා කොට පහවනසේ හුණ පතුරුවලින් පහකරව් යයි මෙසේ කියන්නෙහිය. ඔව්හු එයද මැනවැයි පිළිගෙණ ඒ පුරුෂයාගේ ශරීරයෙන් අසුචි මනාකොට පහවනසේ හුණ පතුරුවලින් පහ කරන්නාහුය. ඉක්බිති තුඹ ඔවුන්ට "එසේ වීනම් පින්වතුනි! ඒ පුරුෂයාගේ ශරීරය මනාකොට ඉලෙනසේ පඬුවන් මැටියෙන් තුන්වරක් මොනවට උලව්"යයි මෙසේ කියන්නෙහිය. ඔව්හුද එය පිළිගෙණ ඒ පුරුෂයාගේ කය පඬුවන් මැටියෙන් මනාකොට ඉලෙන ලෙස තුන්වරක් උලන්නාහුය. ඉන්පසු තුඹ ඒ මෙහෙකරුවන්ට "එසේ නම් පින්වත්නි! ඒ පුරුෂයාගේ ශරීරයෙහි තෙල් ගල්වා (කොකුම් ආදී) සියුම් සුණුවලින් මනා කොට පිරිසිදු වනසේ තුන්වරක් පිරිසිදු කරව්"යයි මෙසේ කියන්නෙහිය. ඔව්හුද එසේම ඒ පුරුෂයාගේ ශරීරයෙහි තෙල් ගල්වා සියුම් චූර්ණවලින් මනාකොට පිරිසිදු වනසේ තුන්වරක් පිරිසිදු කරන්නාහුය.

16. **තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තස්ස පුරිසස්ස කෙසමස්සුං කප්පෙථාති. තෙ තස්ස පුරිසස්ස කෙසමස්සුං කප්පෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තස්ස පුරිසස්ස මහග්ඝඤ්ච මාලං මහග්ඝඤ්ච විලෙපනං මහග්ඝානි ච වත්ථානි උපහරථාති. තෙ තස්ස පුරිසස්ස මහග්ඝඤ්ච මාලං මහග්ඝඤ්ච විලෙපනං මහග්ඝානි ච වත්ථානි උපහරෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි: තෙන හි භො තං පුරිසං පාසාදං ආරොපෙත්වා පඤ්ච කාමගුණෙ උපට්ඨාපෙථාති. තෙ තං පුරිසං පාසාදං ආරොපෙත්වා පඤ්ච කාම ගුණෙ උපට්ඨාපෙය්‍යුං. තං කිම්මඤ්ඤසි රාජඤ්ඤ? අපිනු තස්ස පුරිසස්ස සුන්හාතස්ස සුවිලිත්තස්ස සුකප්පිතකෙසමස්සුස්ස ආමුක්කමාලාභරණස්ස ඔදාතවත්ථවසනස්ස උපරිපාසාදවරගතස්ස පඤ්චහි කාමගුණෙහි සමප්පිතස්ස සමඞ්ගීභූතස්ස පරිචාරයමානස්ස පුනදෙව තස්මිං ගූථකූපෙ නිමුජ්ජිතුකාමතා අස්සාති? නො හිදං භො කස්සප. තං කිස්ස හෙතු? අසුචි භො කස්සප ගූථකූපො අසුචි චෙව අසුචිසඞ්ඛාතො ච දුග්ගන්ධො ච දුග්ගන්ධසඞ්ඛාතො ච ජෙගුච්ඡො ච ජෙගුච්ඡසඞ්ඛාතො ච පටික්කූලො ච පටික්කූලසඞ්ඛාතො චාති.**

---

16. ඉක්බිති තුඹ ඔවුන්ට "එසේ විනම් පින්වතුනි! ඒ පුරුෂයාගේ හිස රැවුල් කපව්"යයි කියන්නෙහිය. ඒ මෙහෙකරුවෝ ද එසේම ඒ පුරුෂයාගේ හිස රැවුල් කපන්නාහුය. ඉන් පසු තුඹ ඔවුන්ට "එසේ නම් පින්වතුනි! ඒ පුරුෂයාට මාහැඟි මල් මාලා ද මාහැඟි විලවුන්(පුයර)ද මාහැඟි වස්ත්‍ර ද එළඹවි හෙවත් ගෙණ හැර දෙව්"යයි මෙසේ කියන්නෙහිය. ඔව්හු ද එපරිද්දෙන්ම ඒ පුරුෂයාට මාහැඟි මාලා හා විලවුන් ද මාහැඟි වස්ත්‍ර ද එළඹවා තබන්නාහුය. නැවත තුඹ ඔවුන්ට "එසේ වීනම් පින්වතුනි! ඒ පුරුෂයා පහයට නංවා පස්කම්ගුණ එළඹවව්"යයි මෙසේ කියන්නෙහිය. ඔව්හු ද එසේම ඒ පුරුෂයා පහයට නංවා පඤ්චකාමගුණයන් එළඹවන්නාහුය. රාජන්‍යය, ඒ කුමකැයි හඟනෙහි ද? මනාකොට ස්නානය කළා වූ, මොනවට විලවුන් ගැල්වූ, මනාව කපන ලද හිසරැවුල් ඇති, පලඳවන ලද මාලාභරණ ඇති, සුදුවත් හැඳගත්තා වූ, උතුම් ප්‍රාසාදයෙහි මතු මහල්තලයට පැමිණියාවූ, පස්කම් ගුණයෙන් පිරිවරණ ලද්දාවූ, එසේම එයින් යුක්තවූ, (රූපාදි) පඤ්චකාම ගුණයෙන් සිත් අලවන්නා වූ, ඒ පුරුෂයාහට නැවතත් ඒ අසූචිවළෙහි ගැලෙනු කැමති බවෙක් වන්නේදැයි? වදාළසේක. එවිට රාජන්‍ය තෙමේ! පින්වත් කාශ්‍යපය! මෙය නොවන්නේම ය. ඊට හේතු කවරේ ද? භවත්

17. එවමෙව ඛො රාජඤ්ඤ මනුස්සා දෙවානං අසුචී චෙව අසුචිසඞ්ඛාතා ච දුග්ගන්ධා චෙව දුග්ගන්ධසඞ්ඛාතා ච ජෙගුච්ඡා ච ජෙගුච්ඡසඞ්ඛාතා ච පටික්කූලා ච පටික්කූලසඞ්ඛාතා ච, යොජනසතං ඛො රාජඤ්ඤ මනුස්සගන්ධො දෙවෙ උබ්බාධති. කිම්පන තෙ මිත්තාමච්චා -පෙ- සම්මාදිට්ඨී, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා, තෙ ආගන්ත්වා ආරොචෙස්සන්ති: ඉතිපි අත්ථි පරො -පෙ- විපාකො'ති. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි අත්ථි පරෙ -පෙ- විපාකොති. කිඤ්චාපි භවං -පෙ- විපාකොති.

කාශ්‍යපය! අසුචිවළ අමනාපය. අමනාප කොටස් ඇත්තේය. නොහොත් අපිරිසිදු යයි දන්නා ලද්දේය. එසේම දුර්‍ගන්ධයේ ද දුර්‍ගන්ධ කොටස්‌ාස ඇත්තේද, පිළිකුල් කටයුතු වූයේද පිළිකුල් කටයුතු කොටස් ඇත්තේද (දැකීමෙන්ම) පිළිකුල් වූයේද පිළිකුල් කොටස් ඇත්තේද වෙයි, (එහෙයිනැයි) කීය.

17. (එවිට තෙරනු) රාජන්‍යය! එපරිද්දෙන්ම මිනිස්හු දෙවියන්ට අපිරිසිදු වූවාහුද අපිරිසිදු කොටස් ඇත්තාහුද, දුගඳ වූවාහුද දුගඳ කොටස් ඇත්තාහුද, පිළිකුල් කටයුතු වූවාහුද පිළිකුල් කටයුතු කොටස් ඇත්තාහුද දැකීමෙන්ම පිළිකුල් වූවාහුද පිළිකුල්වූ කොටස් ඇත්තාහුද වෙති. රාජන්‍යය! මනුෂ්‍ය ගන්ධය තෙමේ වනාහි යොදුන් සියයක් තන්හි දෙවියන් පෙළයි. කිමෙක්ද වනාහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූද,-පෙ-සම්‍යක් දෘෂ්ටි ගත්තාවූද, තාගේ ඒ මිත්‍රාමාත්‍යයෝ -පෙ- මරණින්මතු ස්වර්‍ග ලොකයෙහි උපන්නාහු නැවත ආපසු විත් "මේ කාරණයෙන්ද පරලොවක් ඇත්තේය. -පෙ- කර්‍මයන්ගේ විපාක ඇතැ"යි තට සැළ කරන්නාහුද?නොකරන්නාහු මැයි. එබැවින් රාජන්‍යය! මේ කාරණයෙන්ද නුඹට "පරලොවක් ඇත්තේය. -පෙ- කර්‍මයන්ගේ විපාක ඇතැ"යි මෙසේ සිතක් ඇතිවේවායි වදාළහ. එවිට පායාසි තෙමේ-භවත් කාශ්‍යප තෙමේ යම්කිසි කරුණක් සලකා මෙසේ වදාරයි, එතෙකුදු වුවත් මට මේ කරුණෙහිලා "පරලොවක් නැත. -පෙ- කර්‍මයන්ගේ විපාක නැතැ"යි කියාම අදහස් වේ යයි කීය.

(දශ අකුශල කර්‍මයන් කිරීමෙන් තොරවූ සවකීය නෑදෑ මිත්‍රයන් රොගී වූ කල ඔවුන් වෙත ගොස් මරණින් මතු දෙව් ලොව උපන්නොත් තමන්ට ඒ බැව් දන්වන ලෙස කී බවත්, ඔවුන් ද එය පිළිගෙණ එසේ නොදැන් වූ බවත්, එහෙයින් පර

18. අත්ථි පන භො රාජඤ්ඤ පරියායො -පෙ- අත්ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප මිත්තාමච්චා පාණාතිපාතා පටිවිරතා -පෙ- යෙ තෙ පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං

ලෙව් ආදිය නැතැයි විශ්වාස කරණ බවත් පායාසි රාජන්‍ය තෙමේ දෙවෙනි කාරණය වශයෙන් කීය. එකල්හි තෙරනු අසුචි වළෙක ගැලී සිටි පුරුෂයෙකු එයින් ගොඩ ගෙණ නහවා පිරිසිදු කර සුවඳ විලවුන් ගල්වා වස්ත්‍රාභරණාදියෙන් අලඞ්කෘත කොට උතුම් පහයකට නංවා පස්කම්ගුණයෙන් යුක්ත කළ කල්හි නැවත පළමු සිටි අසුචි වළෙහි ගැලෙනු කැමති සිතක් ඒ පුරුෂයාට කිසිසේත් පහළ නොවන්නා සේම දෙව්ලොව උපන්නහුට ද නැවත මිනිස් ලොවට එන අදහසක් පහළ නොවන බවත්, දෙවියන්ට මිනිසුන් අසුචි මෙන් පිළිකුල් බවත්, එසේම මිනිස් ගඳ යොදුන් සියයක් ඈත සිටින දෙවියන් පවා පෙළන බවත් ප්‍රකාශ කොට පරලෙව් ආදිය ඇති බවම දෙසූහ. තමුත් පායාසි රාජන්‍ය තෙමේ තමාගේ දෘෂ්ටිය අත්නොහළ හෙයින් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ නැවතත් මෙසේ වදරති.)

18. පින්වත් රාජන්‍යය, යම් කාරණයකින් නුඹට මෙසේ අදහස් වේනම් ඊට තවත් කාරණයක් ඇත්තේදැයි? භවත් කාශ්‍යපය, ඊට තවත් කාරණයෙක් ඇත්තේ ය. රාජන්‍යය, ඒ කෙබඳු කාරුණක්දැයි? තෙරනු විචාළහ. එවිට රාජන්‍ය තෙමේ- පින්වත් කාශ්‍යපය, ප්‍රාණඝාත නොකරන්නා වූ, නුදුන් දේ නොගන්නා වූ, කාමමිථ්‍යාචාරයෙන් තොර වූ, බොරු නොකියන්නා වූ, මදයට හා ප්‍රමාදයට කාරණ වූ රහමෙර පීමෙන් වැළකුනා වූ මාගේ මිත්‍රාමාත්‍යයෝ ද සහලේ නෑයෝ ද ඇත්තාහුමය. පසු කලෙක ඔව්හු රොගිවූවාහු දුකට පත්වූවාහු දැඩිලෙස ගිලන්වූවාහු වෙති. යම්කලෙක්හි දැන් ඉතින් මොව්හු මේ රොගයෙන් නොනැගිටින්නාහයි දැන ගණිම් ද, එකල මම ඔවුන් වෙත ගොස් පින්වත්නි, යම් කෙනෙක් ප්‍රාණඝාතාදී පස්පව් නොකෙරේද්ද, ඔව්හු කය බිඳීමෙන් මරණින් මතු ශොභන ගති ඇති දෙව්ලොව තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණෙත් යයි මෙසේ කියන්නා වූ, මෙබඳු දෘෂ්ටි ඇත්තා වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහු මය. පින්වත්හු වනාහි ප්‍රාණඝාතයෙන්

ලොකං උපපජ්ජන්ති දෙවානං තාවතිංසානං සහබ්‍යතන්ති. භවන්තො ඛො පාණාතිපාතා පටිවිරතා -පෙ- මජ්ජපමාදට්ඨානා පටිවිරතා.

19. සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං, භවන්තො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සන්ති දෙවානං තාවතිංසානං සහබ්‍යතං, සචෙ ඛො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාථ දෙවානං තාවතිංසානං සහබ්‍යතං, යෙන මෙ ආගන්ත්වා -පෙ- නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. තෙන හි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි.

වැළකුනාහුය. නුදුන් දේ ගැණීමෙන් වැළකුනාහුය. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාහුය. බොරු කීමෙන් වැළකුනාහුය. මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීමෙන් වැළකුනාහුය.

19. (එසේ හෙයින්) ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචන සත්‍ය වේ නම් පින්වත්නු මරණින් මතු දෙව්ලොව තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නාහුය. ඉදින් පින්වත්නි, එසේ මරණින් මතු තව්තිසා දෙව්ලොව උපන්නාහු නම් මා වෙත පැමිණ “මේ කාරණයෙන් ද පරලොවෙක් ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහ. කුශලාකුශල කර්මයන්ගේ පල විපාක ඇත්තාහ”යි මෙසේ සැළ කරව්. පින්වත්නු වනාහි මා විසින් ඇදහිය යුතු වචන ඇත්තෝ ද, විශ්වාස කටයුතු වචන ඇත්තෝ ද වෙති. එහෙයින් පින්වතුන් විසින් යමක් දක්නා ලද නම් එය මා විසින් දක්නා ලද්දක් සේම වන්නේ යයි මෙසේ කියමි. ඔව්හු ද මාගේ වචනය යහපතැයි පිළිගෙණ නැවත අවුත් නොම සැළ කෙරෙත්. දූතයකුදු නොම එවත්. පින්වත් කාශ්‍යපය, යම් කරුණකින් පරලෙව් ආදිය නැතැයි මට අදහස් වේ ද? මේ ඊට තවත් කාරණයක් වේ යයි කීය.

(හේතෙමේ ප්‍රාණඝාතාදී පස් පවින් වැළකීම් සඞ්ඛ්‍යාත පඤ්චශීලය සමාදන්ව පවතින්නවුන්ගේ වශයෙන් සලකා, එසේ පඤ්චවිධ දුශ්චරිතයෙන් තොර වූ සවකීය නෑදෑ මිත්‍රයන් වෙත ද ගොස් ඇතැම් මහණ බමුණන්ගේ මතය පරිදි මරණින් මතු තව්තිසා දෙව්ලොව උපන්නනු නම් තමහට ඒ බව දන්වන

20. **යං ඛො පන රාජඤ්ඤ මානුස්සකං වස්සසතං, දෙවානං තාවතිංසානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංස රත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං දෙවානං තාවතිංසානං ආයුප්පමාණං. යෙ තෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා දෙවානං තාවතිංසානං සහබ්‍යතං. සචෙ පන තෙසං එවං භවිස්සති: යාව මයං ද්වෙ වා තීණි වා රත්තින්දිවානි දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගිභූතා පරිචාරෙම අථ මයං පායාසිස්ස රාජඤ්ඤස්ස ගන්ත්වා ආරොචෙය්‍යාම ඉතිපි අත්ථි පරො -පෙ- විපාකොති, අපිනු තෙ ආගන්ත්වා ආරොචෙය්‍යුං: ඉතිපි අත්ථි පරො -පෙ- විපාකොති? නො හෙතං භො කස්සප,**

ලෙස කී කල්හි එය සතුටින් භාරගෙණ ඔවුන් එසේ නො දැන්වූ බවත්, දූරස්ථානයන්හි උපන්නන් නැවත විත් නොදැන්නුවත් මිනිස් ලොවට සමීප වූ තාවතිංස භවනයෙහි උපන්නෝ කුමක් හෙයින් අවුත් සැළ නො කෙරේද්දැයි සලකා එහෙයින් පර ලෙව් ආදිය නැත්තේ යයි විශ්වාස කරණ බවත් කීය.)

(එවිට කුමාරකාශ්‍යප තෙරණුවෝ,) එසේ වී නම් රාජන්‍යය, මේ කරුණෙහි ලා තාම විචාරන්නෙමි, යම් පරිද්දකින් තුඹට වැටහෙන්නේ නම් එපරිද්දෙන් එය ප්‍රකාශ කරන්නෙහිය.

20. රාජන්‍යය, මිනිසුන් පිළිබඳ වූ යම් අවුරුදු සියයෙක් වේ ද, එය තව්තිසා වැසි දෙවියන්ට එක් රෑ දවලෙක් වෙයි. ඒ රැයින් තිස් රෑක් ඇත්තේ මසෙක් වේ. ඒ මසින් දොළොස් මසක් ඇත්තේ අවුරුද්දෙක් වෙයි. ඒ අවුරුදු ගණනින් දිව්‍ය වූ අවුරුදු දහසක් තව්තිසා වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණය වෙයි. ප්‍රාණඝාතා දී පස් පවින් වැළකුණා වූ තාගේ ඒ මිත්‍රාමාත්‍යයෝ ද සහ ලේ නෑයෝ ද මරණින් මතු සැපයෙන් අනු වූ සහපත් ගති ඇති තව්තිසා දෙව්ලොව උපන්නාහුය. ඉදින් වනාහි ඔවුන්ට "අපි පළමු කොට රෑ දවල් දෙකක් හෝ තුණක් දිව්‍යමය වූ පස්කම් ගුණයෙන් පිණා ගියාහු එහෙයින්ම එයින් යුක්තව සිත් අලවමු. ඉන් පසු පායාසි රාජන්‍ය වෙත ගොස් මේ කාරණයෙන් ද පරලෙව් ආදිය ඇති බැව් සැළ කරන්නෙමු" යි මෙසේ සිතෙක් වන්නේ ද? එසේ ඇති කල්හි ඒ නෑදෑ මිත්‍රයෝ අවුත් "මේ කාරණයෙන් ද පරලොවක් ඇත්තේය, මැරී උප

අපි හි මයං භො කස්සප චිරකාලකතාපි භවෙය්‍යාම. කො පනෙතං භොතො කස්සපස්ස ආරොචෙති: අත්‍ථි දෙවා තාවතිංසාති වා, එවං දීඝායුකා දෙවා තාවතිංසාති වා, න මයං භොතො කස්සපස්ස සද්දහාම: අත්‍ථි දෙවා තාවතිංසාති වා එවං දීඝායුකා දෙවා තාවතිංසාති වාති.

21. සෙය්‍යථාපි රජඤ්ඤ ජච්චන්‍ධො පුරිසො න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි, න පස්සෙය්‍ය නීලකානි රූපානි, න පස්සෙය්‍ය පීතකානි රූපානි, න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි, න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨිකානි රූපානි, න පස්සෙය්‍ය සමවිසමං, න පස්සෙය්‍ය තාරකරූපානි, න පස්සෙය්‍ය චන්‍දිමසූරියෙ, සො එවං වදෙය්‍ය, නත්‍ථි කණ්හසුක්කානි රූපානි, නත්‍ථි කණ්හසුක්කා

දන්නා සත්ත්වයෝ ඇත්තාහ කර්මයන්ගේ විපාක ඇතැ"යි තම සැළ කරන්නාහු දැයි ඇසූහ. එවිට රාජන්‍ය තෙමේ- පින්වත් කාශ්‍යපය, මෙය නො වන්නේමය. පින්වත් කාශ්‍යපය! එවිට අපි කාලක්‍රියා කොට බොහෝ කල් ඇත්තෝ ද වන්නෙමු. තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහයි කියා හෝ තව්තිසා වැසි දෙවියෝ මෙසේ දීර්ඝායුෂ්කයෝ යයි කියා හෝ කවරෙක් වනාහි මෙය භවත් කාශ්‍යපහට සැළ කෙරේ ද? තව්තිසා දෙවියෝ ඇත්තාහයි කියා හෝ තව්තිසා දෙවියෝ මෙසේ දීර්ඝායුෂ්කයෝ යයි කියා හෝ කියන භවත් කාශ්‍යපයන්ගේ වචනය අපි නො අදහමුයි කීය.

21. (එකල්හි තෙරහු) රාජන්‍යය යම් සේ ජාත්‍යන්ධ පුරුෂයෙක් හෙවත් උත්පත්තියෙන්ම අන්ධ වූවෙක් කලු සුදු රූපයන් නො දක්නේ ද, නිල්වන් රූපයන් නො දක්නේ ද, කහවන් රූපයන් නො දක්නේ ද, ලේවන් රූපයන් නො දක්නේ ද, මදටවන් රූපයන් නො දක්නේ ද, සම විසම දෙක නො දක්නේ ද, තාරකා රූපයන් නො දක්නේ ද, සඳ හිරු දෙදෙන නො දක්නේ ද, හේ තෙමේ මෙසේ කියන්නේය. කෙසේ ද යත්? කලු සුදු රූපයෝ නැත්තාහ, කලු සුදු රූපයන් දක්නා සුලු කෙනෙකුත් නැත්තාහ, නිලවණ් රූපයෝ නැත්තාහ, නිලවණ් රූපයන් දක්නාසුලු කෙනෙකුත් නැත්තාහුය. පීතවණ් රූපයෝ නැත්තාහුය, පීතවණ් රූපයන් දක්නාසුලු කෙනෙකුත් නැත්තාහුය. ලේවන් රූපයෝ නැත්තාහ, ලේවන් රූපයන් දක්නාසුලු කෙනෙකුත් නැත්තාහ. මදටවන් රූපයෝ නැත්තාහ. මදටවන් රූපයන් දක්නා

නං රූපානං දස්සාවී, නත්ථි නීලකානි රූපානි, නත්ථි නීලකානං රූපානං දස්සාවී, නත්ථි පීතකානි රූපානි, නත්ථි පීතකානං රූපානං දස්සාවී, නත්ථි ලොහිතකානි රූපානි, නත්ථි ලොහිතකානං රූපානං දස්සාවී, නත්ථි මඤ්ජෙට්ඨිකානි රූපානි, නත්ථි මඤ්ජෙට්ඨිකානං රූපානං දස්සාවී, නත්ථි සමවිසමං, නත්ථි සමවිසමස්ස දස්සාවී, නත්ථි තාරකරූපානි, නත්ථි තාරකරූපානං දස්සාවී, නත්ථි චන්දිමසූරියා, නත්ථි චන්දිමසූරියානං දස්සාවී, අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමි, තස්මා තං නත්ථීති. සම්මා නුඛො සො රාජඤ්ඤ වදමානො වදෙය්‍යාති?

22. නො හෙතං භො කස්සප? අත්ථි කණ්හසුක්කානි රූපානි, අත්ථි කණ්හසුක්කානං රූපානං දස්සාවී, අත්ථි -පෙ- සූරියානං දස්සාවී, අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමි, තස්මා තං නත්ථීති. න හි සො භො කස්සප සම්මා වදමානො වදෙය්‍යාති එවමෙව ඛො ත්වං රාජඤ්ඤ ජච්චන්ධූපමො මඤ්ඤෙ පටිභාසි, යං මං ත්වං එවං වදෙසි: කො -පෙ- සද්දහාම: අත්ථි දෙවා තාවතිංසාති වා, එවං දීඝායුකා දෙවා තාවතිංසාති වාති. න ඛො රාජඤ්ඤ එවං පරො ලොකො දට්ඨබ්බො, යථා ත්වං මඤ්ඤසි ඉමිනා මංස චක්ඛුනා.

සුලු කෙනෙකුත් නැත්තාහ. සම විසමයක් නැත්තාහ සම විසමය දක්නාසුලු කෙනෙකුත් නැත්තාහුය. තාරකා රූපයෝ නැත්තාහ, තාරකා රූපයන් දක්නාසුලු කෙනෙකුත් නැත්තාහ, චන්ද්‍ර සූර්‍ය්‍යයෝ නැත්තාහ. චන්ද්‍ර සූර්‍ය්‍යයන් දක්නා සුලු කෙනෙකුත් නැත්තාහුය. මම මෙය නොදනිමි, මම මෙය නො දකිමි. එහෙයින් එය නැත්තේය කියාසි. පින්වත් රාජන්‍යය, හෙතෙමේ මෙසේ කියන්නේ යහපත් කොට කියන්නේ දැයි හෙවත් ඔහුගේ කීම යහපත් දැයි විචාළහ.

22. (එවිට රාජන්‍ය තෙමේ:) පින්වත් කාශ්‍යපය, මෙය යහපත් නො වන්නේමය. කලු සුදු රූපයෝ ඇත්තාහුය, ඒ රූපයන් දක්නාසුලු වූවෝ ද ඇත්තාහුය. -පෙ- සඳ හිරු දෙදෙන ඇත්තාහ, ඔවුන් දක්නෝ ද ඇත්තාහුය. එහෙයින් භවත් කාශ්‍යපය මම මෙය නොදනිමි, මම මෙය නොදකිමි, එබැවින් එය නැත්තේයයි හෙතෙමේ මෙසේ කියන්නේ යහපත් කොට කියන්නෙක් නොවේ යයි කීයේය. (එකල තෙරනු) එපරිද්දෙන්ම රාජන්‍යය, "තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහයි කියා හෝ තව්තිසා දෙවියෝ මෙසේ දීඝායුෂ්කයෝ යයි කියා හෝ පින්වත් කාශ්‍යපහට කවරෙක් සැළ කෙරේ ද,

23. යෙ ඛො තෙ රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති [අප්පසද්දානි අප්පනිග්ඝොසානි.] තෙ තත්ථ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා දිබ්බං චක්ඛුං විසොධෙන්ති, තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ඉමඤ්චෙව ලොකං පස්සන්ති පරඤ්ච, සත්තෙ ච ඔපපාතිකෙ. එවඤ්ච ඛො රාජඤ්ඤ පරො ලොකො දට්ඨබ්බො, නත්වෙව යථා ත්වං මඤ්ඤසි ඉමිනා මංසචක්ඛුනා. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි අත්ථි පරො -පෙ- විපාකොති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවමෙව එත්ථ හොති: ඉතිපි නත්ථි පරො -පෙ- විපාකොති.

භවත් කාශ්‍යපයන්ගේ මේ වචනය අපි විශ්වාස නොකරමු"යි යම් හෙයකින් නුඹ මට මෙසේ කියෙහි ද, එසේ හෙයින් නුඹ මට ජාත්‍යන්ධයෙකු මෙන් වැටහෙන්නෙහිය, රාජන්‍යය! යම් සේ නුඹ සිතන්නෙහි ද, පරලොව තෙමේ එසේ මේ මසැසින් නො දක්ක හැකිය.

23 රාජන්‍යය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් අරණ්‍යයෙහි නිශ්ශබ්ද වූ ඝෝෂා නැත්තා වූ, වනයෙහි ඉතාම දුර පිහිටි සෙනසුන් සෙවනය කෙරෙත් ද? ඔව්හු එහි අප්‍රමාදයෙන් යුක්තව කෙලෙස් තවන වියර්‍ය ඇත්තෝව්, කාය ජිවිත දෙක්හි බලාපොරොත්තු නැත්තෝව වාසය කරන්නාහු දිවැස පිරිසිදු කෙරෙති. ඉන් පසු ඔව්හු එසේ පිරිසිදු වූ මිනිසැස ඉක්ම පැවැත්තා වූ දිව්‍ය වූ ඇසින් මෙලොව ද, පරලොව ද, චුතව උපදනා සත්ත්වයන් ද දකිත්. රාජන්‍යය! පරලොව දතයුත්තේ මෙසේය, නුඹ මේ මසැසින් යම් සේ සිතන්නෙහි ද, එපරිද්දෙන් නොවේ රාජන්‍යය! මේ කාරණයෙන් ද නුඹට "මෙලොව සිටියහුට පරලොවක් ඇත්තේය, මැරී උපදනා සත්ත්වයෝ ඇත්තාහ, කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත්තාහයි මෙබඳු සිතක් ඇතිවිය යුතු යයි වදාළසේක. නැවත ද රාජන්‍ය තෙමේ: භවත් කාශ්‍යප තෙමේ කිසියම් කරුණක් සලකා මෙසේ කියයි. එසේ වුව ද මෙහි ලා මේ කාරණයෙන් ද පරලෙව් ආදිය නැතැයි කියාම මට අදහස් වේ යයි කීය. (මෙහි අරණ්‍ය සෙනාසනාදිය ඇසුරු කරමින් දිවැස පිරිසිදු කළයුතු බවත් ඒ දිවැසින් පරලෙව් ආදිය ඇත්තේ යයි දතයුතු බවත් කුමාර කාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේය. එහෙත් පායාසි රාජන්‍ය ද ස්වකීය දෘෂ්ටිය අත් නොහලේය.)

24. අත්‍ථි පන රාජඤ්ඤ පරියායො -පෙ- අත්‍ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධාහං භො කස්සප පස්සාමි සමණබ්‍රාහ්මණෙ සීලවන්තෙ කල්‍යාණධම්මෙ ජීවිතුකාමෙ අමරිතුකාමෙ සුඛකාමෙ දුක්ඛපටික්කූලෙ. තස්ස මය්හං භො කස්සප එවං හොති සචෙ ඛො ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා එවං ජානෙය්‍යුං: ඉතො නො මතානං සෙය්‍යො භවිස්සතීති, ඉදානිමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා විසං වා ඛාදෙය්‍යුං, සත්ථං වා ආහරෙය්‍යුං, උබ්බන්ධිත්වා වා කාලං කරෙය්‍යුං, පපාතෙ වා පපතෙය්‍යුං, යස්මා ච ඛො ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා න එවං ජානන්ති: ඉතො නො මතානං සෙය්‍යො භවිස්සතීති, තස්මා ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා ජීවිතුකාමා අමරිතුකාමා සුඛකාමා දුක්ඛපටික්කූලා අත්තානං න මාරෙන්තීති. අයම්පි භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්‍ථි පරෙ ලොකො නත්‍ථි සත්තා ඔපපාතිකා, නත්‍ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති

---

24. (නැවත තෙරණුවෝ:) රාජන්‍යය! පරලොකාදිය නැතැයි තට සිතෙන තවත් කරුණක් ඇත්තේ දැයි ඇසූහ. රාජන්‍ය තෙමේ: පින්වත් කාශ්‍යපය! එබඳු තවත් කරුණක් ඇත්තේ යයි පිළිතුරු දින, ඒ කෙබඳු කරුණක් දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! මේ ලොකයෙහි සිල්වත් වූ, යහපත් සවභාව ඇත්තා වූ, ජිවත්වනු කැමැත්තා වූ, නොමැරෙණු කැමැත්තා වූ සැප කැමැත්තා වූ දුකට පිළිකුල් කරන්නා වූ මහණ බමුණන් මම දකිමි. භවත් කාශ්‍යපය! ඒ මට මෙබඳු අදහසෙක් වෙයි. කෙබඳු ද යත්? ඉදින් වනාහි සිල්වත් වූ එහෙයින් ම යහපත් සවභාව ඇති මේ පින්වත් මහණ බමුණෝ. "මෙසින් චුත වූ අපට ශ්‍රෙෂ්ඨ වූ සුගති සැපතෙක් වන්නේ" යයි මෙසේ දන්නාහු නම්, දැන් මේ සිල්වත් කලණදම් ඇති පින් වත් මහණ බමුණෝ මැරෙණු පිණිස විෂ හෝ කන්නාහුය. ශස්ත්‍ර හෝ තමහට එළවා ගන්නාහුය, හෙවත් ආවුධවලින් හෝ මරණය සිදුකර ගන්නාහුය. බොටුවෙහි වැල ලාගෙණ හෝ කාලක්‍රියා කරන්නාහුය. ප්‍රපාතයෙක්හි හෝ පතිත වන්නාහුය, හෙවත් උසකින් හෝ පනින්නාහුය. යම් හෙයකින් වනාහි මේ සිල්වත් මහණ බමුණෝ "අපට මෙසින් මළ කල්හි පර ලොව ශ්‍රේෂ්ඨ සැපතක් වන්නේ" යයි මෙසේ නො දනිත් ද, එහෙයින් සිල්වත් යහපත් සවභාව ඇති ජිවත්වනු කැමති

25. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස ද්වෙ පජාපතියො අහෙසුං. එකිස්සා පුත්තො අහොසි දසවස්සුද්දෙසිකො වා ද්වාදසවස්සුද්දෙසිකො වා, එකා ගබ්භිණී උපවිජඤ්ඤා, අථ ඛො සො බ්‍රාහ්මණො කාලමකාසි. අථ ඛො සො මාණවකො මාතුසපත්තිං එතදවොච: යම්දං භොති ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා, සබ්බන්තං මය්හං, නත්ථි තුය්හෙත්ථ කිඤ්චි, පිතු මෙ භොති දායජ්ජං නිය්‍යාතෙහීති. එවං වුත්තෙ සා බ්‍රාහ්මණී තං මාණවකං එතදවොච: ආගමෙහි තාව තාත යාව විජායාමි. සචෙ කුමාරකො භවිස්සති, තස්සපි එකදෙසො භවිස්සති, සචෙ කුමාරිකා

මැරෙන්ට නො කැමති සැප කැමති දුකට පිළිකුල් කරණ මේ පින්වත් මහණ බමුණෝ තමන් මරා නොගණිති. භවත් කාශ්‍යපය! යම් කරුණකින් මට "පරලොවෙක් නැත, චුතව උපදනා සත්වයෝ නැත, කර්මයන්ගේ විපාක නැතැ"යි මෙසේ සිතෙක් වේ ද, මේ ද ඊට කාරණයක් වෙයි කීය.

25. (එකල්හි තෙරනු:) එසේ වී නම් රාජන්‍යය! තට උපමාවක් කරන්නෙමි, උපමාවෙන් ද මෙලොව ඇතැම් නුවණැති පුරුෂයෝ කියන ලද්දෙහි අර්ථය දැන ගණිත්. එහෙයින් පෙර වූ කරුණක් කියමි. රාජන්‍යය! එක්තරා බ්‍රාහ්මණයෙකුට භාර්යාවෝ දෙදෙනෙක් වූහ. ඉන් එක් භාර්යාවකට දස හැවිරිදි වූ හෝ දොළොස් හැවිරිදි වූ හෝ පුතෙක් විය. අනික් භාර්යාව ගර්භිණී වූවා මේරූ ගැබ් ඇත්තී ලංවූ වදන කල් ඇත්තී වූවාය. එකල්හි වනාහි ඒ බමුණු තෙමේ කලුරිය කෙළේය. ඉක්බිති ඒ මාණවක තෙමේ මවගේ සැතිරියට මෙසේ කීය. (එක් පුරුෂයෙකුගේ භාර්යාවෝ යම් තාක් වෙත් ද, ඒ සියල්ලෝම ඔවුනොවුන්ට "සපත්නී" හෙවත් සැතිරියෝ වෙති.) පින්වතිය! යම් මේ ධනයෙක් හෝ ධාන්‍යයෙක් හෝ රිදීයෙක් හෝ ස්වර්ණයෙක් හෝ වේ ද, ඒ සියල්ල මාගේය, තට මෙහි කිසිවක් නැත්තේය. පින්වතිය! එබැවින් පියාගේ දවැද්ද වූ මේ වස්තුව මට පාවා දෙව යනුයි. මෙසේ කී කල්හි ඒ බැමිණී තොමෝ ඒ මාණවකයාට මෙසේ කීවාය, කෙසේ ද යත්? පුත්‍රය! යම්තාක් වදන්නෙම් ද, ඒතාක් බලා පොරොත්තු වෙව, එකල්හි ඉදින් කුමාරයෙක් වන්නේ නම් ඔහුට ද එක් කොටසක් අයිති වන්නේය. ඉදින් කුමරියක් වන්නී නම් ඕ තොමෝ ද තට පාදපරිචාරිකාවක් හෙවත්

භවිස්සති, සාපි තෙ උපභොග්ගා භවිස්සතීති. දුතියම්පි ඛො සො මාණවකො මාතුසපත්තිං එතදවොච යම්දං -පෙ- නියාතෙහීති. දුතියම්පි ඛො සා බ්‍රාහ්මණී තං මාණවකං එතදවොච: ආගමෙහි -පෙ- භවිස්සතීති.

26 තතියම්පි ඛො සො මාණවකො මාතු සපත්තිං එතදවොච: යම්දං -පෙ- නියාතෙහිති. අථ ඛො සා බ්‍රාහ්මණී සත්ථං ගහෙත්වා ඔවරකං පවිසිත්වා උදරං ඔඵාලෙසි, යාව විජානාමි යදිවා කුමාරකො යදිවා කුමාරිකාති, සා අත්තානඤ්චෙව ජීවිතඤ්ච ගබ්භඤ්ච සාපතෙය්‍යඤ්ච විනාසෙසි, යථා තං බාලා අබ්‍යත්තා අනයබ්‍යසනං ආපන්නා අයොනිසො දායජ්ජං ගවෙසන්ති, එවමෙව ඛො ත්වං රාජඤ්ඤ බාලො අබ්‍යත්තො අනයව්‍යසනං ආපජ්ජිස්සසි අයොනිසො පරලොකං ගවෙසන්තො, සෙය්‍යථාපි සා බ්‍රාහ්මණී බාලා අබ්‍යත්තා අනයව්‍යසනං ආපන්නා අයොනිසො දායජ්ජං ගවෙසන්ති. න ඛො රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා අපක්කං පරිපාචෙන්ති. අපි ච පරිපාකං

භාගයීමක් වන්නී යයි කියායි. දෙවනුව ද ඒ මාණවක තෙමේ මේ වස්තුව පවරා දෙවයි මවගේ සැතිරියට පෙර පරිද්දෙන්ම කීය. ඒ බැමිණි තොමෝ ද දෙවනුවත් පෙර මෙන්ම වදන තුරු ඉවසන ලෙස කීවාය.

26. තුන් වෙනුව ද ඒ මාණවක තෙමේ වස්තුව පවරා දෙන ලෙස පෙර සේම මවගේ සැතිරියට කීයේය. එකල්හි වනාහි ඒ බැමිණි තොමෝ ශස්ත්‍රයක් හෙවත් ආයුධයක් ගෙණ කාමරයකට පිවිස "ඉදින් කුමරුවෙක් හෝ වේ ද, ඉදින් කුමරියක් හෝ වේ ද එය දනිමි" යි බඩ පැලුවාය. ඕ තොමෝ තමන් ද ජීවිතය ද ගැබ ද වස්තුව ද යන සියල්ල විනාශ කළාය. අඥාන වූ අව්‍යක්ත වූ නුනුවණින් දූවැද්ද සොයන්නී අනය ව්‍යසනයට හෙවත් මහත් දුකට පැමිණියා වූ තැනැත්තියක් යම්සේ නම් එමෙනි. එපරිද්දෙන්ම වනාහි රාජන්‍යය! අඥාන වූ අව්‍යක්ත වූ නුනුවණින් පරලොව සොයන්නා වූ නුඹ මහත් දුකට පැමිණෙන්නෙහිය. නුවණ නැති එසේම අදක්ෂ වූ නුනුවණින් දූවැද්ද සොයමින් අනයව්‍යසනයට පැමිණියා වූ ඒ බැමිණිය මෙනි. රාජන්‍යය! සිල්වත් වූ එහෙයින්ම යහපත් ස්වභාව ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නො මේරූ ක්ෂය නුවූ ආයුෂ්‍ය අතරෙහි නො සිඳිත්. එසේ වුව ද පණ්ඩිතයෝ ආයුපරිපාක කාලය හෙවත් ආයුෂ මෝරණ කාලය බලාපොරොත්තු වෙති.

ආගමෙන්ති පණ්ඩිතා, අත්‍ථො හි රාජඤ්ඤ සමණබ්‍රාහ්මණානං සීලවන්තානං කල්‍යාණධම්මානං ජීවිතෙන. යථා යථා ඛො රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා චිරං දීඝමද්ධානං තිට්ඨන්ති, තථා තථා බහුං පුඤ්ඤං පසවන්ති, බහුජනහිතාය ච පටිපජ්ජන්ති බහුජනසුඛාය ලොකානුකම්පාය අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි -පෙ- විපාකොති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ. අථ ඛො එවං මෙ එත්‍ථ හොති: ඉතිපි -පෙ විපාකොති.

රාජන්‍යය! සිල්වත් කලණ දම්හි පිහිටි මහණ බමුණන්ට ජීවිතයෙන් ප්‍රයෝජන ඇත්තේමය. රාජන්‍යය! යම් යම් පරිද්දකින් ඒ යහපත් මහණ බමුණෝ බොහෝ දිඝී කාලයක් මුළුල්ලෙහි වාසය කෙරෙත් ද, ඒ ඒ පරිද්දෙන් ඔව්හු බොහෝ කුසල් රැස් කෙරෙත්. මහාජනයාට වැඩ පිණිස ද, මහාජනයාට සැප පිණිස ද, ලෝවැස්සාට අනුකම්පා පිණිස ද, දෙවිමිනිසුන්ට වැඩ පිණිස ද හිත පිණිස ද සැප පිණිස ද පිළිපදිත්. රාජන්‍යය! මේ කාරණයෙන් ද පරලොවෙක් =පෙ- විපාක ඇතැයි මෙසේ සිතක් ඇතිවිය යුතු යයි (වදාළ සේක.) එකල්හි ද රාජන්‍ය තෙමේ; භවත් කාශ්‍යපයෝ කෙසේ නමුත් මෙසේ කියති. එතකුදු වුවත් මේ කරුණෙහි ලාද මට "පරලොවෙක් -පෙ- විපාක නැතැ" යි කියාම අදහස් වේ යයි කීය.

(සිල්වත් ගුණවත් මහණ බමුණෝ තමන් මෙලොවින් චුත වූ කල දෙව්ලොව උපදින බව දනිත් නම් ඔහු බෙල්ලේ වැලලාගෙණ හෝ ආයුධයකින් කපාගෙණ හෝ නම්කිසි උපක්‍රමයකින් ඉක්මනින්ම මැරෙණ බවත්, නමුත් ඔවුන් එසේ ඉක්මනින් මැරීමට නො කැමති හෙයින් පරලෙව් ආදිය නැතැයි තමා කල්පනා කරණ බවත් පායාසිරාජන්‍ය තෙමේ තවත් කරුණක් ලෙස කීය. එවිට තෙරහු: නුනුවණින් දූවැද්ද සොයමින් විනාශයට පත් බැමිණිය මෙන් ඒ යහපත් මහණ බමුණන් එසේ නො කරණ බවත්, එසේම නුනුවණින් පරලොව සොයන පායාසිරාජඤ්ඤත් විනාශයට පත්විය හැකි බවත්, සිල්වත් ගුණවත් මහණ බමුණන්ගේ ජීවත්වීම තමන් මත් අනුන්ටත් හිත වැඩ පිණිස පවත්නා බවත්, ඔව්හු යම්තාක් ජීවත් වෙත් නම් ඒතාක් බොහෝ කුසල් රැස්කර ගන්නා බවත් ප්‍රකාශ කොට එය ද පරලෙව් ආදිය නැතැයි සිතීමට කාරණයක් නො වන බව දැක්වූහ. එහෙත් හෙතෙමේ ද ස්වකීය දෘෂ්ටිය එසේම ගත්තේය.)

27. අත්‍ථි පන රාජඤ්ඤ පරියායො -පෙ- අත්‍ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති: අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. ත්‍යාහං එවං වදාමි. තෙන හි භො ඉමං පුරිසං ජීවන්තංයෙව කුම්භියා පක්ඛිපිත්වා මුඛං පිදහිත්වා අල්ලෙන චම්මෙන ඔනන්ධිත්වා අල්ලාය මත්තිකාය බහලං අවලෙපනං කරිත්වා උද්ධනං ආරොපෙත්වා අග්ගිං දෙථාති. තෙ මෙ සාධූති පටිස්සුත්වා තං පුරිසං ජීවන්තංයෙව අග්ගිං දෙන්ති. යදා මයං ජානාම කාලඞ්කතො සො පුරිසොති, අථ තං කුම්භිං ඔරොපෙත්වා උබ්භින්දිත්වා මුඛං විවරිත්වා සනිකං නිල්ලොකෙම, අප්පෙව නාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං පස්සාම. අයම්පි භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති ඉතිපි -පෙ- විපාකොති

---

27. (නැවත ද තෙරණුවෝ.) රාජන්‍යය! පරලෝකාදිය නැත කියා තට අදහස් වන තවත් කරුණක් ඇද්දැයි විචාළහ. ඊට රජන්‍ය තෙමේ එබඳු තවත් කරුණක් ඇතැයි පිළිතුරු දුන්නේය. ඒ කිනම් කරුණක් දැයි තෙරහු පිළිවිසූහ. එකල හෙතෙමේ: භවත් කාශ්‍යපය! මෙහි මාගේ මෙහෙකරු පුරුෂයෝ අපරාධ කාරණසුලු වූ සොරෙකු අල්වා ගෙණ විත් "දෙවයන් වහන්ස! මේ තෙමේ තමුන්නාන්සේගේ අණට විරුද්ධව අපරාධ කාරණ සොරෙකි. මොහුට යම් දඬුවමක් කරණු කැමැත්තනු නම් එය පණවන සේක්වා"යි කියා මට දක්වති. එකල්හි මම ඔවුන්ට "එසේ වී නම් පින්වතුනි! ජීවත්වන්නා වූ ම මේ පුරුෂයා සැළියෙක බහා කට වසා තෙත් සමකින් වෙළා බැඳ තෙත් මැටියෙන් ඝන ලෙස ආලෙප කොට උදුනට නංවා ගිනි දල්වව්" යයි මෙසේ කියමි. ඔහු මාගේ වචනය මැනවැයි පිළිගෙණ ජීවත්වන්නා වූ ම ඒ පුරුෂයා සැළියෙක බහා කට වසා තෙත් සමකින් වෙළා බැඳ තෙත් මැටියෙන් ඝන ලෙස ආලෙප කොට උදුනට නංවා ගිනි දල්වති. යම් කලෙක්හි ඒ පුරුෂයා කලුරිය කෙළේ යයි අපි දනිමුද? එකල්හි "නික්මෙන්නා වූ මොහුගේ ජීවය හෙවත් ආත්මය දක්නෙමු නම් ඉතා යෙහෙකැ"යි සිතා සැළිය බහා තබා මැටි ආලෙපය බිඳ මුව විවර කොට සෙමින් ඔහු දෙස බලමු. නමුත් අපි නික්මෙන්නා වූ ඔහුගේ ජීවය නොම දකුම්හ. පින්වත් කාශ්‍යපය! යම් කරුණකින් මට "පරලොවෙක් -පෙ- විපාක නැතැ"යි සිතෙක් වේ ද, මේ ද ඊට එක් කරුණකැයි කීය.

28. තෙන හි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි, අභිජානාසි නො ත්වං රාජඤ්ඤ දිවාසෙය්‍යං උපගතො සුපිනකං පස්සිතා ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති? අභිජානාමහං භො කස්සප දිවාසෙය්‍යං -පෙ- රාමණෙය්‍යකන්ති. රක්ඛන්ති තං තම්හි සමයෙ ඛුජ්ජාපි වාමනකාපි කෙළාසිකාපි කොමාරිකාපීති. එවං භො කස්සප රක්ඛන්ති මං තස්මිං -පෙ- කොමාරිකාපීති. අපිනු තා තුය්හං ජීවං පස්සන්ති පවිසන්තං වා නික්ඛමන්තං වාති? නො හෙතං භො කස්සප! තා හි නාම රාජඤ්ඤ තුය්හං ජීවන්තස්ස ජීවන්තියො ජීවං න පස්සිස්සන්ති පවිසන්තං වා නික්ඛමන්තං වා, කිම්පන ත්වං කාලකතස්ස ජීවං පස්සිස්සසි පවිසන්තං වා නික්ඛමන්තං වාති? ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි -පෙ- විපාකොති, කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවං මෙ එත්ථ හොති: ඉතිපි -පෙ- විපාකොති.

---

28. (එවිට තෙරහු වදාරණසේක්:) එසේ වී නම් මේ කරුණෙහි ලා තාම විචාරන්නෙමි. යම් පරිද්දකින් තට වැටහේ නම් එපරිද්දෙන් එය ප්‍රකාශ කරන්නෙහිය, රාජන්‍යය! තුඹ දිවාසයනයට හෙවත් දහවල් නිදීමට පැමිණියේ සිත්කලු උයන් ද, සිත්කලු වනයන් ද සිත්කලු භූමි ද සිත්කලු පොකුණු ද සිහිනයෙන් දුටුවා සිහි ඇත්තෙහි ද හෙවත් මතක ඇත්තෙහි දැ?යි ඇසූහ. එකල්හි රාජන්‍ය තෙමේ: භවත් කාශ්‍යපය! මම දිවා සයනයට පැමිණියෙම් සිත්කලු උයන් ද එබඳු වූම වනයන් ද භූමිභාගයන් ද පොකුණු ද සිහිනයෙන් දැක්කා සිහි ඇත්තෙමි යි කීය. ඒ කාලයෙහි කුදියෝ ද මිටි ස්ත්‍රීහු ද ලඳුරියෝ ද, තරුණ දැරිකාවෝ ද, තා රක්‍ෂා කෙරෙද්දැ යි තෙරනු පිළිවිසූහ. පින්වත් කාශ්‍යපය! එසේය, ඒ කාලයෙහි කුදියෝ ද මිටි ස්ත්‍රීහු ද බාල දැරිකාවෝ ද තරුණ දැරිකාවෝ ද මා රක්‍ෂා කෙරෙත් යයි රාජන්‍ය තෙමේ පිළිතුරු දින. ඒ ස්ත්‍රීහු ඇතුළට පිවිසෙන්නා වූ හෝ පිටතට නික්මෙන්නා වූ හෝ තාගේ ජීවය දකිද්දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! මෙය නො වන්නේම යයි කීය. රාජන්‍යය! ජීවත්වන්නා වූම ඒ ස්ත්‍රීහු ජීවත්වන්නා වූම තාගේ පිවිසෙන්නා වූ ද නික්මෙන්නා වූ ද ජීවය ඉදින් නො දක්නාහු නම්, කිමෙක් ද? තුඹ කාලක්‍රියා කළ තැනැත්තෙකුගේ ඇතුළට පිවිසෙන්නා වූ ද පිටතට නික්මෙන්නා වූ ද ජීවය දක්නෙහි ද, නො දක්නෙහිම ය. රාජන්‍යය! මේ කාරණයෙන් ද තට පර

29. අත්ථි පන රාජඤ්ඤ පරියායො -පෙ- අත්ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති: අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. ත්‍යාහං එවං වදාමි. තෙනහි භො ඉමං පුරිසං ජීවන්තං යෙව තුලාය තුලෙත්වා ජියාය අනස්සාසකං මාරෙත්වා පුනදෙව තුලාය

ලොවක් -පෙ- විපාක ඇතැයි මෙසේ සිතක් ඇතිවිය යුතු යයි පැවසූ සේක. එවිට ද රාජන්‍යතෙමේ, පින්වත් කාශ්‍යපයන් වහන්සේ කිසි කරුණක් අනුව මෙසේ වදාරති. එසේ වුව ද මේ කරුණෙහිදීත් පරලොවෙක් -පෙ- විපාක නැතැයි කියාම මට අදහස් වේ යයි කීය.

(පරලොකාදිය ඇත් නම් මැරෙන්නවුන්ගේ ජීවය පිට වී යනු දක්ක යුතු බවත්, නමුත් එසේ නො දක්නාබවත් පායාසි රාජන්‍යයා තවත් කරුණක් ලෙස දැක්විය. හෙතෙමේ ජීවය ලෙස ගත්තේ චිත්තාචාර යයි හෙවත් සිතේ හැසිරීමයි. නිදන් නවුන් සිහිනෙන් නොයෙක් දෙස ගමන් කරණ නමුත් ඔවුන් ගෙන් පිට වී යන ජීවයක් නො දක්නාසේ ම මැරෙන්නවුන් ගෙන් ද පිට වී යන ජීවයක් නො පෙණෙන බව වදාරා පරලොකා දිය ඇති බවම තෙරුන් වහන්සේ වදාළ නමුත් හෙතෙමේ නො පිළිගත්තේය.)

29. (නැවතද තෙරණුවෝ:) රාජන්‍යය! තට පරලෙව් ආදිය නැතැයි සිතෙන තවත් කරුණක් ඇත්තේ දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! එබඳු තවත් කරුණක් ඇත්තේ යයි පිළිතුරු දිත. ඒ කෙබඳු කරුණෙක් දැයි පිළිවිසූහ. එවිට රාජන්‍ය තෙමේ- පින් වත් කාශ්‍යපය! මෙහි මාගේ මෙහෙකරු පුරුෂයෝ අපරාධ කරණසුලු වූ සොරෙකු අල්වා ගෙණ විත්, ස්වාමිනි! මේ තෙමේ තමුන්නාන්සේගේ අණට විරුද්ධව අපරාධ කරණ සොරෙකි. මොහුට යම් දඬුවමක් කරණු කැමැත්තනු නම් එය පණවන සේක්වා යි කියා මට දක්වති. එකල්හි මම ඔවුන්ට, එසේ වී නම් පින්වතුනි! ජීවත්වන්නා වූ ම මේ පුරුෂයා තරාදියෙන් කිරා දුනු දියෙන් බෙල්ල වෙළා ආශ්වාස නැතිකොට මරා නැවතත් තරාදියෙන් කිරව් යයි මෙසේ කියමි. ඔහු මාගේ වචනය මැනවැයි පිළිගෙණ ජීවත්වන්නා වූ ම ඒ පුරුෂයා තරාදියෙන් කිරා දුනුදියෙන් බෙල්ල වෙළා ආශ්වාස හිර කොට මරා නැවතත් තරාදියෙන් කිරති. යම් කාලෙක්හි හෙතෙමේ ජීවත්

තුලෙථාති. තෙ මෙ සාධූති පටිස්සුත්වා තං පුරිසං ජීවන්තංයෙව -පෙ- තුලෙන්ති, යදා සො ජීවති තදා ලහුතරෙ හොති මුදුතරො ච කම්මඤ්ඤතරො ච. යදා පන සො කාලකතො හොති- තදා ගරුතරො ච හොති පත්ථින්නතරො ච අකම්මඤ්ඤතරො ච. අයම්පි ඛො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි -පෙ- විපාකොති.

30. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමාය -පෙ- ආජානන්ති. සෙය්‍යථාපි රාජඤ්ඤ පුරිසො දිවසං සන්තත්තං අයොගුළං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං තුලාය තුලෙය්‍ය. තමෙනං අපරෙන සමයෙන සීතං නිබ්බුතං තුලාය තුලෙය්‍ය. කදා නු ඛො සො අයොගුළො ලහුතරෙ වා හොති මුදුතරෙ වා කම්මඤ්ඤතරෙ වා? යදා වා ආදිත්තො සම්පජ්ජලිතො සජොති

වේ ද, එකල්හි ඉතා සැහැල්ලු වූයේ ද, ඉතා මෘදු වූයේ ද, ඉතා කර්මණ්‍ය වූයේ ද වෙයි. යම් කලෙක්හි වනාහි හෙතෙමේ කාලක්‍රියා කළේ වේ ද, එකල්හි අතිශයින් බර වූයේ ද, අතිශයින් තද වූයේ ද, අතිශයින් අකර්මණ්‍ය වූයේ ද වෙයි. භවත් කාශ්‍යපය! යම් කරුණකින් මට පරලොවක් -පෙ- විපාක නැතැයි අදහස් වේ ද, මේ ඊට නවත් කාරණයක් යයි කීය. (පායාසි රාජන්‍ය තෙමේ මෙයින් කුමක් දක්වා ද යත්? ජීවත් වන සත්ත්‍වයාගේ ස්කන්ධ පස්කැයි තමුන්නාන්සේ කියන්නනුය. චුත වන කාලයෙහි රූපස්කන්ධය පමණක්ම ඉතිරි වන්නේය. ස්කන්ධයන් තුන්දෙනෙක් නො පවතින්නාහු වෙති. විඥානස්කන්ධය පහව යෙයි. එබැවින් ඉතිරි වූ හුදකලා රූපස්කන්ධය සැහැල්ලු විය යුතුය. නමුත් එසේ නොව වඩාත් බර වූයේම වෙයි. එහෙයින් කොතැන්හි වත් යන කිසිවෙක් නැත්තේය යන මේ කාරණය දක්වයි.)

30. එවිට තෙරනු: එසේ වී නම් රාජන්‍යය! තට උපමාවක් කරන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැනගණිත්. රාජන්‍යය! යම්සේ පුරුෂයෙක් දවස මුළුල්ලෙහි තැවුනා වූ, හාත්පසින් ඇවිල ගත්තා වූ, මනාකොට දිලිසෙන්නා වූ, එකම ගිනි ජලාවක් වැනි වූ ය(කඩ)ගුළියක් තරාදියෙන් කිරන්නේ නම් නැවත පසු කලෙක්හි සිහිල් වූ, නිවුනා වූ, ඒ මේ යගුළිය තරාදියෙන් කිරන්නේ නම් කවර කලෙක්හි වනාහි ඒ යගුළිය අතිශයින් සැහැල්ලු වූයේත් අතිශයින් මොලොක් වූයේත් අතිශයින් කර්මණ්‍ය වූයේත් වේ ද, යම් කලෙක්හි හාත්පසින් ඇවිලගත්තේ මොනවට දිලිසුනේ එකම ගිනි ජලාවක් වැනි වූයේ වේ නම්

භූතො, යදා වා සීතො නිබ්බුතො හොති? යදා සො භො කස්සප අයොගුළො තෙජොසහගතො ච හොති වායොසහගතො ච ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, තදා ලහුතරො ච හොති මුදුතරො ච කම්මඤ්ඤතරො ච. යදා ච පන සො අයොගුළො නෙව තෙජොසහගතො හොති න වායොසහගතො සීතො නිබ්බුතො, තදා ගරුතරො ච හොති පත්ථින්නතරො ච අකම්මඤ්ඤතරො චාති. එවමෙව ඛො රාජඤ්ඤ යදා'යං කායො ආයුසහගතො ච උස්මාසහගතො ච විඤ්ඤාණසහගතො ච, තදා ලහුතරො ච හොති මුදුතරො ච කම්මඤ්ඤතරො ච. යදා පනායං කායො නෙව ආයුසහගතො හොති න උස්මාසහගතො න විඤ්ඤාණසහගතො, තදා ගරුතරො ච හොති පත්ථින්නතරො ච අකම්මඤ්ඤතරො ච. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි -පෙ- විපාකොති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ. අථ ඛො එවං මෙ එත්ථ හොති: ඉතිපි -පෙ- විපාකොති.

එකල්හි ද? එසේ නොව යම් කලෙක්හි සිහිල්වූයේ නිවුනේ වේ නම් එකල්හි දැයි විචාළහ. පින්වත් කාශ්‍යපය! යම් කලෙක ඒ යගුළිය තෙජසින් යුක්ත වූයේ වේ ද, වාතයෙන් යුක්ත වූයේ වේ ද, හාත්පසින් ඇවිලගත්තේ වේ ද, මනාකොට ඇවිලුනේ ද, එකම ගිනිජලාවක් වැනි වූයේ ද, එකල්හි ඉතා සැහැල්ලු වූයේත්, ඉතා කර්මණ්‍ය වූයේත් වන්නේය. යම් කලෙක වනාහි ඒ යගුළිය තෙජසින් යුක්ත වූයේ නො වේ ද, වාතයෙන් යුක්ත වූයේ නො වේ ද, සිහිල් වූයේ ද, නිවුනේ ද, එකල්හි ඉතා බර වූයේත්, ඉතා තද වූයේත්, ඉතා අකර්මණ්‍ය වූයේත් වන්නේ යයි පිළිතුරු දීන. එවිට තෙරණුවෝ; රාජන්‍යය! එපරිද්දෙන්ම මේ ශරීරය යම් කලෙක ආයුෂයෙන් යුක්ත වූයේ උණුසුමින් යුක්ත වූයේ විඥාන යෙන් යුක්තවූයේ වේ ද, එකල අතිශයින් ලඝු වූයේත් අතිශයින් මෘදු වූයේත් අතිශයින් කර්මණ්‍ය වූයේත් වෙයි. යම් කලෙක වනාහි මේ ශරීරය ආයුෂයෙන් යුක්තවූයේ නො වේ ද, උණු සුමින් යුක්ත වූයේ නො වේ ද, විඥානයෙන් යුක්ත වූයේ නො වේ ද, එකල්හි ඉතා බර වූයේත් ඉතා තද වූයේත් ඉතා අකර්මණ්‍ය වූයේත් වෙයි. රාජන්‍යය! මේ කාරණයෙන් ද පරලොවෙක් -පෙ- විපාක ඇත්තාහයි මෙසේ සිතක් තුඹට ඇතිවිය යුතු යයි වදාළහ. එකල්හි ද රාජන්‍ය තෙමේ, කිසිසේත් භවත් කාශ්‍යපයෝ මෙසේ කියති. එසේ වුව ද පරලොවෙක් -පෙ- නැතැයි කියාම මේ කාරුණෙහිලා මට අදහස් වේ යයි කීය. (මෙසේ මෙයින් ද පායාසිරාජන්‍යයාගේ නාස්තික දෘෂ්ටිය අත් හැරවිය නො හැකි විය)

31. අත්ථි පන රාජඤ්ඤ පරියායො -පෙ- අත්ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති: අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. ත්‍යාහං එවං වදාමි: තෙන හි භො ඉමං පුරිසං අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහාරුඤ්ච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච ජීවිතා වොරොපෙථාති. තෙ මෙ සාධූති පටිස්සුත්වා තං පුරිසං අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහාරුඤ්ච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච ජීවිතා වොරොපෙන්ති. යදා සො ආමතො හොති, ත්‍යාහං එවං වදාමි: තෙන හි භො ඉමං පුරිසං උත්තානං නිපාතෙථ, අප්පෙව නාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. තෙ තං පුරිසං උත්තානං නිපාතෙන්ති, නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං පස්සාම.

32. ත්‍යාහං එවං වදාමි: තෙන හි භො ඉමං පුරිසං අවකුජ්ජං නිපාතෙථ, පස්සෙන නිපාතෙථ, දුතියෙන පස්සෙන නිපාතෙථ

---

31. නැවත තෙරණුවෝ: රාජන්‍යය! මේ කාරණයෙන් ද පරලෙව් ආදිය නැත්තේ යයි සිතෙන තවත් කරුණක් ඇත්තේ දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! එබඳු තවත් කරුණක් ඇත්තේ යයි පිළිතුරු දීහ. ඒ කෙබඳු කරුණක් දැයි විමසූහ. එවිට රාජන්‍ය තෙමේ, පින්වත් කාශ්‍යපය! මෙහි මාගේ මෙහෙකරු පුරුෂයෝ අපරාධ කරණසුලු වූ සොරෙකු අල්වා ගෙණ විත්, දෙවයන් වහන්ස! මේ තෙමේ අපරාධ කරණසුලු සොරෙකි. මොහට යම් කිසි දඬුවමක් කරණු කැමැත්තහු නම් එය කරණසේක්වායි කියා මට දක්වති. එකල්හි මම ඔවුන්ට එසේ වී නම් පින්වතුනි! මේ පුරුෂයා සිවිය ද, හම ද, මස් ද, නහර ද, ඇට ද, ඇටමිදුලු ද විනාශ නො කොට ජීවිතයෙන් තොර කරව් යයි මෙසේ කියමි. ඔහු ද මාගේ වචනය එසේ යයි පිළිගෙණ සිවිය ද, සම ද, මස් ද, නහර ද, ඇට ද, ඇටමිදුලු ද විනාශ නො කොට ඒ පුරුෂයා ජීවිතයෙන් තොර කෙරෙති. යම් කලෙක්හි හේ මැරෙන්ට පටන් ගත්තේ හෙවත් අඩක් මළේ වේ ද, එකල්හි මම ඔවුන්ට එසේ නම් පින්වතුනි! මේ පුරුෂයා උඩුකුරු කොට හෙලව්. නික්මෙන්නා වූ මොහුගේ ජීවය දක්නෙමු නම් ඉතා යෙහෙකැයි මෙසේ කියමි. ඔහු ද එසේ ඒ පුරුෂයා උඩුකුරු කොට හෙලති. එහෙත් අපි ඔහුගේ නික්මෙන්නා වූ ජීවය නොම දකුම්හ.

32. එකල්හි මම ඔවුන්ට මෙසේ කියමි. එසේ වී නම් පින්වතුනි! ඒ පුරුෂයා යටිකුරු කොට (මුණින්) හෙලව්, පාර්ශ්වයකින් හෙලව්, දෙවෙනි පාර්ශ්වයෙන් හෙලව්, උඩුකුරු (කෙලින්)

උද්ධං ඨපෙථ ඔමුඛකං ඨපෙථ පාණිනා ආකොටෙථ ලෙඩ්ඩුනා ආකොටෙථ දණ්ඩෙන ආකොටෙථ සත්ථෙන ආකොටෙථ ඔධුනාථ සන්ධුනාථ නිද්ධුනාථ, අප්පෙවනාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. තෙ තං පුරිසං ඔධුනන්ති සන්ධුනන්ති නිද්ධුනන්ති, නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං පස්සාම. තස්ස තදෙව චක්ඛු හොති තෙ රූපා තඤ්චායතනං නප්පටිසංවෙදෙති, තදෙව සොතං හොති තෙ සද්දා තඤ්චායතනං නප්පටිසංවෙදෙති, තදෙව ඝාණං හොති තෙ ගන්ධා තඤ්චායතනං නප්පටිසංවෙදෙති, සා යෙව ජිව්හා හොති තෙ රසා තඤ්චායතනං නප්පටිසංවෙදෙති, සොව කායො හොති තෙ ඵොට්ඨබ්බා තඤ්චායතනං නප්පටිසංවෙදෙති. අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති: ඉතිපි නත්ථි පරෝ ලොකො, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති.

33. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමාය -පෙ ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො සඞ්ඛධමො සඞ්ඛං ආදාය පච්චන්තිමං ජනපදං අගමාසි. සො යෙනඤ්ඤ

කොට තබව්, හිස යටිකුරු කොට තබව්, අතින් ගසව්, කැටයෙන් ගසව්, දණ්ඩෙන් ගසව්, ආයුධයෙන් ගසව්, මැනට පෙරලව්, ඈතට පෙරලව්, ඔබ මොබ පෙරලව්,(එසේ කොට වත්)මොහුගේ නික්මෙන්නාවූ ජීවය දක්නමෝ නම් ඉතා යහපතැයි කියායි ඔහු ද ඒ පුරුෂයා මැනට පෙරලත්, ඈතට පෙරලත්, ඔබ මොබ පෙරලත්. එසේ ද අපි ඔහුගේ නික්මෙන්නා වූ ජීවය නොම දකුම්හ. ඔහට ඒ ඇසම වෙයි, ඒ රූපයෝ වෙත්, නමුත් ඒ ඇස ඒ රූපායතනය නො දකියි. ඒ ශ්‍රොත්‍රය (=කණ) වෙයි, ඒ ශබ්දයෝ වෙත්, ඒ ශ්‍රොත්‍රය ඒ ශබ්දායතනය නො අසයි. ඒ නාසය වෙයි, ඒ ගන්ධයෝ වෙත්, ඒ නාසය ඒ ගන්ධායතනය ආඝ්‍රාණය නො කෙරෙයි. ඒ දිවම වෙයි, ඒ රසයෝ වෙත්, ඒ දිව ඒ රසායතනය ආස්වාදනය නො කෙරෙයි. ඒ කායම වෙයි, ඒ ස්ප්‍රෂ්ටව්‍යයෝ වෙත්, ඒ ශරීරය ඒ ස්පර්ශායතනය ස්පර්ශ නො කෙරෙයි. භවත් කාශ්‍යපය! යම් කරුණකින් මට පරලොවෙක් -පෙ- විපාක නැත්තාහයි කල්පනා වේ ද, මේ ද එක් කරුණ කැයි කීය.

33. (එවිට තෙරුන් වහන්සේ වදාරණසේක්:) රාජන්‍යය එසේ වී නම් තට උපමාවක් කරන්නෙමි. උපමාවෙන් ද -පෙ- දන ගණිත්. එහෙයින් පෙර වූවක් කියමි. රාජන්‍යය! එක්තරා

තරො ගාමො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මජ්ඣෙ ගාමස්ස ඨිතො තික්ඛත්තුං සඞ්ඛං උපලාපෙත්වා සඞ්ඛං භූමියං නික්ඛිපිත්වා එකමන්තං නිසීදි. අථ ඛො රාජඤ්ඤ තෙසං පච්චන්තජනපද මනුස්සානං එතදහොසි: අම්භො කස්ස නු ඛො එසො සද්දො එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං බන්ධනීයො එවං මුච්ඡනීයොති? සන්නිපතිත්වා තං සඞ්ඛධමං එතදවොචුං: අම්භො කස්ස නු ඛො එසො සද්දො එවං රජනීයො -පෙ- එවං මුච්ඡ නීයොති? එසො ඛො භො සඞ්ඛො නාම යස්සෙසො සද්දො එවං රජනීයො -පෙ- මුච්ඡනීයොති. තෙ තං සඞ්ඛං උත්තානං නිපා තෙසුං: වදෙහි භො සඞ්ඛ, වදෙහි භො සඞ්ඛාති. නෙව ඛො සඞ්ඛො සද්දමකාසි. තෙ තං සඞ්ඛං අවකුජ්ජං නිපාතෙසුං පස්සෙන නිපාතෙසුං දුතියෙන පස්සෙන නිපාතෙසුං උද්ධං ඨපෙසුං ඔමුද්ධ කං ඨපෙසුං පාණිනා ආකොටෙසුං ලෙඩ්ඩුනා ආකොටෙසුං දණ්ඩෙන ආකොටෙසුං සත්ථෙන ආකොටෙසුං ඔධුනිංසු සන්ධුනිංසු නිද්ධුනිංසු: වදෙහි භො සඞ්ඛ, වදෙහි භො සඞ්ඛාති. නෙව සො සඞ්ඛො සද්දමකාසි.

සක්පිඹින්නෙක් සකක් ගෙණ පිටිසර පලාතකට ගියේය. එසේ ගිය හෙතෙමේ එක්තරා ගමකට පැමුණුනේය. පැමිණ ගම මැද සිටියේ තුන් වරක් සක පිඹ එය බිම තබා එකත්පසෙක හුන්නේය. එකල්හි වනාහි රාජන්‍යය! ඒ පසල් දනවු වැසි මිනිසුන්ට මෙසේ අදහසෙක් විය. කෙසේ ද යත්? පින්වත්නි! මෙසේ සිත් ඇලවිය යුතු වූ, මෙසේ කැමති විය යුතු වූ, මෙසේ මත්වියයුතු වූ මෙසේ බැඳියයුතු වූ, මෙසේ මුසපත් විය යුතු වූ, මේ ශබ්දය තෙමේ කවරෙකුගේ ද්‍යෙ? යනුයි. නැවත ඒ ගම්වැසි මිනිස්සු රැස්ව, ඒ සක් පිඹින්නාට "පින්වත! මෙසේ සිත් ඇලවියයුතු වූ -පෙ- මුසපත් වියයුතු වූ මේ ශබ්දය කාගේද"යි මෙසේ කීහ. එකල හෙතෙමේ, පින්වත්නි! යමෙකුගේ මේ ශබ්දය මෙසේ සිත් ඇලවියයුත්තේ -පෙ- මුසපත් විය යුත්තේ වේ ද, ඒ මේ සක් ගෙඩියේ ශබ්ද යයි කීයේය. එවිට ඒ මිනිස්සු, භවත් ශඞ්ඛය! කථා කරව, භවත් ශඞ්ඛය! කථාකරවයි කියා ඒ සක උඩුකුරු කොට හෙලූහ. එහෙත් ඒ සක ශබ්ද නො කෙලේය. නැවත ඒ මිනිස්සු එසේම කියා ඒ සක යටිකුරු කොට (මුණින්) හෙලූහ. පාර්ශ්වය කින් හෙලූහ. අනික් පාර්ශ්වයෙන් හෙලූහ. උඩුපැත්තට තැබූහ යටිපැත්තට තැබූහ. අතින් ගැසූහ. කැටයෙන් ගැසූහ. දණ්ඩෙන් ගැසූහ. ආයුධයෙන් ගැසූහ. මැතට පෙරලූහ. එකල් හිද ඒ සක ශබ්ද නො කෙළේමය.

34. අථ ඛො රාජඤ්ඤ තස්ස සඞ්ඛධමස්ස එතදහොසි: යාව බාලා ඉමෙ පච්චන්තජනපදමනුස්සා. කථං හි නාම අයොනිසො සඞ්ඛසද්දං ගවෙසිස්සන්තීති. තෙසං පෙක්ඛමානානං සඞ්ඛං ගහෙත්වා තික්ඛත්තුං සඞ්ඛං උපලාපෙත්වා සඞ්ඛං ආදාය පක්කාමි. අථ ඛො රාජඤ්ඤ තෙසං පච්චන්තජනපදානං මනුස්සානං එතදහොසි: යදා කිර භො අයං සඞ්ඛො නාම පුරිසසහගතො ච වායාම සහගතො ච වායුසහගතො ච, තදායං සඞ්ඛො සද්දං කරොති යදා පනායං සඞ්ඛො නෙව පුරිසසහගතො හොති. න වායාමසහගතො න වායුසහගතො, තදා නායං සඞ්ඛො සද්දං කරොතීති. එවමෙව ඛො රාජඤ්ඤ යදායං කායො ආයු -පෙ- සහගතො ච, තදා අභික්කමතිපි පටික්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති, චක්ඛුනාපි රූපං පස්සති, සොතෙනපි සද්දං සුණාති ඝාණෙනපි ගන්ධං ඝායති, ජිව්හායපි රසං සායති, කායෙනපි ඵොට්ඨබ්බං ඵුසති, මනසාපි ධම්මං විජානාති. යදා පනායං කායො නෙව ආයු -පෙ- සහගතො ච, තදා නෙව අභික්කමති න පටික්කමති න තිට්ඨති න නිසීදති න සෙය්‍යං කප්පෙති, චක්ඛුනාපි රූපං

---

34. රාජන්‍යය! ඉක්බිති වනාහි ඒ සක් පිඹින්නාට "මේ පිටිසර පලාත්වැසි මිනිස්සු කොපමණ අඥයෝ ද? කෙසේ නම් ඔහු නුනුවණින් සක් හඬ සොයන්නාහුද?"යි මෙසේ සිතෙක් විය. එසේ සිතා ඔවුන් බලා සිටිද්දීම සක ගෙණ තුන් වරක් පිඹ තැවිත එය ගෙණ ගියේය. එකල්හි වූකලී රාජන්‍යය! ඒ පසල්දනවු වැසි මිනිසුන්ට මෙසේ අදහස් විය. පින්වතුනි! යම් විටෙක මේ සඞ්ඛ නම් භාණ්ඩය තෙමේ පුරුෂයෙකුගෙන් යුක්ත වූයේ වේ ද, වෑයමින් යුක්ත වූයේ වේ ද, වාතයෙන් යුක්ත වූයේ වේ ද, එකල්හි ශබ්ද කෙරෙයි. යම් විටක වනාහි මෙය පුරුෂයෙකුගෙන් යුක්ත වූයේ නො වේ ද, වෑයමින් යුක්ත වූයේ නො වේ ද, වාතයෙන් යුක්ත වූයේ නො වේ ද එකල්හි ශබ්ද නො කෙරෙයි කියායි. එපරිද්දෙන්ම රාජන්‍යය! යම් කලෙක මේ ශරීරය ආයුෂයෙන් -පෙ- යුක්ත වූයේ වේ ද, එකල ඉදිරියට ද යෙයි. ආපසු ද එයි, සිටිම ද කෙරෙයි, හිඳීම ද කෙරෙයි. සයනය ද කෙරෙයි, ඇසින් ද රූප දකී, කණින් ශබ්ද ද අසයි. නාසයෙන් ගන්ධය ද ආඝ්‍රාණය කෙරේ, දිවෙන් රස ද විඳගණී. කයින් ස්‍ප්‍රෂ්ටව්‍යය ද ස්පර්ශ කෙරේ, සිතින් ධර්මය ද දැනගණී, යම් කලෙක වනාහි මේ ශරීරය ආයුෂයෙන් -පෙ- යුක්ත වූයේ නො වේ ද, එකල ඉදිරියට ද නො යයි, ආපසු ද නො එයි, සිටිම ද නො කෙරේ, හිඳීම ද නො කෙරේ,

න පස්සති, සොතෙනපි සද්දං න සුණාති, ඝාණෙනපි ගන්ධං න ඝායති, ජිව්හායපි රසං න සායති, කායෙනපි ඵොට්ඨබ්බං න ඵුසති, මනසාපි ධම්මං න විජානාති, ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු: ඉතිපි -පෙ- විපාකොති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවමෙව එත්ථ හොති: ඉතිපි -පෙ- විපාකොති.

35. අත්ථි පන රාජඤ්ඤ පරියායො -පෙ- අත්ථි භො කස්සප පරියායො -පෙ- යථා කථං විය රාජඤ්ඤාති? ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. ත්‍යාහං එවං වදාමි: තෙන හි භො ඉමස්ස පුරිසස්ස ජීවං ජහථ, අප්පෙව නාමස්ස ජීවං පස්සෙය්‍යාමාති. තෙ තස්ස පුරිසස්ස ජීවං ජහන්ති

හිඳිම ද නො කෙරේ, සයනය ද නො කෙරේ, ඇසින් රූ නො දකී, කණින් ශබ්ද නො අසයි, ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණය නො කෙරේ, දිවෙන් රස නො විඳි, කයින් ස්‍ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ නො කෙරේ, සිතින් ධර්ම දැන නොගණී. එසේ හෙයින් රාජන්‍යය! මේ කාරණයෙන් ද තට පරලොවෙක් -පෙ- විපාක ඇත්තාහ යි මෙසේ සිතක් ඇතිවිය යුතු යයි පැවසූහ. එකල්හි ද රාජන්‍ය තෙමේ පින්වත් කාශ්‍යපයෝ කිසි කරුණක් සලකා මෙසේ කියති. එසේ ද වුවත් මේ කරුණෙහි ලාද මට පරලොවෙක් -පෙ- නැත්තාහ යි කියාම අදහස් වේ යයි කීය. (මෙසේ කුමාර කාශ්‍යපස්ථවිරයන් වහන්සේ පායාසිරාජන්‍යයාගේ ඒ තර්කය ද බිඳ දැමූ නමුත් හෙතෙමේ ස්වකීය දෘෂ්ටිය එසේම ගත්තේය.)

35. (නැවතත් තෙරුන් වහන්සේ,)රාජන්‍යය! තවත් මෙබඳු කරුණක් ඇත්තේදැ?යි විචාළ කල එසේ යයි පිළිතුරු දී එය ද විස්තර කරණ රාජන්‍ය තෙමේ, පින්වත් කාශ්‍යපය! මෙහි මාගේ මෙහෙකාර පුරුෂයෝ අපරාධ කරණසුලු වූ සොරෙකු අල්වා ගෙණවුත්, දෙවයන් වහන්ස! මේ තොම තුඹ වහන්සේගේ අණට විරුද්ධව අපරාධ කරණ සොරෙකි, මොහට යම්කිසි දඬුවමක් කරණු කැමැත්තහු නම් එය පණවන සේක්වා යි කියා මට පෙන්වති.එකල්හි මම ඔවුන්ට, එසේ නම් පින්වතුනි! මේ පුරුෂයාගේ සිවිය සිඳිව්, එසේ කල මොහුගේ ජීවය දක්නෙමු නම් ඉතා යෙහෙකැයි මෙසේ කියමි. ඔහු ද එසේ ඒ පුරුෂයාගේ සිවිය සිඳිති. එහෙත් අපි ඔහුගේ ජීවය නොම දකුම්හ. එකල්හි මම ඔවුන්ට– එසේ නම් පින්වතුනි! මේ පුරුෂ

නෙවස්ස මයං ජීවං පස්සාම. තස්සාහං එවං වදාමි. තෙන හි භො ඉමස්ස පුරිසස්ස චම්මං ඡින්දථ. මංසං ඡින්දථ නහාරුං ඡින්දථ අට්ඨිං ඡින්දථ අට්ඨිමිඤ්ජං ඡින්දථ, අප්පෙව නාමස්ස ජීවං පස්සෙය්‍යාමාති. තෙ තස්ස පුරිසස්ස -පෙ- අට්ඨිමිඤ්ජං ඡින්දන්ති. නෙවස්ස මයං ජීවං පස්සාම අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. -පෙ- විපාකොති.

36. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමාය -පෙ- ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො අග්ගිකො ජටිලො අරඤ්ඤායතනෙ පණ්ණකුටියා වසති. අථ ඛො රාජඤ්ඤ අඤ්ඤතරො ජනපදෙ සත්ථො වුට්ඨාසි. අථ ඛො සො සත්ථො තස්ස අග්ගිකස්ස ජටිලස්ස අස්සමස්ස සාමන්තා එකරත්තිං වසිත්වා පක්කාමි. අථ ඛො රාජඤ්ඤ තස්ස අග්ගිකස්ස ජටිලස්ස එතද හොසි. යන්නූනාහං යෙන සො සත්ථවාසො තෙනුපසඞ්කමෙය්‍යං,

---

යාගේ සම සිඳිව්, මස් සිඳිව්, නහර සිඳිව්, ඇට සිඳිව්, ඇට මිදුලු සිඳිව්, එසේ වත් මොහුගේ ජීවය දක්නෙමු නම් ඉතා යහපතැයි මෙසේ කීයමි. ඒ මෙහෙකරුවෝ ද එපරිද්දෙන්, ඒ පුරුෂයාගේ සම සිඳිත්, මස් සිඳිත්, නහර සිඳිත්, ඇට සිඳිත් ඇට මිදුලු සිඳිත්. එසේ ද අපි ඔහුගේ ජීවය නොම දකුමු. භවත් කාශ්‍යපය! යම් හෙයකින් මට පරලොවෙක් -පෙ- විපාක නැත් තාහ යි අදහස් වේ ද, මේ ද ඊට එක කරුණෙකැයි කීය.

36. (එවිට තෙරනු) එසේ වී නම් රාජන්‍යය! නුඹට උපමා වක් ගෙණ හැර දක්වන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැන ගණිත්. එබැවින් පෙර වූ කාරණයක් කියමි. රාජන්‍යය! එක්තරා ගිනි පුදන ජටිලයෙක් අරණ්‍යායතනයෙක හෙවත් වනයෙක කොළවලින් සෙවිලි කරණ ලද කුඩා ගෙයෙක වාසය කෙරෙයි. එකල්හි වනාහි රාජන්‍යය! ජනපදයෙක්හි එක්තරා වෙළඳ සමූහයෙක් නැගී සිටියේය. හෙවත් ගමනාරම්භ කෙළේය. ඉක්බිති ඒ වෙළඳ සමූහ තෙමේ ඒ ගිනි පුදන ජටිල යාගේ ආශ්‍රමය හෙවත් අසපුව සමීපයෙහි එක් රැයක් වාසය කොට ගියේය. රාජන්‍යය! ඉන් පසු ඒ ගිනි පුදන ජටිලයාට "ඉදින් මම ඒ වෙළඳ සමූහයා විසූ තැනට එළඹෙන්නෙම් නම්; මෙහි කිසි උපකරණයක් ලබන්නෙම් නම් එකාන්තයෙන් ඉතා යෙහෙකැ"යි මෙසේ සිතක් පහළ විය. ඉක්බිත්තෙන් ඒ ගිනි පුදන ජටිල තෙමේ කල් ඇතුවම (උදයම) නැගිට ඒ වෙළඳ සමූහයා විසූ පෙදෙස යම් දෙසක ද, එහි එළඹියේය. එසේ

අප්පෙව නාමෙත්ථ කිඤ්චි උපකරණං අධිගච්ඡෙය්‍යන්ති. අථ ඛො සො අග්ගිකො ජටිලො කාලස්සෙව වුට්ඨාය යෙන සො සත්ථවාසො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අද්දස තස්මිං සත්ථවාසෙ දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං ඡඩ්ඩිතං. දිස්වානස්ස එතදහොසි: න ඛො මෙතං පතිරූපං, යං මෙ පෙක්ඛමානස්ස මනුස්සභූතො කාලං කරෙය්‍ය, යන්නූනාහං ඉමං දාරකං අස්සමං නෙත්වා ආපාදෙය්‍යං පොසෙය්‍යං වඩ්ඪෙය්‍යන්ති. අථ ඛො සො අග්ගිකො ජටිලො තං දාරකං අස්සමං ආනෙත්වා ආපාදෙසි පොසෙසි වඩ්ඪෙසි.

37. **යදා සො දාරකො දසවස්සුද්දෙසිකො වා හොති ද්වාදසවස්සුද්දෙසිකො වා, අථ ඛො තස්ස අග්ගිකස්ස ජටිලස්ස ජනපදෙ කිඤ්චිදෙව කරණීයං උප්පජ්ජි. අථ ඛො සො අග්ගිකො ජටිලො තං දාරකං එතදවොච: ඉච්ඡාමහං තාත නගරං ගන්තුං. අග්ගිං තාත පරිචරෙය්‍යාසි, මා ච තෙ අග්ගි නිබ්බායි. සචෙ තෙ අග්ගි නිබ්බායෙය්‍ය, අයං වාසි ඉමානි කට්ඨානි, ඉදං අරණිසහිතං, අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යාසීති අථ ඛො සො අග්ගිකො**

එළඹ සිටි හෙතෙමේ ඒ ප්‍රදේශයෙහි දමන ලද උඩුකුරුව සයනය කරන්නා වූ කුඩා වූ ළදරු කුමාරයකු දුටුවේය. දැක මෙසේ කල්පනා කෙළේය. කෙසේ ද යත්? යම් හෙයකින් මෙහි මා බලා සිටියදී මිනිස් වූවෙක් කලුරිය කරන්නේ නම් එය මට සුදුසු නො වන්නේ මය. එබැවින් මම මේ ළදරුවා අසපුවට පමුණුවා ආපාදනය කරන්නෙම් නම් නොහොත් වයසට පමුණුවන්නෙම් නම් (ආහාර දීම් ආදියෙන්) පොෂණය කරන්නෙම් නම් වැඩිදියුණු කරන්නෙම් නම් ඉතා යහපතැයි කියායි. ඒ ජටිල තෙමේ එසේ කල්පනා කොට ඒ ළදරුවා සිය අසපුවට ගෙණ ගොස් නිපදවීය, පොෂණය කෙළේය. වැඩුවේය.

37. යම් කලෙක ඒ දරු තෙමේ දස හවුරුදු වයස් ඇත්තේ හෝ දොළොස් හවුරුදු වයස් ඇත්තේ හෝ වේ ද, එකල්හි ඒ ගිනි පුදන ජටිලයාට ජනපදයෙහි කිසියම් කටයුත්තෙක් උපන්නේය. ඉක්බිති ඒ ජටිලතෙම ඒ දරුවාට මෙසේ කීය. දරුව! මම නුවරට යනු කැමැත්තෙමි. දරුව තුඹ ගිනි පුදව, එසේම තුඹේ ගිනි නො නිවේවා, ඉදින් තුඹේ ගිනි නිවුනේ නම්: මේ වෑයය, මේ දරය, මේ ගිනි ගානා දඬු දෙකය. එයින් ගිනි උපදවා ගිනි පුදව, යනුයි. ඉන්පසු ඒ අග්ගික ජටිල තෙමේ ඒ දරුවාට මෙසේ අනුශාසනා කොට දනව්වට ගියේය. ක්‍රීඩාවෙහි යෙදුනා වූ ඒ දරුවාගේ ගිනි නිවුනේය. එකල්හි ඔහට මෙබඳු සිතෙක්

ජටිලො තං දරකං එවං අනුසාසිත්වා ජනපදං අගමාසි. තස්ස ඛිඩ්ඩාපසුතස්ස අග්ගි නිබ්බායි. අථ ඛො තස්ස දරකස්ස එතද හොසි. පිතා ඛො මං එවං අවච. අග්ගිං තාත -පෙ- පරිචරෙය්‍යාසි; යන්නූනාහං අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යන්ති. අථ ඛො සො දරකො අරණිසහිතං වාසියා තච්ඡි. අප්පෙවනාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙව සො අග්ගිං අධිගච්ඡි. අරණිසහිතං ද්විධා ඵාලෙසි, තිධා ඵාලෙසි චතුධා ඵාලෙසි. පඤ්චධා ඵාලෙසි, දසධා ඵාලෙසි සතධා ඵාලෙසි, සකලිකං සකලිකං අකාසි. සකලිකං සකලිකං කරිත්වා උදුක්ඛලෙ කොට්ටෙසි, උදුක්ඛලෙ කොට්ටෙත්වා මහාවාතෙ ඔපුණි. අප්පෙවනාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති, නෙව සො අග්ගිං අධිගච්ඡි.

38. අථ ඛො සො අග්ගිකො ජටිලො ජනපදෙ තං කරණීයං තීරෙත්වා, යෙන සකො අස්සමො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං දරකං එතදවොච: කච්චි තෙ තාත අග්ගි න නිබ්බුතොති? ඉධ මෙ තාත ඛිඩ්ඩාපසුතස්ස අග්ගි නිබ්බායි. තස්ස මෙ එතද හොසි: පිතා ඛො මං එවං අවච: අග්ගිං තාත -පෙ- පරිචරෙය්‍යා

විය. මාගේ පිය තෙමේ වනාහි "දරුව ගිනි -පෙ- පුදව" යි මට මෙසේ කීය. එබැවින් මම ගිනි උපදවා ගිනි පුදන්නෙම් නම් ඉතා යෙහෙක යනුයි. මෙසේ සිතා ඒ දරක තෙමේ ගිනි ලබන්නෙම් නම් යහපතැයි කියා ගිනි ගානා දඬු දෙක වෑයෙන් සැස්සේය. එහෙත් හෙතෙමේ ගිනි නොලද්දේය. ඉන් පසු හෙතෙමේ මෙසේ වත් ගිනි ලබන්නෙම් නම් යහපතැයි කියා ගිනි ගානා දඬු දෙක දෙකඩ කොට පැලුවේය. තුන්කඩ කොට පැලුවේය, සතර කඩ කොට පැලුවේය. පස්කඩ කොට පැලුවේය. දසකඩ කොට පැලුවේය. සියක් කඩ කොට පැලුවේය. කැබලි කැබලි කෙලේය. කැබලි කැබලි කොට වනෙහි ලා කෙටුවේය. වනෙහි ලා කොටා මහා වාතයෙහි පිඹ හැරියේය. එසේ ද හෙතෙමේ ගිනි නො ලද්දේමය.

38. ඉක්බිති ඒ ගිනි පුදන ජටිලතෙමේ ජනපදයෙහි ඒ කටයුත්ත නිරණය කොට හෙවත් අවසාන කොට ස්වකීය ආශ්‍රම යට එළඹුනේය. එළඹ ඒ දරුවාට– පුත්‍රය කිම? තාගේ ගිනි නො නිවුනේ දැයි මෙසේ කීය. එබසට ඒ දරකතෙම කියනුයේ; පියානනි! ක්‍රීඩා කිරීමෙහි නියුක්ත වූ මෙහි මාගේ ගිනි නිවුනේය. එකල්හි මට මෙසේ අදහස් විය. පිය තෙමේ වනාහි "පුත්‍රය! ගිනි -පෙ- පුදව"යි මට මෙසේ කීය. එබැවින් මම

සීති. යන්නූනාහං අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යන්ති. අථ ඛ්වාහං තාත අරණිසහිතං වාසියා තච්ඡිං: අප්පෙව නාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති, නෙවාහං අග්ගිං අධිගච්ඡිං. අරණිසහිතං ද්විධා ඵාලෙසිං, තිධා ඵාලෙසිං, චතුධා ඵාලෙසිං පඤ්චධා ඵාලෙසිං, දසධා ඵාලෙසිං, සතධා ඵාලෙසිං, සකලිකං සකලිකං අකාසිං, සකලිකං සකලිකං කරිත්වා උදුක්ඛලෙ කොට්ටෙසිං. උදුක්ඛලෙ කොට්ටෙත්වා මහාවාතෙ ඔපුණිං අප්පෙවනාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙවාහං අග්ගිං අධිගච්ඡින්ති.

39. අථ ඛො තස්ස අග්ගිකස්ස ජටිලස්ස එතදහොසි: යාව බාලො අයං දාරකො අබ්‍යත්තො, කථං හි නාම අයොනිසො අග්ගිං ගවෙසිස්සතීති: තස්ස පෙක්ඛමානස්ස අරණිසහිතං ගහෙත්වා අග්ගිං නිබ්බත්තෙත්වා තං දාරකං එතදවොච: එවං ඛො තාත අග්ගි නිබ්බත්තෙතබ්බො, නත්වෙව යථා ත්වං බාලො අබ්‍යත්තො අයොනිසො අග්ගිං ගවෙසීති. එවමෙව ඛො ත්වං

ගිනි උපදවා ගිනි පුදන්නෙම් නම් යෙහෙකැයි කියායි. පියානනි! ඉන් පසු මම මෙසේ ගිනි ලබන්නෙම් නම් යහපතැයි කියා ගිනි ගානා දඬු යුවල වෑයෙන් සැස්සෙමි. එහෙත් මම ගිනි නො ලද්දෙමි. තදනන්තරව මෙපරිද්දෙන් වත් ගිනි ලද හොත් යෙහෙකැයි කියා ඒ ගිනි ගානා දඬු යුවල දෙකට පැලුවෙමි. තුණට පැලුවෙමි. හතරට පැලුවෙමි. පහට පැලුවෙමි. දහයට පැලුවෙමි. සියයට පැලුවෙමි. කැබලි කැබලි කෙළෙමි. කැබලි කැබලි කොට වනෙහි ලා කෙටුවෙමි. වනෙහි ලා කොටා මහා වාතයෙහි පිඹ හැරියෙමි. නමුත් මම ගිනි නො ලද්දෙමි මය.

39. ඉක්බිති ඒ ගිනි පුදන ජටිලයාට “මේ දරු තෙමේ කොපමණ අඥාන ද? කොපමණ අව්‍යක්ත ද? කෙසේ නම් නුනුවණින් ගිනි සොයන්නේද!”යි මෙසේ සිතුණේය. එසේ සිති ඒ දරුවා බලා සිටියදීම ගිනි ගානා දඬු යුවලක් ගෙණ ගිනි උපදවා ඒ දරුවාට “පුත්‍රය! මෙපරිද්දෙන් ගිනි නිපදවිය යුතුය. අඥාන වූ අදක්‍ෂ වූ නුඹ යම් පරිද්දෙකින් ගිනි සෙව්වෙහි නම් එපරිද්දෙන් නොවේ” යයි මෙසේ කීය. රාජන්‍යය! එලෙසින්ම අඥාන වූ අදක්‍ෂ වූ නුඹ නුනුවණින් පරලොව සොයන්නෙහිය. රාජන්‍යය! ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටිය දුරුකරව, රාජන්‍යය! ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටිය දුරු කරව, තට බොහෝ කාලයක් මුළුල්ලෙහි මේ මිථ්‍යාදෘෂ්ටිය අහිත පිණිස දුක් පිණිස නොවේවායි (වදාළසේක.) එකල්හි රාජන්‍ය තෙමේ, භවත් කාශ්‍යපයෝ කියි

රාජඤ්ඤ බාලො අබ්‍යත්තො අයොනිසො පරලොකං ගවෙසිස්සසි පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං, රාජාපි මං පසෙනදි කොසලො ජානාති තිරො රාජානොපි: පායාසි රාජඤ්ඤො එවං වාදී එවං දිට්ඨී: ඉතිපි -පෙ- විපාකොති. සචාහං භො කස්සප ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිස්සාමි, භවිස්සන්ති මෙ වත්තාරො: යාව බාලො පායාසි රාජඤ්ඤො අබ්‍යත්තො දුග්ගහිතගාහීති කොපෙනපි තං හරිස්සාමි, මක්ඛෙනපි තං හරිස්සාමි පලාසෙනපි තං හරිස්සාමීති

කරුණක් සලකා මෙසේ වදාරති. එසේ ද වුවත් මේ ලාමක දෘෂ්ටිය දුරුකරන්ට නො හැක්කෙමි මය. පායාසිරාජන්‍ය තෙමේ, මේ කාරණයෙන් ද පරලොවක් -පෙ- විපාක නැත්තාහ''යි මෙසේ කියන්නෙක, මෙසේ දෘෂ්ටි ඇත්තෙකැයි පසේනදි කොසොල් රජතෙමේ ද මා ගැණ දනී. එසේම පිටරටවල රජවරු ද දනිති. පින්වත් කාශ්‍යපය! ඉදින් මම මේ ලාමක දෘෂ්ටිය අත්හරින්නෙම් නම්; "පායාසි රාජන්‍ය තෙමේ කොප මණ අඥනයෙක් ද? අදක්‍ෂයෙක් ද? වරදවා සලකන ලද්ද ගන්නාසුලු වූවෙක්ද''යි මට මෙසේ කියන්නෝ වන්නාහ. (එබැවින් යම් කෙනෙක් මට එසේ කියද් ද, ඔවුන් කෙරෙහි උපදනා) කොපය හේතු කොට ගෙණ ද මම මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි. (එසේම තමුන්නාන්සේ විසින් කියන ලද යහපත් කාරණයන් මකා දැමීම ලක්‍ෂණ කොට ඇති) මක්‍ෂ ගුණයෙන් ද මම මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි. (තමුන්නාන්සේ සමග යුගග්‍රාහය හෙවත් සම බැව්හි සිටීම ලක්‍ෂණ කොට ඇති) පලාසය හෙතුකොට ගෙණ ද මම මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමියි කීය.

(මෙහි පායාසිරාජන්‍ය තෙමේ කුමාර කාශ්‍යපයන් වහන්සේගේ අදහස් යහපත් ලෙස පිළිගන්නා බවත්, තමුන් රට වැස්සාගෙන් ලැබෙන දොස්වලට බියෙන් හා ඒ දොස් කියන්නවුන් කෙරෙහි උපදනා කෝපයට බියෙන් ද, තමන් කෙරෙහි පවත්නා මක්ඛපලාස ආදී දුර්ගුණයන් නිසා ද ස්වකීය දෘෂ්ටිය එසේම ගන්නා බව දැක්විය. එවිට තෙරනු මෙසේ වදාරති.)

40. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමාය -පෙ- ආජානන්ති භූතපුබ්බං රාජඤ්ඤ මහාසකටසත්ථො සකටසහස්සං පුරත්ථිමා ජනපදා පච්ඡිමං ජනපදං ආගමාසි. සො යෙන යෙන ගච්ඡති, ඛිප්පමෙව පරියාදියති තිණකට්ඨොදකං හරිතකපණ්ණං තස්මිං ඛො පන සත්ථෙ වෙ සත්ථවාහා අහෙසුං, එකො පඤ්චන්නං සකටසතානං එකො පඤ්චන්නං සකටසතානං. අථ ඛො තෙසං සත්ථවාහානං එතදහොසි: අයං ඛො පන මහාසකටසත්ථො සකටසහස්සං. තෙ මයං යෙන යෙන ගච්ඡාම, ඛිප්පමෙව පරියාදියති තිණකට්ඨොදකං හරිතකපණ්ණං. යන්නූන මයං ඉමං සත්ථං විධා විභජෙය්‍යාම, එකතො පඤ්ච සකටසතානි. එකතො, පඤ්ච සකටසතානීති. තෙ තං සත්ථං විධා විභජිංසු: එකතො පඤ්ච සකටසතානි, එකතො පඤ්ච සකටසතානි. එකො තාව සත්ථවාහො බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච ආරොපෙත්වා සත්ථං පයාපෙසි.

---

40. එසේ වී නම් රාජන්‍යය! තට උපමාවක් කරන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැනගණිත්. එසේ හෙයින් පෙරවූ කාරණයක් කියමි. ගැල් දහසකින් යුක්ත වූ, වෙළඳම් පිණිස ගැල් වලින් බඩුගෙණ යන මහත් වෙළඳ සමූහයෙක් නැගෙනහිර දිග ජනපදයකින් බස්නාහිර දිග ජනපදයකට ගියේය. ඒ ගැල් වෙළඳ සමූහය තෙම යම් යම් මාර්ගයකින් යේ ද, ඒ ඒ මාර්ගයෙහි තණ ද දර ද දිය ද නිල්වන් කොල ද හෙවත් යටත් පිරිසෙයින් අමුතණ පමණකුදු ඉතිරි නොවී වහා නිම වෙයි. ඒ වෙළඳ සමූහයෙහි වනාහි සාර්ථ නායකයෝ දෙදෙනෙක් වූහ. ඉන් එක් නායකයෙක් ගැල් පන්සියයකට ද අනිකා අනික් ගැල්පන්සියයට ද අධිපති විය. ඉක්බිති ඒ ගැල් නායකයන් දෙදෙනාට මෙසේ අදහසක් වූයේය. මේ වනාහි ගැල් දහසකින් යුත් මහා ගැල් සමූහයෙකි. ඒ අපි යම් යම් මාර්ගයකින් යමු ද, ඒ ඒ මාර්ගයෙහි තණ ද දර ද ජලය ද යටත් පිරිසෙයින් නිල් තණ පවා ඉතිරි නොවී වහා නිම වෙයි. අපි මේ ගැල් සමූහය එක් කොටසකට පන්සියයක් ද අනික් කොටසට පන්සියයක් ද වන ලෙස දෙකොටසක් කොට බෙදන්නෙමු නම් ඉතා යෙහෙකැයි කියාසි. ඉන් පසු ඔහු ඒ වෙළඳ සමූහය එක්එක් කොටසට ගැල් පන්සියය පන්සියය වනසේ දෙකොටසකට බෙදූහ. පළමු කොට ඉන් එක් ගැල් නායකයෙක් බොහෝ වූ තණ ද දර ද දිය ද පටවා ගෙණ ගැල් සමූහය පැදවූයේය.

41. විහතිහං පයාතො ඛො පන සො සත්ථො අද්දස පුරිසං කාලං ලොහිතක්ඛං සන්නද්ධකලාපං කුමුදමාලිං අල්ලවත්ථං අල්ලකෙසං කද්දමමක්ඛිතෙහි චක්කෙහි භද්‍රෙන රථෙන පටිපථං ආගච්ඡන්තං, දිස්වා එතදවොච: කුතො භො ආගච්ඡසීති? අමුකම්හා ජනපදාති. කුහිං ගමිස්සසීති? අමුකං නාම ජනපදන්ති. කච්චි භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවුට්ඨොති. එවං භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවුට්ඨො, ආසිත්තොදකානි වටුමානි, බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච, ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි, ලහුභාරෙහි සකටෙහි සීඝ සීඝං ගච්ඡථ මා යොග්ගානි කිලමෙථාති. අථ ඛො සො සත්ථවාහො සත්ථිකෙ ආමන්තෙසි. අයං භො පුරිසො එවමාහ. පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවුට්ඨො, -පෙ- මා යොග්ගානි කිලමෙථාති ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි ලහුභාරෙහි සකටෙහි සත්ථං පයාපෙථාති.

---

41. දෙතුන් දවසක් ගමන් කළා වූ ඒ සමූහයා තෙමේ වනාහි මඩ තැවිරුණු රෝද ඇති යහපත් රියකින් ඉදිරි මාර්ගයට එන්නා වූ, ලේවන් ඇස් ඇති බඳනා ලද දුන්න හා හියවුර ඇති, පලඳනා ලද කුමුදු මල් මාලා ඇති හඳනා ලද තෙත් රෙදි ඇති, තෙත් කෙහෙ ඇති, කාලවර්ණ වූ පුරුෂයෙකු දුටුවේය දැක මෙසේ කීය, පින්වත! කොහි සිට එන්නෙහි ද? අසවල් ජනපදයෙහි සිට (එමි), කොහි යන්නෙහි ද? අසවල් ජනපදයටය, කිම? පින්වත! ඉදිරියෙහි කාන්තාරයෙහි මහ වැස්සක් වැස්සේ ද? එසේය පින්වතුනි! ඉදිරි කාන්තාරයෙහි මහ වැස්සෙක් වැස්සේය. මාර්ගයෝ ජලයෙන් පිරුණාහු වෙති. තණ ද දර ද දිය ද බොහෝ වෙති. එහෙයින් පින්වතුනි! පරණ තණ ද දර ද දිය ද බැහැර කරව්. සැහැල්ලු බර ඇති ගැල් වලින් යුක්තව වහවහා ගමන් කරව්. ගොණුන් කලාන්ත නො කරව්, යනුයි. ඒ පුරුෂයා මෙසේ කී කල ඒ සාර්ථවාහක තෙමේ හෙවත් ගැල් නායක තෙමේ ස්වකීය සමූහයෙහි වූවන්ට මෙසේ කීය. පින්වතුනි! මේ පුරුෂ තෙමේ; ඉදිරි කාන්තාරයෙහි මහා වැස්සෙක් වැස්සේය -පෙ- ගොණුන් කලාන්ත නො කරව්'' යයි මෙසේ කීය. එහෙයින් පින්වතුනි! පැරණි තණ ද දර ද දිය ද බැහැර කරව්, සැහැල්ලු බර ඇති ගැල්වලින් යුක්ත කොට ගැල් සමූහය පදවව් යනුයි

42. එවං භොති ඛො තෙ සාකටිකා තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා, ඡඩ්ඩෙත්වා පුරාණානි තිණානි කට්ඨානි උදකානි ලහුභාරෙහි සකටෙහි සත්ථං පයාපෙසුං. තෙ පඨමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා, දුතියෙපි -පෙ- තතියෙපි -පෙ- චතුත්ථෙපි -පෙ- පඤ්චමෙපි -පෙ- ඡට්ඨෙපි -පෙ- සත්තමෙපි -පෙ- උදකං වා, සබ්බෙව අනයබ්‍යසනං ආපජ්ජිංසු. යෙ ච තස්මිං සත්ථෙ අහෙසුං මනුස්සා වා පසූ වා, සබ්බෙ සො යක්ඛො අමනුස්සො භක්ඛෙසි, අට්ඨිකානෙව සෙසානි. යදා අඤ්ඤාසි දුතියො සත්ථවාහො: බහුනික්ඛන්තො ඛො දානි සො සත්ථොති; බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච ආරොපෙත්වා සත්ථං පයාපෙසි. ද්වීහතීහං පයාතො ඛො පන සො සත්ථො අද්දස -පෙ- මා යොග්ගානි කිලමෙථාති.

---

42. ඒ වෙළඳ සමූහයෙහි වූ පුරුෂයෝ ද "පින්වත! එසේය"යි කියා ඒ ගැල්නායකයාගේ වචනය පිළිගෙණ පැරණි තණ ද දර ද ජලය ද බැහැර කොට ගැල් සමූහය සැහැල්ලු බරින් යුක්ත කොට පැදවූහ. ඔහු පළමුවන සාර්ථවාසයෙහි ද හෙවත් වෙළඳ සමූහයාගේ වාසස්ථානයෙහි ද (නවාතැන් පලෙහිද) තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය: එසේම දෙවෙනි- තුන්වෙනි- සිවුවෙනි- පස්වෙනි- සවෙනි- සත්වෙනි සාර්ථවාසයෙහිද තණ හෝ දර හෝ දිය හෝ නුදුටහ. සියල්ලෝම අනයව්‍යසනයට හෙවත් මහත් දුකට පැමිණියාහුය. ඒ වෙළඳ සමූහයෙහි යම් මිනිස් කෙනෙක් හෝ සිවුපාවෝ හෝ වූහුද, ඒ සියල්ලන්ම ඒ යක්ෂතෙමේ කා දැමීය. ඇට පමණක්ම ඉතිරි වූහ. ඉක්බිති දෙවන ගැල් නායක තෙමේ පින්වතුනි! දැන් ඒ ගැල් සමූහය නික්ම බොහෝ කල් ඇත්තේ යයි යම් කලෙක දැනගත්තේ ද, එකල්හි හෙතෙමේ ද බොහෝ වූ තණ ද දර ද දිය ද පටවාගෙණ ස්වකීය ගැල් සමූහය පැදවූයේය. දෙතුන් දවසක් ගමන් කළා වූ ඒ සමූහයා ද ඉදිරියට එන්නා වූ -පෙ- පුරුෂයෙකු දුටුවේය. දැක මෙසේ කීය. පින්වත! කොහි සිට එන්නෙහි ද? අසවල් ජනපදයෙහි සිටය. කොහි යන්නෙහි ද? මෙනම් ජනපදයකටය. කිම? පින්වත! ඉදිරිකාන්තාරයෙහි මහ වැස්සෙක් වැස්සේ ද? එසේය පින්වතුනි! -පෙ- ගොණුන් කලාන්ත නොකරව් යයි" කීය.

43. අථ ඛො සො සත්ථවාහො සත්ථිකෙ ආමන්තෙසි: අයං භො පුරිසො එවමාහ- පුරතො සන්තාරෙ -පෙ- මා යොග්ගානි ගිලමෙථාති. අයං ඛො භො පුරිසො නෙව අම්හාකං මිත්තො න ඤාතිසාලොහිතො, කථං මයං ඉමස්ස සද්ධාය ගමිස්සාම? න ඛො ඡඩ්ඩෙතබ්බානි පුරාණානි තිණානි කට්ඨානි උදකානි, යථා ගතෙන භණ්ඩෙන සත්ථං පයාපෙථ, න නො පුරාණං ඡඩ්ඩෙස්සාමාති. එවං හොති ඛො තෙ සත්ථිකා තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා යථා ගතෙන භණ්ඩෙන සත්ථං පයාපෙසුං. තෙ පඨමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා, දුතියෙපි -පෙ- සත්තමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා, තඤ්ච සත්ථං අද්දසංසු අනයබ්‍යසනං ආපන්නං. යෙ ච තස්මිං සත්ථෙ අහෙසුං මනුස්සා වා පසූ වා, තෙසඤ්ච අට්ඨිකානෙව අද්දසංසු තෙන යක්ඛෙන අමනුස්සෙන භක්ඛිතානං.

---

43. එකල්හි වනාහි ඒ ගැල් නායක තෙමේ ස්වකීය සමූහයෙහි වූවන්ට ආමන්ත්‍රණය කෙළේය. පින්වතුනි! මේ පුරුෂ තෙමේ "ඉදිරි කාන්තාරයෙහි -පෙ- ගොණුන් කලාන්ත නො කරව්" යයි මෙසේ කීය. පින්වතුනි! මේ පුරුෂතෙමේ වනාහි අපගේ මිත්‍රයෙක් නො වෙයි. සහ ලේ නෑයෙක් ද නො වෙයි, කෙසේ අපි මොහුගේ වචනය අදහාගෙණ ගමන් කරන්නෙමු ද? එබැවින් පැරණි තණ ද දර ද ජලය ද බැහැර නො දැමිය යුත්තාහ. තොප පළමු කොට යම් තණ දර දිය ආදියක් පටවා ගන්නා ලද නම් ඒ පටවා ගන්නා ලද පරිදි වූ ගැල් සමූහය "අපි පැරණි තෘණාදිය බැහැර නො දමන්නෙමු"යි කියා පදවව් යයි කීය. ඒ සමූහයෙහි නියුක්ත පුරුෂයෝ ද "පින්වත! එසේය"යි කියා ඒ ගැල් නායකයාහට පිළිතුරු දී පටවන ලද පරිදි වූ තෘණාදී බඩු සහිත ගැල් සමූහය පැදවූහ. ඔහු පළමු වන සාර්ථවාසයෙහි ද හෙවත් නවාතැන් පලෙහිද තණ හෝ දර හෝ දිය හෝ නොම දුටුහ. එසේම දෙවන- තෙවන- සතරවන- පස්වන- සවන- සත්වන සාර්ථවාසයෙහි ද තණ හෝ දර හෝ දිය හෝ නුදුටුවාහුය. විනාශයට පත් වූ ඒ පළමු පැමිණි ගැල් සමූහය ද දුටුවාහුය. ඒ ගැල් සමූහයෙහි යම් මිනිස් කෙනෙක් හෝ සිවුපාවෝ හෝ වූහු නම් ඒ යක්ෂයා විසින් කන ලද ඔවුන්ගේද ඇට පමණක්ම දුටුවාහුය.

44. අථ ඛො සො සත්ථවාහො සකටිකෙ ආමන්තෙසි: අයං ඛො භො සත්ථො අනයබ්‍යසනං ආපන්නො, යථා තං තෙන බාලෙන සත්ථවාහෙන පරිණායකෙන. තෙන හි භො යානම්හාකං සකටෙ අප්පසාරානි පණියානි, තානි ඡඩ්ඩෙථ, යානි ඉමස්මිං සකටෙ මහාසාරානි පණියානි තානි ආදියථාති. එවං භොති ඛො තෙ සකටිකා තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා [යානි සකටෙසු අප්පසාරානි පණියානි තානි ඡඩ්ඩෙත්වා,] යානි තස්මිං සකටෙ මහාසාරානි පණියානි තානි ආදියිත්වා, සොත්ථිනා තං කන්තාරං නිත්ථරිංසු යථා තං පණ්ඩිතෙන සත්ථවාහෙන පරිණායකෙන. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ බාලො අබ්‍යත්තො අනයබ්‍යසනං ආපජ්ජිස්සසි අයොනිසො පරලොකං ගවෙසන්තො; සෙය්‍යථාපි සො පුරිමො සත්ථවාහො. යෙපි තෙ සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති, තෙපි අනයව්‍යසනං ආපජ්ජිස්සන්ති, සෙය්‍යථාපි තෙ සකටිකා. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ

---

44. ඉක්බිති ඒ ගැල් නායක තෙමේ සවකීය ගැල් සමූහයෙහි නියුක්තයන්ට ආමන්ත්‍රණය කෙළේය. පින්වත්නි! මේ වෙළඳ සමූහ තෙමේ වනාහි අඥාන වූ ඒ පරිණායක සාර්වාහකයා කරණ කොට ගෙණ අනයව්‍යසනයට පැමිණියේය. එසේ වී නම් පින්වතුනි! අපගේ ගැල් සමූහයෙහි සවල්පයක් අගනා වූ යම් විකිණියයුතු භාණ්ඩයෝ වෙද් ද, ඒවා බැහැර කොට මේ ගැල් සමූහයෙහි බොහෝ වටිනා යම් විකිණිය යුතු භාණ්ඩයෝ වෙත් නම් ඒවා ගෙණ පටවා ගණිව් යයි කීය. ඒ නියුක්ත පුරුෂයෝ ද "පින්වත එසේය" යි කියා ගැල් නායකයාගේ වචනය පිළිගෙණ සවකීය ගැල් සමූහයෙහි තුබුනු සවල්පයක් වටිනා බඩු බැහැර දමා ඒ විනාශයට පත් ගැල් සමූහයෙහි තුබුනු බොහෝ වටිනා බඩු පටවාගෙණ පණ්ඩිත වූ ඒ පරිණායක සාර්වාහකයා කරණ කොට ගෙණ සුවසේ ඒ කාන්තාරය තරණය කළාහුය. එපරිද්දෙන්ම රාජන්‍යය! අඥාන වූ අදක්‍ෂ වූ නුඹ නුනුවණින් පරලොව සොයමින් ඒ පළමු ගැල් නායකයා ලෙස මහත් දුකට පැමිණෙන්නෙහිය, යම් ඒ කෙනෙක් නුඹේ වචනය ඇසිය යුතුය, ඇදහිය යුතු යයි සිතන්නාහු නම්, ඔහු ද ඒ ගැල් සමූහයෙහි නියුක්ත පුරුෂයන් මෙන් අනයව්‍යසනයට පැමිණෙන්නාහුය. එසේ හෙයින් රාජන්‍යය! මේ ලාමක මිථ්‍යාදෘෂ්ටිය අත්හරුව, රාජන්‍යය! ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටිය අත්හරුව, මේ දෘෂ්ටිය බොහෝ කාලයක් මුළුල්ලෙහි තට අහිත පිණිස අවැඩ පිණිස නොවේවා යි වදාළහ. එවිට රාජන්‍යතෙමේ, කෙසේ

පාපකං දිට්ඨිගතං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං. -පෙ- පලාසෙතපි තං හරිස්සාමීති.

45. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමාය -පෙ- ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො සූකරපොසකො පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං අගමාසි; තත්‍ථ අද්දස පහූතං සුක්ඛං ගූථං ඡඩ්ඩිතං; දිස්වානස්ස එතදහොසි: අයං ඛො බහුකො සුක්ඛගූථො ඡඩ්ඩිතො, මම ච සූකරභත්තං. යන්නූනාහං ඉතො සුක්ඛගූථං හරෙය්‍යන්ති. සො උත්තරාසඞ්ගං පත්‍ථරිත්වා පහූතං සුක්ඛගූථං ආකිරිත්වා භණ්ඩිකං බන්ධිත්වා සීසෙ උබ්බාහෙත්වා අගමාසි. තස්ස අන්තරාමග්ගෙ මහා අකාලමෙඝො පාවස්සි. සො උග්ඝරන්තං පග්ඝරන්තං යාව අග්ගනඛා ගූථෙන මක්ඛිතො ගූථභාරං ආදාය අගමාසි. තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු: කච්චි නො ත්වං භණෙ උම්මත්තො, කච්චි විචෙතො?

නමුත් භවත් කාශ්‍යපයෝ මෙසේ වදාරති. එතෙකුදු වුවත් මේ ලාමක දෘෂ්ටිය අත් හරින්ට නො හැක්කේ වෙමි. -පෙ- යුග ග්‍රාහය හේතුකොට ගෙණ ද මම මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි යි කීය.

45. එසේ වී නම් රාජන්‍යය! නුඹට(තවත්) උපමාවක් ගෙණ හැර දක්වන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැන ගණිත්, (එහෙයින්) පෙර වූ කාරණයක් කියමි. රාජන්‍යය! එක්තරා ඌරන් පොෂණය කරණ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට ගියේය. හෙතෙමේ එහි දමන ලද බොහෝ වූ වියලි අසුචි දුටුවේය. දැක ඕහට මෙසේ අදහස් විය. මේ බොහෝ වූ වියලි අසුචි දමන ලද්දේය. ඒ මාගේ ඌරන්ට ආහාරය ද වෙයි. එබැවින් මම මෙයින් වියලි අසුචි ගෙණ යන්නෙම් නම් යෙහෙක යනුයි, එසේ සිතා හෙතෙමේ උතුරුසළුව අතුරා එහි බොහෝ වූ වියලි අසුචි වගුරුවා පොදියක් බැඳ එය හිස මත්තෙහි තබාගෙණ ගියේය. ඔහු එසේ යන කල අතරමගදී මහත් අකල් වැස්සක් වැස්සේය. හෙතෙමේ නිය අග තෙක් අසුචියෙන් තැවරුණේ උඩින් උතුරන්නා වූ ද, යටින් වැගිරෙන්නා වූ ද අසුචි බර ගෙණ ගියේය. ඒ මොහු දැක මිනිස්සු; කිම? කොල! තෝ උමතු වූවෙක් වෙහි ද? කිම? විකල සිත් ඇත්තෙක් වෙහි ද? කෙසේ නම් තෝ නිය අග තෙක් අසුචියෙන් තැවරුණේ උතුරන්නා වූ ද, වැගිරෙන්නා වූ ද අසුචි බර ගෙණ යන්

කථං හි නාම උග්ඝරන්තං පග්ඝරන්තං යාව අග්ගනඛා ගූථෙන මක්ඛිතො ගූථභාරං හරිස්සසීති? තුම්හෙ ඛ්වෙත්ථ භණෙ උම්මත්තා තුම්හෙ විචෙතා. තථා හි පන මෙ පූතරහන්තන්ති. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ ගූථභාරිකූපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං -පෙ- දුක්ඛායාති. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං -පෙ- පලාසෙනපි තං හරිස්සාමීති

46. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමාය -පෙ- අ ජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ ද්වෙ අක්ඛධුත්තා අක්ඛෙහි දිබ්බිංසු. එකො අක්ඛධුත්තො ආගතාගතං කලිං ගිලති. අද්දසා ඛො දුතියො අක්ඛධුත්තො තං අක්ඛධුත්තං ආගතාගතං කලිං ගිලන්තං. දිස්වා තං අක්ඛධුත්තං එතදවොච: ත්වං ඛො සම්ම එකන්තිකෙන ජිනාසි, දෙහි මෙ සම්ම අක්ඛෙ, පජ්ජොහිස්සාමීති. එවං සම්මාති ඛො සො අක්ඛධුත්තො තස්ස අක්ඛධුත්තස්ස අක්ඛෙ පාදාසි. අථ ඛො සො අක්ඛධුත්තො අක්ඛෙ විසෙන පරිභාවෙත්වා

නෙහිද්ද?යි මෙසේ කීහ. එකල හෙතෙමේ- කොලෙනි! නොපි උම්මත්තකයෝ වන්නහුය. විකල සිත් ඇත්තෝ වන්නහුය. ඒ එසේමය, මා විසින් ගෙණ යන මේ අසුචි ඌරන්ගේ ආහාරය වෙයි කීය. එපරිද්දෙන්ම රාජන්‍යය! නුඹ අසුචි බර ගෙණ ගිය පුරුෂයා මෙන් මට වැටහෙන්නෙහිය. රාජන්‍යය! මේ ලාමක දෘෂ්ටිය දුරු කරව, රාජන්‍යය! මේ ලාමක දෘෂ්ටිය දුරු කරව, තට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස අවැඩ පිණිස මේ දෘෂ්ටිය නො වේවායි වදාළසේක. එකල්හි ද රාජන්‍යතෙමේ කිසි කරුණක් සලකා භවත් කාශ්‍යපයෝ මෙසේ කියති. එසේ වුවද මේ ලාමක දෘෂ්ටිය දුරු කරන්නට නො හැක්කෙම් මය. -පෙ- යුගග්‍රාහය හෙතු කොට ගෙණ ද මම මේ දෘෂ්ටිය මෙසේම ගෙණ හැසිරෙන්නෙම් යි කීවේය.

46 (නැවතද තෙරහු:) එසේ නම් රාජන්‍යය! තට (අනික්) උපමාවක් ද ගෙණ හැර දක්වන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැන ගණිත්. එබැවින් පෙර වූවක් කියමි. රාජන්‍යය! අක්‍ෂධූර්තී දෙදෙනෙක් පස ඇට (=දාදු කැට) වලින් ක්‍රීඩා කළහ. ඉන් එක් අක්‍ෂධූර්තීයෙක් පැමිණි පැමිණි පරාජය පස ඇටය ගිලියි. දෙවෙනි අක්‍ෂධූර්තී තෙමේ ඒ පැමිණි පැමිණි පරාජය පස ඇටය ගිලින්නා වූ ඔහු දැක්කේය. දැක ඔහට "යහළුව! නුඹ වනාහි ඒකාන්තයෙන් දිනන්නෙහිය. මාගේ පස ඇට දෙව, මම

තං අක්ඛධුත්තං එතදවොච: එහි ඛො සම්ම අක්ඛෙහි දිබ්බිස්සාමාති එවං සම්මාති ඛො සො අක්ඛධුත්තො තස්ස අක්ඛධුත්තස්ස පච්චස්සොසි. දුතියම්පි ඛො තෙ අක්ඛධුත්තා අක්ඛෙහි දිබ්බිංසු. දුතියම්පි ඛො සො අක්ඛධුත්තො ආගතාගතං කලිං ගිලති. අද්දසා ඛො දුතියො අක්ඛධුත්තො තං අක්ඛධුත්තං දුතියම්පි ආගතාගතං කලිං ගිලන්තං. දිස්වා තං අක්ඛධුත්තං එතද වොච

ලිත්තං පරමෙන තෙජසා ගිලමක්ඛං පුරිසො න බුජ්ඣති
ගිල රෙ ගිල පාපධුත්තක පච්ඡා තෙ කටුකං භවිස්සතීති

එව මෙව ඛො ත්වං රාජඤ්ඤ අක්ඛධුත්තූපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං -පෙ- පලාසෙතපි තං හරිස්සාමීති.

ක්‍රීඩා කරන්නෙමි''යි මෙසේ කීය. ඒ අක්‍ෂධූර්ත තෙමේ ද යහලුව එසේ යයි කියා ඔහුගේ පස ඇට දුන්නේය. ඉක්බිති ඒ අක්‍ෂධූර්ත තෙමේ ඒ පස ඇට විෂයෙන් යොදා (විෂ පොවා) නැවත අනික් අක්‍ෂධූර්තයාට ''යහලුව එව, පස ඇට වලින් ක්‍රීඩා කරන්නෙමු''යි කියේය. යහලුව එසේයයි කියා ඒ අක්‍ෂධූර්ත තෙමේ අනිකාට පිළිතුරු දිනි. මෙසේ දෙවනුව ද ඒ අක්‍ෂධූර්තයෝ පස ඇට වලින් ක්‍රීඩා කළාහුය. දෙවනුව ද හෙතෙමේ පැමිණි පැමිණි පරාජය පස ඇට ගිලියි. දෙවනුව ද අනික් අක්‍ෂධූර්ත තෙමේ පැමිණි පැමිණි පරාජය පස ඇට ගිලින්නා වූ ඔහු දුටුවේය. දැක ඔහට ගාථාවකින් මෙසේ කීය. කෙසේ ද යත්? තියුණු වූ විෂයෙන් ගල්වන ලද පස ඇට ගිලින්නා වූ මේ පුරුෂතෙම (ඒ බැව්) නො දනී. එම්බල! ගිලපිය, ලාමකධූර්තය! ගිලපිය, පසුව තට දරුණු විපාක වන්නේය යනුයි. එපරිද්දෙන් ම රාජන්‍යය! නුඹ ඒ අක්‍ෂධූර්තයා ලෙස මට වැටහෙන්නෙහිය. (අක්‍ෂධූර්ත යනු පස ඇට වලින් ක්‍රීඩා කරන්නන්ට නමෙකි) රාජන්‍යය! ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටිය අත්හරුව, ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටිය හරුව, තට බොහෝ කලක් මුළුල්ලෙහි අහිත පිණිස අවැඩ පිණිස මේ දෘෂ්ටිය නො වේවායි පැවසූහ. එවිට ද රාජන්‍ය තෙමේ, කිසි කරුණක් සලකා භවත් කාශ්‍යප තෙමේ මෙසේ කියයි: එසේ නමුත් මෙය දුරුකළ නොහැක්කෙමි මය,-පෙ- යුගග්‍රාහයෙන් ද මම මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමි යි කීය.

47. තෙන හි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමාය -පෙ- ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො ජනපදො වුට්ඨාසි. අථ ඛො සහායකො සහායකං ආමන්තෙසි: ආයාම සම්ම යෙන සො ජනපදො තෙනුපසඞ්කමිස්සාම, අප්පෙවනාමෙත්ථ කිඤ්චි ධනං අධිගච්ඡෙය්‍යාමාති. එවං සම්මාති ඛො සහායකො සහායකස්ස පච්චස්සොසි. තෙ යෙන සො ජනපදො යෙනඤ්ඤතරං ගාමපට්ටනං තෙනුපසඞ්කමිංසු. තත්ථ අද්දසංසු පහූතං සාණං ඡඩ්ඩිතං. දිස්වා සහායකො සහායකං ආමන්තෙසි: ඉදං ඛො සම්ම පහූත සාණං ඡඩ්ඩිතං, තෙන හි සම්ම ත්වඤ්ච සාණභාරං බන්ධ, අහඤ්ච සාණභාරං බන්ධිස්සාමීති, උභො සාණභාරං ආදාය ගමිස්සාමාති. එවං සම්මාති ඛො සහායකො සහායකස්ස පටිස්සුත්වා සාණභාරං බන්ධිත්වා තේ උභොපි සාණභාරං ආදාය යෙනඤ්ඤතරං -පෙ- අද්දසංසු පහූතං සාණසුත්තං ඡඩ්ඩිතං, දිස්වා -පෙ- ආමන්තෙසි: යස්ස ඛො සම්ම අත්ථාය ඉච්ඡෙය්‍යාම සාණං, ඉදං පහූතං සාණසුත්තං ඡඩ්ඩිතං, තෙන හි සම්ම ත්වඤ්ච සාණභාරං ඡඩ්ඩෙහි අහඤ්ච සාණභාරං ඡඩ්ඩෙස්සාමි, උභො සාණසුත්තභාරං ආදාය ගමිස්සාමාති. අයං ඛො මෙ සම්ම සාණභාරො දූරාභතො ච සුසන්නද්ධො ච, අලං මෙ ත්වං පජානාහීති

---

47. (නැවත ද කුමාර කාශ්‍යපස්ථවිරයන් වහන්සේ වදාරණ සේක්:) එසේ වී නම් රාජන්‍යය! තුඹට (තවත්) උපමාවක් කරන්නෙමි. උපමාවෙන් ද -පෙ- දැනගණිත්, එහෙයින් පෙර සිදු වූ කාරණයක් කියමි. රාජන්‍යය! එක්තරා ජනපදයෙක් නැගී සිටියේය. හෙවත් ජනපද වැස්සෝ ජනපදය අත්හැර ගියහ. එකල්හි යහළුවෙක් ඔහුගේ යහළුවෙකුට ආමන්ත්‍රණය කෙළේය. යහළුව යමු, ඒ දනව්ව යම් තැනෙක්හි නම් එහි එළඹෙමු. මෙහි කිසි ධනයක් ලබන්නෙමු නම් ඉතා යෙහෙකැයි කීය. යහළුව! එසේ යයි යහළු තෙමේ ස්වකීය යහළුවාට පිළිවදන් ඇස්වීය. ඉන් පසු ඔහු දෙදෙන ඒ දනව්වෙහි එක්තරා ගම් පියසකට එළඹුනාහුය. ඔහු එහි දමන ලද බොහෝ වූ හණ වැහැරි දුටහ. දැක යහළුවා අනික් යහළුවා ඇමතීය. මිත්‍රය! මේ වනාහි දමන ලද බොහෝ වූ හණ වැහැරිය. එසේ නම් තුඹ ද හණ බරක් බැඳ ගණුව, මම ද හණබරක් බැඳ ගන්නෙමි. එසේ දෙදෙනම හණබර ගෙණ යන්නෙමු යි කීය. යහළුව එසේ යයි කියා එකතු අනිකාට පිළිතුරු දී දෙදෙනම හණ බර ගෙණ එක්තරා ගම් පටුනකට පැමිණියාහුය. එහි දී ඔහු බැහැර දමන ලද බොහෝ වූ හණනූල් දුටුවාහුය. දැක (නුවණැති) යහළුවා

48. අථ ඛො සො සහායකො සාණභාරං ඡඩ්ඩෙත්වා සාණසුත්තභාරං ආදියි. තෙ යෙන -පෙ- අද්දසංසු පහූතා සාණියො ඡඩ්ඩිතා. දිස්වා -පෙ- ඉච්ඡිතබ්බාම සාණං වා සාණසුත්තං වා, ඉමා පහූතා සාණියො ඡඩ්ඩිතා තෙන හි සම්ම -පෙ- අහං සාණසුත්තභාරං ඡඩ්ඩෙස්සාමි, උභො සාණිභාරං ආදාය ගමිස්සාමාති. අයං -පෙ- පජහාමීති, අථ ඛො සො සහායකො සාණසුත්තභාරං ඡඩ්ඩෙත්වා සාණිභාරං ආදියි, තෙ -පෙ- අද්දසංසු පහූතං ඛොමං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං ඛොමසුත්තං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං ඛොමදුස්සං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං කප්පාසං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං කප්පාසිකසුත්තං ඡඩ්ඩිතං දිස්වා- පහූතං කප්පාසිකදුස්සං ඡඩ්ඩිතං දිස්වා- පහූතං අයං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං ලොහං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං තිපුං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං සීසං ඡඩ්ඩිතං දිස්වා- පහූතං සජ්ඣුං ඡඩ්ඩිතං, දිස්වා- පහූතං සුවණ්ණං ඡඩ්ඩිතං, දිස්වා සහායකො සහායකං ආමන්තෙසි.

අනිකා ඇමතීය. අමතා යහලුව! යමක් පිණිස අපි හණ වැහැරි කැමති වන්නෙමු ද, මේ වනාහි බැහැර දමන ලද ඒ හණ නූල්ය. එබැවින් තුඹත් හණ වැහැරි මිටිය බැහැර දමව, මම ද බැහැර දමන්නෙමි. දෙදෙනම හණ නූල් බරක් ගෙණ යන්නෙමුයි කීය. එකල්හි හෙතෙමේ, යහලුව! මාගේ මේ හණ වැහැරි බර දුර සිට ගෙණෙන ලද්දේ ද මනාකොට බඳනා ලද්දේ ද වෙයි. එහෙයින් මට කමක් නැත. තුඹ දැන ගණුව හෙවත් කැමත්තක් කරවයි කීය.

48. ඉක්බිති ඒ යහලු තෙමේ හණ වැහැරි බර දමා හණ නූල් බරක් ගත්තේය. එසේ යන ඔව්හු එක්තරා ගම් පෙදෙසකට පැමිණියහ. එහි ඔහු දමන ලද බොහෝ වූ හණ වස්ත්‍ර දුටුවාහුය. දැක එකෙක් අනිකාට කථා කොට යහලුව! යමක් පිණිස හණ වැහැරි හෝ හණ නූල් කැමති වන්නෙමු නම් මේ බැහැර දමන ලද ඒ හණ රෙදිය. එහෙයින් තුඹත් හණ බර බැහැර දමව, මමත් හණ නූල් බර බැහැර දමන්නෙමි. දෙදෙනම හණ වස්ත්‍ර බරක් ගෙණ යමුයි කීය. යහලුව! මාගේ මේ හණ බර දුර සිට ගෙණෙන ලද්දේ ද මනාකොට බඳනා ලද්දේ ද වෙයි. එහෙයින් මට කම් නැත. තුඹ කැමැත්තක් කරව යි අනිකා පෙර සේම පිළිතුරු දුන්නේය. එකල්හි හෙතෙමේ හණ නූල් බර බැහැර කොට හණ වස්ත්‍ර බරක් බැඳ ගත්තේය. ඔහු තවත් ගම් පියසකට එළඹුනාහුය. එහිදී ඔහු බැහැර කරණ ලද බොහෝ වූ කොමු දුටුවාහුය.

49. යස්ස ඛො සම්ම අත්ථාය ඉච්ඡෙය්‍යාම සාණං වා සාණසුත්තං වා සාණියො වා ඛොමං වා ඛොමසුත්තං වා ඛොමදුස්සං වා කප්පාසං වා කප්පාසිකසුත්තං වා කප්පාසිකදුස්සං වා අයං වා ලොහං වා තිපුං වා සීසං වා සජ්ඣුං වා, ඉදං පහූතං සුවණ්ණං ඡඩ්ඩිතං. තෙන හි සම්ම ත්වඤ්ච සාණභාරං ඡඩ්ඩෙහි, අහඤ්ච සජ්ඣුභාරං ඡඩ්ඩෙහි, අහඤ්ච සජ්ඣුභාරං ඡඩ්ඩෙස්සාමි, උභො සුවණ්ණභාරං ආදාය ගමිස්සාමාති. අයං ඛො -පෙ- පජානාහීති අථ ඛො සහායකො සජ්ඣුභාරං ඡඩ්ඩෙත්වා සුවණ්ණභාරං ආදියි. තෙ යෙන සකො ගාමො තෙනුපසඞ්කමිංසු, තත්ථ යො සහායකො සාණභාරං ආදාය අගමාසි තස්ස නෙව මාතාපිතරො අභිනන්දිංසු, න පුත්තදාරා අභිනන්දිංසු, න මිත්තාමච්චා අභිනන්දිංසු, න ච තතො නිදානං සුඛං සොමනස්සං අධිගච්ඡි. යො පන සො සහායකො සුවණ්ණභාරං ආදාය අගමාසි. තස්ස මාතාපිතරොපි අභිනන්දිංසු, පුත්තදාරාපි අභිනන්දිංසු, මිත්තාමච්චාපි අභිනන්දිංසු, තතො නිදානඤ්ච සුඛං සොමනස්සං අධිගච්ඡි

ඒවා දූක -පෙ- එසේම බැහැර දමන ලද කොමු නූල් දුටහ. දූක ද- කොමු වස්ත්‍ර-දූක ද-බැහැර දමන ලද කපු-දූක ද- කපු නූල් දූක ද-කපුපිළී දූක ද-බැහැර දමන ලද කළු ලොහො (=යකඩ)- දූක ද- තඹ ලොහො- දූක ද,- බැහැර දමන ලද කළු ඊයම්-දූක ද- සුදු ඊයම්- දූක ද-බැහැර දමන ලද රිදී- දූක ද- රන්මසු-දූක ද- එක් යහලුවෙක් අනිකාට ආමන්ත්‍රණය කෙළේය.

49. යහලුව! යම් සුවර්ණයක් පිණිස අපි හණ වැහැරි හෝ හණ නූල් හෝ හණ වස්ත්‍ර හෝ කොමු හෝ කොමු නූල් හෝ කොමු වස්ත්‍ර හෝ කපු හෝ කපු නූල් හෝ කපු වස්ත්‍ර හෝ කළු ලොහො හෝ තඹ ලොහො හෝ කළු ඊයම් හෝ සුදු ඊයම් හෝ රිදී හෝ කැමති වන්නෙමු නම් මේ වනාහි බැහැර දමන ලද ඒ රන්මසුය. එහෙයින් යහලුව! නුඹ ද හණ බර බැහැර දමව, මම ද රිදී බර බැහැර දමන්නෙමි. එසේ කොට දෙදෙනම රන් බරක් ගෙණ යන්නෙමුයි කීයේය. එවිට ද අනිකා කියනුයේ; යහලුව! මාගේ මේ හණ බර දුර සිට ගෙණෙන ලද්දේ ද මනාකොට බඳනා ලද්දේ ද වෙයි. එහෙයින් (මේ රණින්) මට කම් නැත. නුඹ කැමැත්තක් කරවයි කීය. ඉක්බිති ඒ යහලු තෙම රිදී බර බැහැර දමා රන්මසු බරක් ගත්තේය. මෙසේ ඔහු දෙදෙන (එකෙක් හණ බරක් ගෙණ ද එකෙක් රන් මසු බරක් ගෙණ ද) සිය ගමට පැමිණියාහුය. එහි යම් ඒ යහලුවෙක් හණ වැහැරි බර ගෙණ ගියේ ද, ඔහුගේ මවුපියෝ ද නොම සතුටු වූහ. අඹුදරුවෝ ද

50. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ සාණභාරිකූපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං -පෙ- දුක්ඛායාති. පුරිමෙනෙවාහං ඔපම්මෙන භොතො කස්සපස්ස අත්තමනො අභිරද්ධො, අපිචාහං ඉමානි විචිත්‍රානි පඤ්හපටිභානානි සොතුකාමො එවාහං භවන්තං කස්සපං පච්චනීකං කාතබ්බං අමඤ්ඤිස්සං. අභික්කන්තං භො කස්සප! අභික්කන්තං භො කස්සප! සෙය්‍යථාපි භො කස්සප! නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය,

---

නොම සතුටු වූහ. මිත්‍රාමාත්‍යයෝ ද නොම සතුටු වූහ. (හෙතෙමේද) ඒ හේතු කොට ගෙණ සැපයක් සොම්නසක් නොම ලැබුවේය. යම් ඒ යහලුවෙක් වනාහි රන්මසු බර ගෙණ ගියේ ද, ඔහුගේ මවුපියනු ද සතුටු වූහ. අඹුදරුවෝ ද සතුටු වූහ. මිත්‍රාමාත්‍යයෝ ද සතුටු වූහ. (හෙතෙමේද) ඒ හෙතු කොට ගෙණ සැපයක් සොම්නසක් ලැබුයේය.

50. එපරිද්දෙන් ම රාජන්‍යය! තුඹ හණ වැහැරි මිටිය ගෙණ ගිය පුරුෂයා වැනි යයි මට වැටහෙන්නෙහිය. රාජන්‍යය! මේ ලාමක වූ මිථ්‍යාදෘෂ්ටිය දුරු කරව, තුඹට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස අවැඩ පිණිස මේ දෘෂ්ටිය නොවේවා යි වදාළසේක. එවිට රාජන්‍ය තෙමේ, පින්වත් කාශ්‍යපයන්ගේ පළමු උපමාවෙන්ම මම සතුටු සිත් ඇත්තේ විශෙෂයෙන් පැහැදුනෙමි. එසේ වුව ද මම මේ විසිතුරු ප්‍රශ්න වැටහීම් අසනු කැමැත්තෙම් භවත් කාශ්‍යපයන්ට විරුද්ධ වූවෙකු මෙන් කටයුතු යයි සිතුවෙමි. භවත් කාශ්‍යපය! ඔබගේ දෙශනාව ඉතා යහපත. භවත් කාශ්‍යපය! ඔබගේ දෙශනාව ඉතා යහපත, භවත් කාශ්‍යපය! යටිකුරු කොට තබන ලද්දක් හෝ යටිකුරු වූවක් යම් සේ උඩුකුරු කොට තබන්නේ ද, (තෘණ පර්ණාදියෙන්) වසන ලද්දක් යම් සේ විවෘත කරන්නේ ද හෙවත් වසුන් හැර තබන්නේ ද, මං මුළා වූවෙකුට (අතින් අල්වා) මේ මාර්ග යයි යම් සේ කියන්නේ ද, ඇස් ඇත්තෝ රූ දකිත්වා යී සිතා (කලුවර පක්‍ෂයෙහි) මාසේපෝයය, මධ්‍යම රාත්‍රිය, ඝන වන ලැහැබය, වලා පටලය යන සතර අඟින් යුත්) අන්ධකාරයෙහි යම් සේ තෙල් පහනක් දරන්නේ ද, එපරිද්දෙන් ම භවත් කාශ්‍යපයන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් ධර්මය දෙශනා කරණ ලද්දේය, භවත් කාශ්‍යපය! මේ මම ඒ භවත් ගෞතමයන් වහන්සේ ද, (එසේම සපර්‍යාප්තික නව

චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා කස්සපෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භො කස්සප තං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං කස්සපො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං.

51. ඉච්ඡාමි චාහං භො කස්සප මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං කස්සපො යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායාති. යථාරූපෙ බො රාජඤ්ඤ යඤ්ඤෙ ගාවො වා හඤ්ඤන්ති, අජෙ

ලොකොත්තර) ශ්‍රී සද්ධර්මය ද, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සඞ්ඝයා ද සරණ යමි. (එබැවින්) භවත් කාශ්‍යපයන් වහන්සේ අද පටන් මා දිවිහිමි කොට තෙරුවන් සරණ ගිය උපාසකයෙකු කොට දරණ සේක්වා යි කීය.

(මෙහිදී පායාසි රාජන්‍ය තෙමේ; යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කොට තබන්නාක් මෙන් සද්ධර්මයට ප්‍රතිපක්‍ෂ වූ අසද්ධර්මයෙහි පිහිටි මා එයින් නගා සිටුවමින් ද, වැසී තුබුන යමක් විවෘත කොට තබන්නාක් මෙන් කාශ්‍යප බුදුරජානන් වහන්සේගේ ශාසනාන්තර්ධානයෙහි පටන් මිථ්‍යාදෘෂ්ටි නැමති වන ලැහැබින් වැසී තුබුනු ශාසනය විවෘත කොට තබමින් ද, මං මුළා වූවකුට මාර්ගය කියා දෙන්නාක් මෙන් නපුරු මාර්ග නැමති මිථ්‍යා මාර්ගයට පිළිපන් මට ස්වර්ගමොක්‍ෂ මාර්ග ප්‍රකාශ කරමින් ද, අඳුරෙහි තෙල් පහනක් දරන්නාක් මෙන් මොහාන්ධකාරයෙහි නිමග්න වූ බුද්ධාදී රත්නයන් නො දක්නා වූ මට ඒ මොහාන්ධකාරය විනාශ කරණ ධර්මදෙශනා නැමති පහන දරමින් ද පින්වත් කාශ්‍යපයන් වහන්සේ විසින් නොයෙක් පරිද්දෙන් ධර්මය දෙශනා කරණ ලද්දේ යයි ධර්මදෙශනාවට ප්‍රශංසා කොට ඉක්බිති පරලෙව් ආදිය නැතැයි තමන් ගෙණ තුබුනු මිථ්‍යාදෘෂ්ටිය සහමුලින් දුරු කොට දිවිහිමියෙන් තෙරුවන් සරණ ගියේය. ඉන් පසු හෙතෙමේ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයයි.)

51. භවත් කාශ්‍යපයන් වහන්ස! මම මහා යාගයක් කරන්නට ද කැමැත්තෙමි, යම් පරිද්දකින් එය මට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස සැප පිණිස වන්නේ ද, එපරිද්දෙන් භවත් කාශ්‍යපයන් වහන්සේ මට අනුශාසනා කරණ සේක්වා. (එවිට තෙරනු වදාරණ සේක්:) රාජන්‍යය! යම්බඳු යාගයක වනාහි ගවයෝ හෝ නසනු ලැබෙත් ද, එළු බැටළුවෝ හෝ

ළකා වා හඤ්ඤන්ති, කුක්කුටසූකරා වා හඤ්ඤන්ති, විවිධා වා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති, පටිග්ගාහකා ච හොන්ති මිච්ඡාදිට්ඨී මිච්ඡාසඞ්කප්පා මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තා මිච්ඡාආජීවා මිච්ඡාවායාමා මිච්ඡාසති මිච්ඡාසමාධී. එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො. සෙය්‍යථාපි රාජඤ්ඤ කස්සකො බීජනඞ්ගලමාදාය වනං පවිසෙය්‍ය. සො තත්ථ දුක්ඛෙත්තෙ දුබ්භූමෙ අවිහතඛාණුකණ්ටකෙ බීජානි පතිට්ඨාපෙය්‍ය ඛණ්ඩානි පූතීනි වාතාතපහතානි අසාරාදානි අසුඛසයිතානි. දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. අපිනු තානි බීජානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුං? කස්සකො වා විපුලං ඵලං අධිගච්ඡෙය්‍යාති? නො හිදං භො කස්සප! එවමෙව ඛො රාජඤ්ඤ -පෙ- න මහා විප්ඵාරො.

නසනු ලැබෙත් ද, කුකුළු සූකරයෝ හෝ නසනු ලැබෙත් ද, නන් වැදෑරුම් ප්‍රාණීහු හෝ විනාශයට පැමිණෙත් ද, ප්‍රතිග්‍රාහකයෝත් මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාසඞ්කල්පනා ඇත්තාහු, මිථ්‍යා වචන ඇත්තාහු, මිථ්‍යා කර්මාන්ත ඇත්තාහු, මිථ්‍යා ආජීව ඇත්තාහු, මිථ්‍යා ව්‍යායාම ඇත්තාහු, මිථ්‍යා සමෘති ඇත්තාහු, මිථ්‍යා සමාධි ඇත්තාහු වෙත් ද, රාජඤ්ඤය! මෙබඳු යාගය තෙමේ (විපාක ඵල වශයෙන්) මහත් ඵල ඇත්තේ නො වේ. (ගුණානිසංස වශයෙන්) මහත් අනුසස් ඇත්තේත් නොවේ. (ආනුභාව නැමති බැබලීම් වශයෙන්) මහත් බැබලීම් ඇත්තේත් නො වේ. (විපාක පැතිරීම් වශයෙන්) මහත් පැතිරීම් ඇත්තේත් නො වේ. රාජන්‍යය! යම්සේ ගොවියෙක් බිජුවට හා නඟුලක් ගෙණ වනයට පිවිසෙන්නේ ද, හෙතෙමේ එහි නො නසන ලද කණු හා කටු ඇති විෂම භූමිභාගයක් වූ නිසරු කෙතක සුන් බුන් වූ නිස්සාර වූ අව් සුළඟින් නසන ලද්දා වූ සහල් හර ගැණිමක් නැත්තා වූ හෙවත් බොල් වූ සුවසේ සය නය නො කළා වූ හෙවත් වියලවා කොටුවෙහි අතුරා නො තබන ලද්දා වූ බිජුවට වපුරන්නේය. මෙඝය ද කලින්කල වැසිධාරාව මනාකොට නො පමුණුවන්නේය. එසේ කල ඒ බීජයෝ (උඩට පැළ නැගීම් වශයෙන්) වැඩීමට ද (යටට මුල් ඇදීම් වශයෙන්) විරූඪ භාවයට ද (භාත්පස පැතිරීමෙන්) විපුල භාවයට ද පැමිණෙන්නාහුද? ගොවියා හෝ මහත් ඵලයක් ලබන්නේ දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! එය නො වන්නේය. එපරිද්දෙන්ම රාජන්‍යය! -පෙ- මෙබඳු දානය -පෙ- මහත් පැතිරීම් ඇත්තේත් නො වේ.

52. යථාරූපෙ ච ඛො රාජඤ්ඤ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤන්ති. න අජෙළකා හඤ්ඤන්ති. න කුක්කුටසූකරා හඤ්ඤන්ති. න විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති. පටිග්ගාහකා ච හොන්ති සම්මාදිට්ඨී සම්මාසඞ්කප්පා සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීවා සම්මාවායාමා සම්මාසතී සම්මාසමාධී. එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො. සෙය්‍යථාපි රාජඤ්ඤ -පෙ- සුඛෙත්තෙ සුභූමෙ සුවිහතඛාණුකණ්ටකෙ බීජානි පතිට්ඨාපෙය්‍ය අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරදානි සුඛසයිතානි. දෙවො ච කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. අපිනු තානි -පෙ- අධිගච්ඡෙය්‍යාති? එවං භො කස්සප, එවමෙව ඛො -පෙ- මහා විප්ඵාරොති.

---

52. රාජන්‍යය! යම් බඳු යාගයෙක වනාහි ගවයෝ නො මරණු ලැබෙද් ද, අජෙළකයෝ (එළු බැටළුවෝ) නො මරණු ලැබෙද් ද, කුක්කුට සූකරයෝ (කුකුළන් හා ඌරෝ) නො මරණු ලැබෙද් ද, නන්වැදෑරුම් ප්‍රාණීහු විනාශයට නො පැමිණෙද් ද, ප්‍රතිග්‍රාහකයෝත් සම්‍යග්දෘෂ්ටි ගත්තාහු, -පෙ- සම්‍යක් සමාධි ඇත්තාහු වෙද් ද, රාජන්‍යය! මෙබඳු යාගය තෙමේ වනාහි (පර හිංසාවෙන් තොරව උපන් ප්‍රත්‍යයක් බැවින් ද, පරූපඝාතනයෙන් වෙන් වූ සිල්වත් දායකයෙකු බැවින් ද, සම්‍යග්දෘෂ්ටි ආදී ගුණ සමන්විත ප්‍රතිග්‍රාහකයන් බැදින් ද) මහත් ඵල ඇත්තේ වේ. (ඉදින් වනාහි ගුණයෙන් අධික වූ නිරොධ සමාපත්තියෙන් නැගී සිටි ප්‍රතිග්‍රාහකයෙකු ලැබුවේ නම් ඉහාත්ම භාවයෙහිම විපාක දෙයි) මහත් අනුසස් ඇත්තේ වෙයි. මහත් බැබලීම් ඇත්තේ වෙයි. මහත් පැතිරීම් ඇත්තේ වෙයි. රාජන්‍යය! යම්සේ ගොවියෙක් -පෙ- මොනවට නසන ලද කණු හා කටු ඇති යහපත් භූමිභාගයක් වූ සරු කෙතක සුන්බුන් නො වූ සාර වූ අවු සුළඟින් නො නසන ලද්දා වූ බොල් නො වූ සැපසේ සයනය කළා වූ බිජුවට වපුරන්නේ නම් වැස්ස ද කලින් කල මනා කොට වස්නේ නම්, එකල්හි ඒ බීජයෝ වැඩීමට විරූඪ භාවයට විපුල භාවයට පැමිණෙන්නාහු ද? ගොවියා හෝ විපුල ඵල ලබන්නේ දැයි ඇසූහ. භවත් කාශ්‍යපය! එසේ යයි පිළිතුරු දිනි. එපරිද්දෙන්ම -පෙ- මෙබඳු දානය -පෙ- මහත් පැතිරීම් ඇත්තේ වන්නේ යයි වදාළහ.

53. අථ ඛො පායාසි රාජඤ්ඤො දානං පට්ඨපෙසි සමණබ්‍රාහ්මණකපණද්ධිකවණිබ්බකයාචකානං. තස්මිං ඛො පන දානෙ එවරූපං භොජනං දීයති, කණාජකං බිලඞ්ගදුතියං, ථෙරකානි ච වත්ථානි ගුළවාලකානි. තස්මිං ඛො පන දානෙ උත්තරො නාම මාණවො ව්‍යාවටො අහොසි. සො දානං දත්වා එවමනුද්දිසති: ඉමිනාහං දානෙන පායාසිං රාජඤ්ඤමෙව ඉමස්මිං ලොකෙ සමාගච්ඡිං මා පරස්මින්ති. අස්සොසි ඛො පායාසි රාජඤ්ඤො උත්තරො කිර මාණවො දානං දත්වා එවමනුසද්දිති. පෙ අථ ඛො පායාසි රාජඤ්ඤො උත්තරං මාණවං ආමන්තාපෙත්වා එතදවොච: සච්චං කිරං ත්වං තාත උත්තර දානං දත්වා එවමනුද්දිසසි -පෙ- එවං හොති. කිස්ස පන භො -පෙ- නනු මයං තාත උත්තර පුඤ්ඤත්ථිකා දානස්සෙව ඵලං පාටිකඞ්ඛිනොති?

---

53. ඉක්බිති පායාසිරාජන්‍ය තෙමේ ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී වණිබ්බක යාචකයන්ට දානයක් දෙන්නට පටන් ගත්තේය. (පායාසිරාජන්‍ය තෙමේ කුමාර කාශ්‍යපයන් වහන්සේගේ ධර්ම දෙශනාව අසා පැහැද උන්වහන්සේ පවරා සද්දවසක් මුළුල් ලෙහි මහදන් දී ඉන් පසු සියලු ජනයා විෂයෙහි ද දානයක් පිහිටු විය. ඒ සඳහා මේ කියන ලදී.) ඒ දානයෙහි වනාහි මෙබඳු හොජනයක් දෙනු ලැබේ. එනම්: කාඩි හොද්දක් දෙවැනි කොට ඇති නිවුඩුහාලේ බතකි. එසේම පොදි පොදි වසයෙන් පිහිටි මහත් දහවලු ඇති සථූල වූ වස්ත්‍ර ද දෙනු ලැබේ. ඒ දානයෙහි වනාහි උත්තර නම් මාණවකයෙක් (කට යුතු කිරිමෙහි) ව්‍යාපෘත විය. හෙතෙමේ දන් දී "මේ දානයෙන් මම පායාසිරාජන්‍යයන් හා මෙලොවදී පමණක් එක් වූයෙමි. පරලොවදී මෙසේ එක් නො වෙම්වා" යි මෙසේ නැවත නැවත කියයි. උත්තර මාණවකයා දන් දී -පෙ- මෙසේ නැවත නැවත කියයි යනු පායාසිරාජන්‍ය තෙමේ ඇසුයේය. ඉක්බිති හෙතෙමේ උත්තර මාණවකයා අමතවා, සැබෑ ද? දරුව! උත්තරය! නුඹ දන් දී -පෙ- මෙසේ නැවත නැවත කියෙහි දැ?යි විචාළේය. එසේය පින්වතැයි කීය. කුමක් හෙයින් පින්වත! -පෙ- මෙසේ, කියෙහි ද? දරුව! උත්තරය! අපි පින් කැමැත්තෝ දානයෙහි ඵලයම බලාපොරොත්තු වන්නෝ නොවෙමු දැ?යි ඇසුවේය.

54. භොතො ඛො පන දානෙ එවරූපං භොජනං දියති, කණාජකං බිලඞ්ගදුතියං. භවං පාදාපි න ඉච්ඡෙය්‍ය ඡුපිතුං කුතො භුඤ්ජිතුං. ථෙරකානි ච -පෙ- කුතො පරිදහිතුං. භවං ඛො පන 'මහාකං පියො මනාපො, කථං මයං මනාපං අමනාපෙන සංයොජෙමාති? තෙන හි ත්වං තාත උත්තර යාදිසාහං භොජනං භුඤ්ජාමි තාදිසං භොජනං පට්ඨපෙහි, යාදිසානි චාහං වත්ථානි පරිදහාමි තාදිසානි ච වත්ථානි පට්ඨපෙහීති එවං භො ති ඛො උත්තරො මාණවො පායාසිරාජඤ්ඤස්ස පටිස්සුත්වා යාදිසං භොජනං පායාසිරාජඤ්ඤො භුඤ්ජති තාදිසං භොජනං පට්ඨපෙසි. යාදිසානි ච වත්ථානි පායාසිරාජඤ්ඤො පරිදහති තාදිසානි ච වත්ථානි පට්ඨපෙසි. අථ ඛො පායාසිරාජඤ්ඤො අසක්කච්චං දානං දත්වා අසහත්ථා දානං දත්වා අචිත්තීකතං දානං දත්වා අපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජි සුඤ්ඤං සෙරිස්සකං විමානං. යො පන තස්ස

---

54. (මාණවක තෙම කියනුයේ:) පින්වත්හුගේ දානයෙහි වනාහි මෙබඳු භොජනයක් දෙනු ලැබේ. එනම්, කාඩි හොද්ද දෙවෙනි කොට ඇති නිවුඩුහාලේ බතකි. භවත් තෙමේ එය පාදයෙන් ද සපර්‍ශ කරන්ට කැමති නො වන්නේය කෙසේ නම් අනුභව කරන්ට කැමති වන්නේ ද? එසේම සථූල වූ වස්ත්‍ර ද -පෙ- කෙසේ නම් පරිදහනය කරන්ට හෙවත් අඳින්ට කැමති වන්නේ ද? භවත් තෙමේ වනාහි අපට ප්‍රිය වෙයි, මනාප වෙයි, කෙසේ අපි මනාප වූ භවත්හු අමනාපයක් හා යොදමු දැ?යි ඇසීය. දරුව! උත්තරය! එසේ වී නම් තුඹ යම්බඳු වූ භොජනයක් මම අනුභව කෙරෙම් ද, එබඳු වූ භොජනයක් දාන විෂයෙහි පිහිටුවව. යම්බඳු වූ වස්ත්‍ර මම අඳිම් ද, එබඳු වූ වස්ත්‍රද පිහිටුවව යි රාජන්‍යතෙමේ කීය. එසේය පින්වතැයි කියා උත්තර මාණවක තෙමේ පායාසිරාජන්‍යහට පිළිතුරු දී (එතැන් පටන්) යම්බඳු භොජනයක් හෙතෙමේ අනුභව කෙරේ ද, එබඳු භොජනයක් දාන විෂයෙහි පැවැත්විය. එසේම යම්බඳු වස්ත්‍රයන් අඳී නම් එබඳු වස්ත්‍ර ද දන් දිනි. ඉක්බිති පායාසි රාජන්‍ය තෙමේ නො සකසා දන් දී, අත් අතින් දන් දී, නො සැදැහැයෙන් දන් දී, අගෞරවයෙන් දන් දී, කය බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන්ගේ සහභාවය ඇති ශූන්‍ය වූ සෙරිස්සක නම් වූ රිදී විමානයකට පැමිණුනේය. හෙවත් චාතුර්මහාරාජික දෙව්ලොව හිස් වූ රිදී විමනක උපන්නේය. (ඒ විමන් දොරටුවෙහි මහත් වූ මහරි රුකෙක් වෙයි.

දානෙ ව්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා චිත්තීකතං දානං දත්වා අනපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජි දෙවානං තාවතිංසානං සහබ්‍යතං.

55. තෙන ඛො පන සමයෙන ආයස්මා ගවම්පති අභික්ඛණං සුඤ්ඤං සෙරිස්සකං විමානං දිවාවිහාරං ගච්ඡති අථ ඛො පායාසී දෙවපුත්තො යෙනායස්මා ගවම්පති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ගවම්පතිං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතං ඛො පායාසිං දෙවපුත්තං ආයස්මා ගවම්පති එතදවොච: කොසි ත්වං ආවුසොති? අහං භන්තෙ පායාසිරාජඤ්ඤොති. නනු ත්වං ආවුසො එවං දිට්ඨිකො අහොසි, ඉතිපි නත්ථි -පෙ- විපාකොති? සච්චාහං භන්තෙ එවං දිට්ඨිකො අහොසිං ඉතිපි නත්ථි

එහෙයින් ඒ විමන සෙරිස්සක නම් විය.) උත්තර නම් වූ යම් ඒ මාණවකයෙක් ඔහුගේ දානයෙහි ව්‍යාපෘත වීද, හෙතෙමේ (අනුන් සතු දෙය වුව ද)සකසා දී, සියතින් දන් දී, ප්‍රණීත ලෙස දන් දී, ගෞරවයෙන් දන් දී තව්තිසා දෙවියන්ගේ සහභාවය ඇති සහපත් ගති ඇති සවර්ගී ලොකයට පැමිණියේය. හෙවත් තව්තිසා දෙව්ලොව උපන්නේය.

55. එසමයෙහි වනාහි ආයුෂ්මත් ගවම්පති ස්ථවිරයන් වහන්සේ හිස් වූ සෙරිස්සක නම් විමානයට නිතර දිවාවිහරණයට වඩිති. (ඒ ගවම්පති ස්ථවිර තෙමේ වනාහි පෙර මිනිස් කල නොපලු දරුවන්ට දෙවු වූයේ මහත් වූ මහරි රුකක් මුල පිරිසිදු කොට වැලි අතුරා එක් පිණ්ඩපාතික තෙර කෙනෙකුන් එහි වඩා හිඳුවා තමන් ලද ආහාරය පුද, එයින් චුතව ඒ දානයෙහි ආනුභාවයෙන් ඒ රිදී විමනෙහි උපන්නේය. මහරි රුක විමන් දොරටුවෙහි පිහිටියේය. එය පණස් වසකට වරක් පලගණී. එහෙයින් හෙතෙමේ පණස් වසක් ඉක්මුනේ යයි සංවෙගයට පැමිණෙයි. පසු කලෙක උන්වහන්සේ අප බුදුන් සමයෙහි මිනිස් ලොව ඉපිද ශාස්තෲන් වහන්සේගේ ධර්මදෙශනාව අසා රහත් බවට පැමිණි සේක.පෙර පුරුද්ද වසයෙන් දිවාවිහරණය පිණිස ඒ විමනටම නිතර වැඩමවන සේක.) එකල්හි වනාහි පායාසි දිව්‍යපුත්‍ර තෙමේ ආයුෂ්මත් ගවම්පති ස්ථවිරයන් වහන්සේ වෙත එළඹුනේය. එළඹ උන්වහන්සේට මනාකොට වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටියා වූ ඔහට ආයුෂ්මත්

-පෙ- විපාකොති. අපි චාහං අය්‍යෙන කුමාරකස්සපෙන එතස්මා
පාපකා දිට්ඨිගතා විවෙචිතොති. යො පන තෙ ආවුසො දානෙ
බ්‍යාවටො අහොසි උත්තරෙ නාම මාණවො, සො කුහිං
උප්පන්නොති? යො මෙ භන්තෙ දානෙ බ්‍යාවටො අහොසි උත්ත
රො නාම මාණවො, සො සක්කච්චං -පෙ- උපපන්නො දෙවානං
තාවතිංසානං සහබ්‍යතං. අහං පන භන්තෙ අසක්කච්චං දානං දත්වා
-පෙ- සෙරීසකං විමානං.

56. තෙන හි භන්තෙ ගවම්පති මනුස්සලොකං ගන්ත්වා එව
මාරොචෙහි: සක්කච්චං දානං දෙථ, සහත්ථා දානං දෙථ, චිත්තීකතං
දානං දෙථ, අනපවිද්ධං දානං දෙථ, පායාසිරාජඤ්ඤො අසක්කච්චං
-පෙ- උපපන්නො සුඤ්ඤං සෙරීසකං විමානං. යො පන තස්ස
දානෙ බ්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො, සො

ගවම්පති තෙරණුවෝ මෙසේ වදාළහ. ඇවැත්නි! නුඹ කවරෙක්
වෙහි ද? ස්වාමිනි! මම පායාසිරාජන්‍ය වෙමි. ඇවැත්නි! නුඹ
මේ කාරණයෙන් ද පරලොවෙක් -පෙ- විපාක නැතැයි මෙසේ
දෘෂ්ටි ඇත්තෙක් වූයේ නො වෙහි ද, ස්වාමිනි! ඒ මම මේ කාරණ
යෙන් ද පරලොවෙක් -පෙ- විපාක නැතැයි මෙසේ දෘෂ්ටි
ඇත්තෙක් විමි. එතෙකුදු වුවත් ආයුෂ්මත් වූ කුමාර කාශ්‍යප
යන් වහන්සේ විසින් මම මේ ලාමක මිථ්‍යාදෘෂ්ටියෙන් තොර
කරණ ලද්දේ වෙමි. ඇවැත්නි! උත්තර නම් වූ යම් ඒ මාණ
වකයෙක් තාගේ දන යෙහි ව්‍යාපෘතවී ද, හෙතෙම කොහි උපන්
නේ ද? ස්වාමිනි! උත්තර නම් යම් මාණවකයෙක් මාගේ දන
යෙහි ව්‍යාපෘත වී ද, හෙතෙමේ -පෙ- තව්තිසා දෙව්ලොව උපන්
නේය. ස්වාමීනි! මම වනාහි නො සකසා දන් දී -පෙ-
සෙරිස්සක විමානයෙහි උපන්නෙමි.

56. එසේ වී නම් ස්වාමීනි ගවම්පති ස්ථවිරයන් වහන්ස
මිනිස් ලොවට වැඩමවා මෙසේ සැලකරණු මැනව. කෙසේ ද
යත්? සකසා දන් දෙව්. සියතින් දන් දෙව්. සැදැහැයෙන් දන්
දෙව්. ගෞරවයෙන් දන් දෙව්. පායාසිරාජන්‍ය තෙමේ -පෙ-
හිස් වූ සෙරිස්සක විමානයෙහි උපන්නේය. යම් උත්තර නම්
මාණවකයෙක් ඔහුගේ දානයෙහි ව්‍යාපෘත විද, හෙතෙමේ
-පෙ- තව්තිසා දෙව්ලොව උපන්නේ යයි කියායි. ඉක්බිති
ආයුෂ්මත් ගවම්පති ස්ථවිරයන් වහන්සේ මිනිස් ලොවට වැඩමවා

සක්කච්චං -පෙ- තාවතිංසානං සහබ්‍යතන්ති. අථ ඛො ආයස්මා ගවම්පති මනුස්සලොකං ආගන්ත්වා එවමාරොචෙසි: සක්කච්චං දානං දෙථ, පෙ දෙවානං තාවතිංසානං සහබ්‍යතන්ති

පායාසිරාජඤ්ඤසුත්තං නිට්ඨිතං.

සකසා දන් දෙව්. -පෙ- තව්තිසා දෙව්ලොව උපන්නේ යයි මෙසේ (පායාසි දිව්‍යපුත්‍රයා කී පරිද්දෙන්ම) සැළ කළ සේක. (ඒ තෙරුන් වහන්සේගේ සැළ කිරීම අසා ද මහජන තෙමේ සකසා දන් දී දෙව්ලොව උපන්නේය. පායාසිරාජන්‍යයාගේ භාර්‍ය්‍යා තොමෝ වනාහි සකසා දන් දී ද තෘෂ්ණා වසයෙන් ගොස් ඔහු සමීපයෙහිම උපන්නිය.)

පායාසිරාජඤ්ඤ සූත්‍රය නිමියේය.

පායාසිරාජඤ්ඤ සූත්‍රය.

කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ ගෙණ හැර දැක්වූ කරුණුවලින් පායාසි රාජන්‍යයා ගෙණ තුබුන මිථ්‍යාදෘෂ්ටිය දුරු කොට ඔහු තෙරුවන් සරණ ගිය පරිදිත්, එසේම ඔහු ඉන් පසු කුසල් කොට දෙව්ලොව උපන් පරිදිත් මෙහි විස්තර වශයෙන් දැක්වේ. හෙතෙමේ වනාහි පරලොවක් හෝ මැරී උපදනා සත්ත්වයෙක් හෝ කුශලාකුශල කර්මයන්ගේ විපාක හෝ නැතැයි මෙසේ නාස්තික දෘෂ්ටියක් ගෙණ සිටියේය.

මිථ්‍යාදෘෂ්ටිය.

විපරීත දර්ශනය හෙවත් අයථා ස්වභාවයෙන් දැක්ම මිථ්‍යා දෘෂ්ටි යයි. යමෙක් යමක් ඇති හැටියෙන් නො දැක අන් අයුරකින් දකී නම් හෙතෙම මිථ්‍යාදෘෂ්ටිකයෙකි. ඒ මේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රභෙද වශයෙන් ද්වාෂෂ්ටිවිධ (දෙසැටක්) වේ. බ්‍රහ්මජාල සූත්‍රයේ විස්තර පෙණේ. ඒ සියල්ල කොටස් තුණක් කොට දැක්විය හැක්කේය. එනම්:— 1. සඟාවරණ වූ ද මඟාවරණ වූ ද කොටසය. 2. මඟාවරණ වූ සඟාවරණ නො වූ කොටසය. 3. සඟාවරණ ද නො වූ මඟාවරණ ද නො වූ කොටසය කියායි. එහි ඔබුනොවුන් විඳිනා සැප දුක්වලට හෙතුවක් නැත, ප්‍රත්‍යයක් නැතැයි ගන්නා අහෙතුක දෘෂ්ටිය- හොඳ නරක ක්‍රියා වලින් ලැබිය යුතු ඵල විපාකයක් නැතැයි ගන්නා

අකිරිය දෘෂ්ටිය- දෙන ලද දානාදියට, කළ පින් පව් වලට ඵල විපාක නැත යනාදීන් ගන්නා නාස්තික දෘෂ්ටිය යන මොහු ස්වර්ග්‍ය වළකන්නාහු ද, සෝවාන් ආදී මාර්ග්‍ය වළකන්නාහු ද වෙති. ලෝකය ශාශ්වතය- අශාශ්වතය- අනන්තවත්ය- අනන්ත වත්ය යනාදි වශයෙන් ගන්නා දශවස්තුක (අන්තග්‍රාහක) මිථ්‍යාදෘෂ්ටි තොමෝ මාර්ග්‍ය පමණක් වළකන්නී වෙයි. ස්වර්ග්‍ය නො වළකයි. පඤ්ච ස්කන්ධයෙහි සතර සතර ආකාරයෙන් ගන්නා විංශතිවිධ සත්කාය දෘෂ්ටිය (=ආත්මදෘෂ්ටිය) ස්වර්ගාවරණ ද මාර්ගාවරණ ද නො වේ. එහෙත් සාමාන්‍යයෙන් සලකන විට මිථ්‍යාදෘෂ්ටිය බරපතල අකුශලයකි. දශ අකුශල කර්මපථයෙන් එකකි.

''නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ වජ්ජානි'' යන්නෙන් තථාගතයන් වහන්සේ එහි බරපතළ කම වදාළ සේක. මිථ්‍යාදෘෂ්ටිය තරම් මහත් වරද සහිත වූවක් උන්වහන්සේ බුදු ඇසින් පවා නො දක්නා බවත්, ඒ මිථ්‍යාදෘෂ්ටිය සියලුම අකුශලයන්ට වඩා බලවත් බවත් එයින් ප්‍රකාශ වේ. ඒකාන්තයෙන් මහාසාවද්‍ය වූ කර්මයෝ පස්දෙනෙකි. එනම්: ආනන්තර්‍ය්‍ය කර්මයෝ යි. ඒ කර්මයන් කළ කෙනෙක් මරණින් මතු නිරයෙහි උපදිත්. සඞ්ඝභේදය කළෝ ද කල්ප යක් මුළුල්ලෙහි පැසී ඉන් මිදෙති. එබැවින් ඒ කර්මයන්ගේ සීමාවක් කෙළවරක් ඇත්තේය. නමුත් මිථ්‍යාදෘෂ්ටිය එසේ නොවේ. නියත මිථ්‍යාදෘෂ්ටිය ගත් පුද්ගලයා කල්පාන්තයෙහි වත් ඉන් නො මිදේ. නිරයෙහි ම පැසෙයි. මෙසේ හෙයින් මිථ්‍යාදෘෂ්ටිය ආනන්තර්‍ය්‍ය කර්මයන්ටත් වඩා බලවත් අකුශලයක් බව කිව යුතුය. අයථාස්වභාවයෙන් හෙවත් නුනුවණින් කල්පනා කිරීමාදිය එය ඇතිවීමට හෙතුයි. එසේ යමෙක් මිථ්‍යා දෘෂ්ටි ගත්තේ නම් ඉන් පසු හෙතෙමේ දෘෂ්ටිය වූ පරිදි කයින් යමක් කෙරේ ද, මුවෙන් යමක් කියා ද, සිතින් යමක් සිතා ද, ඒ සියල්ල ම ඔහුට අහිත පිණිස අවැඩ පිණිස පවතී. ලාමක දෘෂ්ටියෙන් කරණ කිසිවකින් සැප විපාක බලාපොරොත්තු විය නො හැක. එහෙයින් වදාළහ. **මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිස පුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං-පෙ-යඤ්ච මනොකම්මං යථා දිට්ඨි සමත්තං සමාදින්නං, යාච චෙතනා-පෙ-යා ච පත්ථනා-පෙ-යො ච පණිධි-පෙ-යෙ ච සඞ්ඛාරා-පෙ-සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති.**

යුතුයි. පොළොවෙහි සිටුවන ලද කොසඹ ඇටයක් හෝ තිත්ත වැටකොලු ඇටයක් හෝ නිතතලබු ඇටයක් හෝ යම් පොළෝ රසයකුත් යම් දිය රසයකුත් ඇදගණී නම් එය ඒ ඒ වර්ගවල තිත්ත රසය හටගැණීම පිණිස ද, රළු බව හටගැණීම පිණිස ද, අමිහිරි බව හටගැණීම පිණිස ද, වෙයි. මක්නිසා ද? සිටුවන ලද බීජය නරක එකක් හෙයිනි. එසේම මිදි ආදී මිහිරි වර්ගයක බීජයක් සිටවූ කල එයට ඇදගන්නා පොළෝ රසයත් ජල රසයත් එහි මිහිරි බව හටගැණීම පිණිස පවතී. බීජය යහපත් එකක් හෙයිනි. එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි ගත් පුද්ගලයා දෘෂ්ටිය වූ පරිදි කරණ කියන සිතන හැම එකක්ම ඔහුට අහිත අවැඩ පිණිස ද, සම්‍යග් දෘෂ්ටි ගත් පුද්ගලයා දෘෂ්ටිය වූ පරිදි කරණ කියන සිතන හැම එකක්ම ඔහුට හිත වැඩ පිණිස ද පවතී. මෙසේ හෙයින් පළමු කොට කටයුත්තේ බරපතළ වරදක් වූ මිථ්‍යාදෘෂ්ටියෙන් හිත මුදා ගැණීම යි. ඉන්පසු ඔහුට දෙලොව යහපත සලසාගත හැක්කේය.

කුමාරකාශ්‍යපස්ථවිරයන් වහන්සේ බොහෝ දුරට කරුණු දක්වූ පසු, තමන්ට දොස් කියන්නවුන් කෙරෙහි උපදනා කෝපයට බියෙන් හා සිය සිත්හි පවත්නා මක්ඛ පලාසයන් හෙතු කොට ගෙණ ද තමන්ගේ දෘෂ්ටිය අත් නොහරණ බව පායාසිරාජන්‍ය තෙමේ කීය. එහි **කෝපය** නම් ක්‍රොධය යි. ද්වෙෂ, ආඝාත, ව්‍යාපාද යනාදි නාමයෝ ද ඊට ම යෙදෙති. මෙය ද බලවත් අකුශල ධර්මයකි. අකුශල මූලයකි. ප්‍රභෙද වශයෙන් නවවිධ වේ. **අනත්ථං මෙ අචරි චරති චරිස්සතීති ආඝාතො ජායති** යනාදීන් ඒ විස්තර වේ. මට අනර්ථයක් කෙළේය. දැන් කෙරෙයි, මතු කාලයෙහි කරන්නේය යන තුන් අයුරින් ද, මාගේ ප්‍රියයාට අනර්ථයක් කෙළේය, කෙරෙයි, කරන්නේය යන තුන් අයුරින් ද, මාගේ හතුරාට යහපතක් කෙළේය, කෙරෙයි, කරන්නේය යන තුන් අයුරින් දැයි මෙසේ නව ආකාරයකින් ක්‍රොධය උපදී. මීටම අස්ථාන ක්‍රොධයත් එක්කිරීමෙන් කෝපය දශ වැදෑරුම් වන බව ද ප්‍රකාශ වේ. අස්ථාන ක්‍රොධය නම් නිකරුණේ කිපීම යි. පය පැකුළුනු විටක හෝ අවු සුළඟ ආදියට හෝ යමෙක් කිපේ නම් ඒ අස්ථාන ක්‍රොධ යයි දත යුතුයි.

මක්ඛ නම් ගුණමකු කමයි, හෙවත් අනුන්ගේ ගුණයන් මකන නැති කරණ ස්වභාව යයි. එයින් යුක්ත වූ පුද්ගල තෙමේ කිසිවෙකුගේ ගුණයක් කියන්ට හෝ අනිකෙකු එසේ කියන කල එය අසන්ට හෝ කැමති නොවේ. එහෙයින් හේ ගුණවතුන්ගේ අගුණ කියයි. යමෙක් ගුණ කියා නම් ඊට ද බාධා කෙරෙයි.

පලාශ නම් යුගග්‍රාහ යයි. අන්‍යා ගුණවන්තයන් හා සමානත්වයෙහි සිටින ගති යයි. එයින් යුක්ත වූ පුද්ගල තෙමේ උසස් ගුණවතුන් හා තමන් ද සමගුණ ඇති බැවින් තකයි, හෙවත් යමෙකුගේ ගුණ කියන විට තමා ද ඒ ගුණයන්ගෙන් යුක්ත බව පවසයි. මේ සියල්ල චිත්තෝපක්ලේශ ධර්මයෝ වෙති. එබැවින් ඔහු හිතේ ඉපිද හිත කිලිටි කරත්. ස්වභාවයෙන් හිත පිරිසිදු වුව ද මේ ලාමක ගතිවලින් දූෂිත වෙයි. එසේ හිත කිලිටි වූ කල ත්‍රිවිධ ද්වාරයෙන්ම අකුශල් රැස් කෙරෙයි. මෙසේ හෙයින් පරලොව යහපත බලාපොරොත්තු වන්නන් විසින් මේ ලාමක ධර්මයෝ ද දුරු කටයුත්තාහ.

සාණභාරෝපමායෙහි—හණ බර ගෙණ ගිය පුරුෂයාගේ මවුපියන් සතුටු නො වූ බවත්, රන් බර ගෙණ ගිය පුරුෂයාගේ මවුපියන් සතුටු වූ බවත් දක්වන ලදී.

මාතෘපිතෘපස්ථානය.

මවුපියන් සතුටු කිරීම දරුවන්ගේ බලවත් යුතුකමකි. දරුවන් හදන මවුපියෝ ඔවුන්ගෙන් කරුණු පහක් බලාපොරොත්තු වෙති. **"පඤ්චිමානි භික්ඛවෙ ඨානානි සම්පස්සන්තා මාතාපිතරො පුත්තං ඉච්ඡන්ති කුලෙ ජායමානං. කතමානි පඤ්ච? භතො වා නො භරිස්සති. කිච්චං වා නො කරිස්සති. කුලවංසො චිරං ඨස්සති. දායජ්ජං පටිපජ්ජති. අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සතීති"** යන්නෙන් ඒ බව බුදුරජානන් වහන්සේ වදාළසේක.

1. අප විසින් කිරි පෙවීම්, අත් පා වැඩීම් ආදි වශයෙන් පිළිදැගුම් කරණලද දරුවා අප මහලු කල අපගේ අත් පා දෙවීම් නැවීම් කැඳබත් දීම් ආදියෙන් අප පොෂණය කරන්නේය. 2. තමන්ගේ කටයුතු තිබෙද්දීත් ඊට පළමු අපගේ කටයුතු කරන්නේය. 3. දරුවන් අප සතු කෙත් වත් රන් රුවන් ආදිය විනාශ නොකොට රක්නා කල්හි අපගේ කුල පරම්පරාව බොහෝ කාලයක් මුළුල්ලෙහි පවතින්නේය. නොහොත් අප විසින් පවත්වනලද සලාකභත්තාදිය අපගේ දරුවෝද නොකඩවා පවත්වන්නාහුය. එපරිද්දෙන් ද අපගේ කුල වංශය බොහෝ කලක් මුළුල්ලෙහි පවතින්නේය. 4. අපගේ කුල පරම්පරාවට අනුකූල පිළිවෙතින් තමන් දාවැද්දට සුදුස්සෙකු කරමින් අප සතු දාවැද්ද ලබන්නේය. 5. තවද, 'අප කාලක්‍රියා කළ කල්හි දන් දී අපට පින් පමුණුවන්නේය. යන මේ කරුණු පස මවු

පියන් විසින් දරුවන්ගෙන් බලාපොරොත්තු වන බව ඒ තථාගත දෙශනාවෙන් ප්‍රකාශ වෙයි. නුවණින් සලකා බලන කල සිය ලුම මවුපියන් තුළ මේ බලාපොරොත්තු ඇතිබව අපට සිතාගත හැකිය.

එබැවින් මවුපියන්ගේ ඒ බලාපොරොත්තු ඉෂ්ටකිරීමෙන් ඔවුන් සතුටු කිරීම සියලුම දරුවන් විසින් කළයුතු විශෙෂ යුතුකමකි. එයින් තමන්ට මෙලොව සැපදායක ජීවිතයක් ගත කරන්ට හැකිවනු පමණක් නොව ඒ හෙතු කොට ගෙණ පර ලොව සුගති සැපසට ද පැමිණිය හැක්කේය. එසේම, මවුපියන් නොසලකන්නෝ හෙවත් ඔවුන්ට උපස්ථාන නොකරන්නෝ කළ ගුණ නොදන්නෝය, අසත්පුරුෂයෝය, යනු අමුතුවෙන් පහදා දිය යුත්තක් නොවේ. ඒ බව පාඨශාලාවට යන ලමයි පවා දනිති. මවුපියන් පමණ දරුවන්ට උපකාර වූවෝ තවත් නැත. ඔවුන්ගේ උපකාරය නැත් නම් කිසිවෙකුට මෙලොව ඉපිද උසස් හෝ පහත් ජීවිතයක් ගතකළ නොහැක. දරුවන්ගේ ජීවිතය දෙමවුපියන් විසින් පාලනය කරණ ලද්දේ ද නොකඩවා පවත් වන ලද්දේ ද වෙයි. එසේම දරුවන්ගේ අත් පා ආදිය වර්ධ නය කිරීමෙන් ඔවුන් පොෂණය කළෝ ද දෙමවුපියෝ මය.

“බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා
තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො,,

යනාදීන් බුදුරජානන් වහන්සේ විසින් ද ඔවුන්ගේ අගය වර්ණනා කරණ ලද්දේය. මවුපියනු බ්‍රහ්මයා යයි ද පූර්වාචාර්‍ය්‍යයෝ යයි ද කියනු ලැබෙත්. දරුවන්ගේ ආහුනෙය්‍යයෝ ද, හෙවත් දරුවන්ගේ සත්කාරයන් ලැබීමට සුදුස්සෝ ද වෙත්. පුත්‍රප්‍රජාවට අනුකම්පා කරන්නෝ වෙත්. එහෙයින් නුවණැති පුද්ගල තෙමේ ඔවුන්ට නමස්කාර කරන්නේය. නැවත සත්කාර ද කරන්නේය. යනු එහි තේරුම යි. දෙමවුපියනු දරුවන්ට බ්‍රහ්මයා වැන්නෝය. ඒ එසේ මය. බ්‍රහ්මතෙමේ මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්‍ෂා යන සිවුවැදෑරුම් භාවනාව පවත්වයි. එපරිද්දෙන්ම මවුපියනු ද දරුවන් කෙරෙහි ඒ ඒ කාලවල මේ සතර භාවනාව පවත්වති.

කෙසේද යත්? ලමයා මවුකුස වසන කල නිරොගී වූ පිරි පුන් අඟ පසඟ ඇති අපගේ දරුවා කවර කලෙක දක්නෙමු දෑයි මෙසේ මවුපියන්හට මෛත්‍රී සහගත සිතක් පහළ වේ. එසේම උඩු කුරුව සයනය කරණ ලදරුකාලයෙහි උකුණු මකුණු ආදී සතුන් විසින් ඩංකලදුව හෝ දුකසේ හෙවීම හෙතු කොට ගෙණ

පෙළීමෙන් හෝ හඬන විට ඒ ශබ්දය ඇසීමෙන් මවුපියන්ට කරුණා සහගත සිතක් පහළ වෙයි. දුව පනිමින් ක්‍රීඩා කරණ කාලයෙහි දරුවා දෙස බැලීමෙන් මවුපියන්ගේ හිත සතුටු වූයේ ආමොදිත වූයේ ප්‍රමුදිත වූයේ වෙයි. එබැවින් ඒ කාලයෙහි ඔවුන්ට මුදිතාව උපදියි. එසේම දරුවා සුදුසු සත්‍රියක් සරණ පාවාගෙණ හෝ සුදුසු ස්වාමිපුරුෂයෙකු වෙත ගොස් හෝ මවුපියන්ගෙන් වෙන්ව ගෘහස්ථ ජීවිතයක් ගතකරණ කාලයෙහි දැන් අපේ දරුවාට ස්වකීය ශක්තියෙන් යැපිය හැක්කේය''යි මෙසේ මධ්‍යස්ථ භාවයක් උපදී. එහෙයින් දෙමවුපියන්ට ඒ කාලයෙහි උපෙක්ෂාව ලැබෙයි. මෙපරිද්දෙන් සලකන විට මෛත්‍රී, කරුණා මුදිතා, උපෙක්ෂා යන සිවුවැදෑරුම් භාවනාව මවුපියන් විසින්ද දරුවන් කෙරෙහි පවත්වනු ලැබේ. එසේ හෙයින් ඔහු බ්‍රහ්මයා මෙනැයි බුදුරජනන් වහන්සේ වදාළ සේක.

පළමු කොට උගන්වන ගුරුවරු පූර්වාචාර්යවරු හෙවත් මුල් ගුරුවරු වෙති. එසේ බලන කල සියල්ලන්ගේම මුල් ගුරුවරු දෙමවුපියෝ මය. ඔව්හු දරුවන් කුඩා කල පටන්ම ''මෙසේ හිඳුව, මෙසේ සිටුව, මෙසේ යව, මෙසේ නිදව, මෙසේ කව, මෙසේ බොව, මොහුට පියා යයි කිය යුතුය, මොහුට සහෝදරයා යයි කිය යුතුය, මැට නැගනියෝ යයි කිය යුතුය, මෙය කළ යුතුය, අස වලා වෙත එළඹිය යුතුය, අසවලා වෙත නොඑළඹිය යුතුය,,යි මෙසේ උගන්වති, හික්මවති, අනික් සියලු ධර්මවිනය ශබ්ද ශාස්ත්‍රාදිය උගන්වන්නෝ අපරාචාර්යවරයෝ හෙවත් පසුව උගන්වන්නෝ වෙති. එබැවින් දෙමවුපියෝම පූර්වාචාර්යයන් බවද එකහෙලා පිළිගත යුතුයි.

මනාකොට පිළියෙළ කරණ ලද ආහාර පානාදිය ''ආහුන'' නම් වේ. ඒ පිළිගැණීමට සුදුස්සෝ ''ආහුනෙය්‍ය'' වෙති. දරුවන් විසින් මනා භක්තියෙන් යුක්තව සම්පාදනය කරණ ලද ආහාරපානාදී ඒ ආහුනය පිළිගැණීමට මවුපියෝ සුදුස්සෝ වෙත්. එහෙයින් ඔව්හු පුත්‍රයන්ට ආහුනෙය්‍යයෝ යයි ද වදාරණ ලද්දේය. එපමණක් නොව, මවුපියෝ අනුන්ගේ සතුන් විනාශ කරමින් ද තමන්ගේ ප්‍රජාවම රැක බලා ගැණීමට පොෂණය කර ගැණීමට බලාපොරොත්තු වෙති. එසේ හෙයින් ඔවුන් පුත්‍ර ප්‍රජාවට අනුකම්පා කරන්නන් බවද සිතාගත හැක්කේය.

මෙසේ සලකා බලනකල සියලුම දරුවන් විසින් ස්වකීය මවුපියන්ට සත්කාර සම්මාන කළ යුතුය, වැන්ද යුතුය, පිදිය යුතුය, **සත්පුරුෂ කම නම් එයය.**

අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච
තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති.

යනුවෙන් ඔවුන්ට උපස්ථාන කළ යුතු අයුරු තථාගතයන් වහන්සේ ප්‍රකාශ කළ සේක. කැඳ බත් ආදි ආහාර සපයා දීමෙන්ද, අෂ්ටවිධ පානාදී පැන් දීමෙන්ද, හඳනා පොරෝණා වස්ත්‍ර දීමෙන්ද, ඇඳ පුටු ආදී සයනයන් දීමෙන් ද, ඇඟ ඉලීමෙන් ද, නෑවීමෙන් ද, උණු පැන් සිහිල් පැන් ආදියෙන් පා සේදවීමෙන් ද, මවුපියන්ට උපස්ථාන කළයුතු බවත්, එපරිද්දෙන් ඔවුන් කෙරෙහි පිළිපදනා පුද්ගලයා මෙලොවදීම පණ්ඩිත ජනයාගේ ප්‍රශංසාවට භාජන වන බවත්, ඒ උපස්ථාන කිරීමේ පිණ හේතු කොට ගෙණ පරලොව ද ස්වර්ගසම්පත්තිය ලබන බවත් ඒ ගාථා දෙකින් උගන්වනු ලැබේ. එසේ මවුපියන් කෙරෙහි සත්කාර ගරුකාර පවත්වන්නා නියම සත්පුරුෂයෙකි. එබැවින් හෙතෙම දෙලොවම යහපත සිදුකර ගණී.

පූර්වොක්ත පරිදි ආහාර දීම් ආදියෙන් කෙතෙක් උපකාර කළත් මවුපියන් විසින් තමන්ට කරණ ලද උපකාරයට කිසි සේත් ප්‍රමාණ නොවේ. ඒ බවද බුදුරජනන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලද්දේය.

ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි, මාතුච්ච, පිතුච්ච, එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය, එකෙන පිතරං පරිහරෙය්‍ය වස්සසතායුකො වස්සසතජීවී සො ච නෙසං උච්ඡාදන පරිමද්දන නහාපන සම්බාහනෙන, තෙපි තත්ථෙව මුත්තකරීසං චජෙය්‍යුං, නත්වෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති පතිකතං වා, ඉමිස්සා ච භික්ඛවෙ මහාපඨවියා පහූතසත්තරතනාය මාතාපිතරො ඉස්සරියාධිපච්ච රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය, නත්වෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති පතිකතං වා.

මහණෙනි! මවද පියාද යන දෙදෙනාට සුවසේ ප්‍රත්‍යුපකාර කළහැක්කේ යයි මම නොකියමි. අවුරුදු සියයක් ආයුෂ ඇති අවුරුදු සියය මුළුල්ලෙහි ජීවත් වන්නෙක් මව එක් අංශයකද පියා අනික් අංශයෙහිද තබා ගෙණ ඔවුන් තමන්ගේ අංශයන්හිම මල මූත්‍ර කරද්දීත් ඇඟ ඉලීම්, පිරිමැදීම්, නෑවීම්, අත් පා මිරිකීම් ආදියෙන් උපස්ථාන කරන්නේ නමුත් මවුපියන් විසින් තමන්ට කරණ ලද උපකාරයට සෑහෙන ප්‍රත්‍යුපකාර කළ හැනැත්තෙකු

නොවන බවත්, එසේම බොහෝ සත්රුවින් ඇති මේ මහ පොළොවට අධිපතිභාවය ඇති රජකමෙහි තම දෙමව්පියන් පිහිට වූයේ වී නමුත් සෑහෙන ප්‍රත්‍යුපකාරයක් නොවන බවත් එයින් උගන්වන අදහසයි. මේ අයුරින් බලන කල සිය මව්පියන්ට අවුරුදු සියයක් මුළුල්ලෙහි උපස්ථාන කළත් ඔවුන් මුළු ලොව රජ බැව්හි තැබුවත් මදි බව මනාකොටම වැටහිය යුතුය. මේ හැර වෙනත් නොයෙක් අවස්ථාවලදී ද මව්පියන්ගේ අගය බුදුරජානන් වහන්සේ වදාළ සේක.

එසේ හෙයින් ඔවුන්ට සැලකීම නුවණැති සියල්ලෝම ඉතා ශ්‍රේෂ්ඨ කටයුත්තක් ලෙස කල්පනා කළහ. ලක්දිව රජකළ පස්වෙනි **අග්බෝ රජතුමා** මවට සැලකූ පරිදි ඉතිහාසයෙන් දත යුතුයි. ඒ ගැණ මහාවංශයෙහි මෙසේ සඳහන් වේ "හෙතෙම දිවය දෙක්හි මෑනියන්ට උපස්ථාන කිරීමෙහි ඇලුනේ විය. උදෑසනම රජතෙම මෑනියන් උපස්ථානයට ගොස් හිස තෙල් ගා ඇඟ දූලි ආදිය උලා නිය ශුද්ධ කොට ආදර සහිතව නාවා සුව පහස් ඇති අලුත් වත් තමාම හඳවා හළ වත ගෙණ තමන්ම (සෝදා) මිරිකා ඒ වස්ත්‍රයේ ජලයෙන් ඔවුනු සහිත තමා හිස තෙමා ඒ මෑනියන් සුවඳ මලින් චෛත්‍යයක් මෙන් පුදා ඇය ප්‍රදක්ෂිණා කොට තුන්වරක් වැඳ ඇයගේ පිරිසට වස්ත්‍රාදියෙන් රුචිවූ දෙය දී මාහැඟි වූ බොජුන් සියතින් වලඳවා වලඳ ඉතිරිවූ දෙය අනුභව කොට ගිසෙහි ද විසුරුවා ගෙණ ඒ බිසවුන්ගේ පිරිසට ද උතුම් වූ රාජභෝජනය අනුභව කරවා වාසය කරණ ගෙයද සුවඳ කවා සජ්ජිත කොට එහි යහනක් මනාකොට සියතින් පණවා පාදයන් සෝදා සිනිඳු කොට සුවඳ තෙල් ගල්වා මිරිකමින් හිඳ ඇය නිද්‍රාවට පමුණුවා ඇඳ පැදකුණු කොට මොනවට තුන්වරක් වැඳ දසුන්ද කම්කරුවන් ද ආරක්ෂාකාරයන් සේ නියෝග කොට ඇය දෙසට පිටු නොපා පිටිපසින්ම ඉවත්ව නොපෙණෙන තන්හි සිට නැවත තුන්වරක් වැඳ ඒ කර්‍මයෙන් සතුටුව එය නැවත නැවත සිහි කෙරෙමින් ගෙට යේ." මේ රජතුමන් තුළ සිය මව කෙරෙහි කොපමණ ලොකු භක්තියක් ගෞරවයක් පැවතුනේ ද යනු මෙයින් සිතා ගත හැකිය.

මෙපමණක් නොව තිරිසන් ගත සත්වයෝ පවා දෙමවුපියන් ඉතා අගය කොට සැලකූහ. පෙර කොසොල් රට සාකෙත නුවර **කොසොල් රජහු** රජකරණ සමයෙහි බෝසත් තෙමේ මුව යෝනියෙහි ඉපිද නන්දිය යන නමින් යුක්තව මවුපියන්ට උපස්ථාන කරමින් විසුවේය. එකල එක්දිනක් මවුපියන් සමග රුක්පඳුරක නින්දට වනි. මේ අතරෙහි මුවදඩ ගිය මිනිස්සු

පඳුර වට කළහ. එවිට නන්දිය මෘගතෙමේ අවදිව මවුපියන් අමතා සැනසෙන ලෙස කියා ඔවුන්ගේ දිවි ගලවනුවස් තෙමේ දිවි පුද මිනිසුන් ඉදිරියට ගියේය. (මේ පිළිබඳ විස්තර කථාව නන්දිය මිග ජාතකයෙන් දතයුතුයි) තිරිසන් ගත සතුන් පවා දෙමවුපියන්ට දිවි පිදූ අයුරු මෙයින් පෙණේ. ඒ එසේ නම් නුවණැති මිනිසුන් විසින් ඔවුන්ට කෙසේ සැලකිය යුතුද යනු විස්තර කළ යුත්තක් නොවේ.

මවුපියන්ට සඞ්ග්‍රහ නොකිරීම මෙලොවම පිරිහීමේ මූල බව පරාභව සූත්‍රයෙහි මෙසේ දක්වේ.

යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං
පහු සන්තො න භරති තං පරාභවතො මුඛං.

යමෙක් පුළුවන් කම තිබෙද්දීත් මහලු වූ දිරාගිය මව හෝ පියා පෝෂණය නොකෙරේ නම් එය පිරිහෙන්නාගේ දොරය යනු එහි අදහසයි. හේ වසලයෙකැ යි (=රොඩියෙකැ යි) දත යුතුයි. මෙසේ මවුපියන් නොතකන අසත්පුරුෂ ජනතෙම මෙලොව ද නොයෙක් දුකට භාජනව පරලොව අනන්ත කාලයක් මුළුල්ලෙහි සතර අපා දුකට පත් වේ. කරුණු මෙසේ හෙයින් දෙලොව යහපත බලාපොරොත්තු වන නුවණැති සත්පුරුෂයන් විසින් ස්වකීය මාතෘ පිතෲන්ට ශක්ති පරිද්දෙන් සත්කාර සම්මාන කිරීමෙන් මෙලොව ද යහපත් ජීවිතයක් ගත කොට පරලොව ද සුගති සැප ලැබීමට බලාපොරොත්තු විය යුතුයි.

අන්තිමේ දී පායාසිරාජන්‍ය තෙමේ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ දෙශනාවට පැහැද තෙරුවන් සරණ ගොස් ශීල සමාධි ප්‍රඥා යන ශික්ෂාත්‍රය සඞ්ගෘහීත සර්වඥ ශාසනයෙහි උපාසක භාවය ප්‍රකාශ කෙළේය.

ශීලය.

එහි ශීලය නම් හික්මීම යි. සියලුම අකුශල ධර්මයන් ශලනය හෙවත් සංවරණය කරණ හෙයින් ද, සියලු කුශල ධර්මයන් නොවිසිරියදී දරණ හෙයින් ද ශීලයයි කියනු ලැබේ. යමෙකුගේ ශිරශ්ඡේද වූ (හිස සුන්) කල මුළු ජීවිතයම විනාශ වන්නාක් මෙන් ශීලභෙදය වූ කල ඔහුගේ සියලු ගුණ ශරීරය විනාශයට පැමිණේ. එබැවින් ජීවතුන් අතර මිනිසෙකු මෙන් පෙණී සිටින්නහුට ශීලය උත්තමාඞ්ගය (හිස) ලෙස ධර්මානුකූලව සැලකිය හැකිය. **"පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා,,** යනුවෙන් ප්‍රාණඝාතාදියෙන් වෙන් වන්නහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ

චේතනා, චෛතසික, සංවර, අවීතික්කම යන මොහු ශීලය යි
දක්වෙති. එහි චේතනා ශීලය නම් සතුන් මැරීම් ආදියෙන්
වැළකීමේ දී එබන්දක් නොකරන්නෙම් යි සිතෙහි පහළ වන පවි
ත්‍ර චේතනා (සිතිවිලි) රාශිය ද, භික්ෂු සාමණේරයන් විසින් ස්වකීය
ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි පැවැත්විය යුතු වත් පිළිවෙත්
සපයන අවස්ථාවෙහි සිතෙහි පහළ වන චේතනා රාශියද, පුත්‍රදාරා
දීන් විසින් ස්වකීය මවුපිය ගුරුවරාදීන් කෙරෙහි වත් පිළිවෙත්
සැපයීමේ දී පහළ වන චේතනා රාශිය ද යන මොහුයි.

ප්‍රාණඝාතාදි පඤ්චවිධ දුශ්චරිතයෙන් වෙන් වීමේදී සිතෙහි
පහළ වන විරති චෛතසිකයද, පරසම්පත්ති විෂයෙහි උපදනා දැඩි
ලෝභය මැඩ පැවැත්වීමෙහි උපකාරී වූ අනභිධ්‍යාව හා අනුන්
නසා ලීමෙහි පොහොසත් වූ ද්වේෂය යටපත් කර ලන අව්‍යාපාද
යද, විපරීත දෘෂ්ටියට ප්‍රතිවිරුද්ධ වූ සම්‍යග්දෘෂ්ටිය ද චෛතසික
ශීල නම්.

සංවර ශීලය-පාතිමොක්ඛ සංවරය, සතිසංවරය, ඤාණසං
වරය, ඛන්තිසංවරය, විරියසංවරය යි පඤ්චවිධ වේ. විනය පිටක
යෙහි ආචාවූ ශික්ෂාපද සමූහය මනාකොට රැකීම ප්‍රාතිමෝක්ෂ සං
වර නම්. ඇස කණ-නාසය-දිව-කය-සිත යන ඉන්ද්‍රිය ධර්මයන්ට
ගොචර වන විසභාග අරමුණු වලින් සිත වළක්වා ගැණීම ස්මෘති
සංවර නම්. තෘෂ්ණා දෘෂ්ටි ආදි උපක්ලේශ ධර්මයන්ගේ හටගැන්
මක් ඇති කල්හි නුවණින් සලකා සංවර වීම ඤාණ සංවර නම්.
ශීතොෂ්ණාදීන් ඇතිවන උවදුරු සියල්ලෙහි ද්වේෂ නොකොට
ඉවසීම ඛන්තිසංවර නම්. කාම විතර්කාදිය ඇති වීමේදී ඔවුන්
යටපත් කොට තමා වසයෙහි සිත පිහිටුවා ගැණීම වීර්‍යසංවර
නම්. එහි විරතිශීලය-සම්පත්තවිරති-සමාදාන විරති-සමුච්ඡේද
විරති යයි තෙවැදෑරුම් වේ. සීලසමාදානයක් නැතත් කුලවංසාදිය
ගැණ සලකා ප්‍රාණඝාතාදියෙන් වෙන්වීම සම්පත්ත විරති නම්.
ශික්ෂාපද සමාදානයෙන් අකුශලයෙන් වෙන්වීම සමාදාන විරති
නම්. සෝවාන් ආදි මාර්ගවලට පැමිණීමෙන් අකුශලයෙන් වෙන්
වීම සමුච්ඡේද විරති නම්.

අවීතික්කම සීලය නම් සමාදන්ව ගත් සීලය කඩ නොකොට
රැක ගැන්මයි. මෙසේ ශීලයෙහි ප්‍රභේදයෝ බොහෝ වෙති.
මනුෂ්‍යයෙකුට මෙතරම් පිහිට ඇති කිසිම වස්තුවක් භවත්‍රයේම
නැත. මහාගඞ්ගා ජලයෙනුදු පවිත්‍ර කළ නොහැකි කෙලෙස් මල
සෝදා හැරීමට මෙතරම් පිවිතුරු ජලයක් මිහිපිට නැත. උඩු සුළ
ඟට මෙන් යටි සුළඟට ද හමන මිහිරි සුගන්ධයක් මේ හැර වෙන

නැත. එසේම මිනිසුන්ගෙන් පමණක් නොව සක්දෙවිඳුගෙන් පවා වැඳුම් ලබන උතුම් ගුණධර්මයකි. ස්වර්ගයට නැගීමට හිනි මගෙකි. නිර්වාණ නැමැති අභය පුරයට පිවිසීමෙහි දොරටුවෙකි. අනිමිත සියලු සැප සලසා ලීමෙහි කප් රුකෙකි. සසර සයුරෙන් එතර කරවන මහනැවකි. ජාති ජරා මරණ මහ ගිම් නිවන මෙඝයකි. වස්තුලාභය, කීර්තිරාවය, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී බලසම්පන්න ඕනෑම පිරිසක් කරා නිර්භයව යාහැකි බව හා නුමුළාව කළුරිය කිරීම යන මෙලොවදීම ලැබියහැකි අනුසස් සතරකින් හා මරණින් මතු ස්වර්ගයෙහි ඉපදීම ද යන අනුසස් පසකින් යුත් මේ ශීලය කිරලා බිත්තර රක්නාක් මෙන් ද, සෙමර මුවා වාලධිය රැකගන්නාක් මෙන් ද. ප්‍රිය පුතෙකු රක්නා මවක මෙන් ද, එක ඇසක් ඇති පුරුෂයෙකු ඒ ඇස මෙන් ද, ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්තව රැක්ක යුත්තේය.

සමාධිය.

සමාධි නම් චිත්තෛකාග්‍රතාව සි හෙවත් සිතේ එකඟ කමයි. නොයෙක් පාප අරමුණු ගන්නා ලාමක සිත භාවනා ශක්තියෙන් විසිර යා නොදී එකම කුසල් අරමුණෙක ස්ථිරව පිහිටුවා ගැණීම මෙයින් අදහස් කරණු ලැබේ. යම් ධර්මයක ආනුභාවය කරණ කොට ගෙණ චිත්ත චෛතසික ධර්මයෝ එකම අරමුණෙක මනා කොට පවතිත් නම් ඒ සමාධි යයි දතයුතු සි. චෛතසික වශයෙන් මෙය එකාග්‍රතා චෛතසිකය මය. ඒ වනාහි සියලුම සිත් වල යෙදෙන චෛතසිකයෙකි. එහෙත් ඒ සියලු එකාග්‍රතාවෝම සමාධි නොවෙති. අකුශල සිත්හි යෙදෙන එකඟකම චිත්තයාගේ විසිරයාම ලක්ෂණ කොට ඇති උද්ධච්චයෙන් කම්පා කරණ හෙයින් ස්ථිර නැත. රාහු අල්වා ගත් චන්ද්‍රයාට ස්වකීය ආලෝකය පැතිර විය නොහැක්කා සේ උද්ධච්චය සමග යෙදුනු අකුශල චිත්තෛකාග්‍රතාවට ස්වකීය බලය පෑ නොහැක. එහෙයින් මෙහි සමාධි යයි ගණුලබන්නේ කුසල් සිතේ එකඟ කම පමණක් යයි දත යුතුයි.

ලෞකික ලෝකෝත්තර වශයෙන් විභේදයක් කොට ගන්නා කල මාර්ග චිත්තයන් සමග යෙදුනු සමාධිය ලෝකෝත්තර නම්. කාමාවචර රූපාවචර අරූපාවචර චිත්තයන් සමග යෙදුනු මාධිය ලෞකික නම්. අර්පණා–උපචාර භේදයෙහි ගොත්‍රභූ සිතට අනතුරුව උපදනා ධ්‍යාන සිත සමග යෙදුනු එකාග්‍රතා චෛතසිකය අර්පණා සමාධි නම්. එට පූර්වභාගයෙහි ලැබෙන එකාග්‍රතාව උපචාර සමාධි නම්. ප්‍රථමධ්‍යානය උපදවනු කැමති

යෝගාවචරයා අභිමත භාවනාවක් ඉගෙණ යථාවිධීන් භාවනා කරණ කල ධ්‍යානය ලැබීමට ආසන්න චිත්තවීථියේ මනොද්වාරාවර්ජනයට අනතුරුව උපදනා ජවන් පසින් දෙවන සිත උපචාර නම්. පස්වන සිත අර්පණා නම්.

මනාකොට සිත සමාධිගත වනතුරු ත්‍රිලක්‍ෂණය යථා ස්වභාවයෙන් නො වැටහේ. කුමක් හෙයින්ද යත්? සිත සමාධි ගත වනතුරු තිලකුණු වැටහෙන නුවණ නූපදනා හෙයිනි. එකී නුවණ උපදින තුරු නිත්‍ය-ශුභ-ආත්ම යන වරදවා ගත් සංඥාවෝ දුරු නොවෙති. ඔවුන් දුරු වනතුරු සත්කාය දෘෂ්ටි ආදි කෙලෙස් පහ නොවේ. ඒ පහවන තෙක් සසරින් මිදීමක් නැත. එබැවින් ස්වකීය චිත්තය යටත් පිරිසෙයින් කාමාවචර සමාධියෙන් චිත් සමාහිත කටයුතුයි. සමාහිත සිතින් බලන කල අසමාහිතයා පිස්සෙකු මෙන් පෙණේ. සමාහිතයාට සිය සිත මුළුදවස වුවද එක අරමුණෙක පවත්වා ගත හැක. අසමාහිතයාට මොහොතකුදු එසේ කළ නොහැක. මෙසේ හෙයින් සම්කිසි කර්මස්ථාන භාවනාවක් පුරුදු කිරීමෙන් සමාධිය වැඩීමට උත්සාහ කළ යුතුයි.

ප්‍රඥාව.

ප්‍රඥා නම් නුවණ යි. **"පජානනට්ඨෙන පඤ්ඤා"** යනුවෙන් නානාප්‍රකාරයෙන් දැන ගැණීම් අර්ථයෙන් ප්‍රඥා ය යි කියනු ලැබේ. කුසල් සිත සමග යෙදුනු විදර්ශනාඥානය හෙවත් ත්‍රිලක්‍ෂණය තේරුම් ගන්නා නුවණ මෙහි ප්‍රඥාව බැව් සැලකිය යුතුයි. ලෞකික ලොකොත්තර වශයෙන් ද, සඤ්ඤා-විඤ්ඤාණ-පඤ්ඤා වසයෙන් ද, ආයකොසල්ල-අපායකොසල්ල-උපායකොසල්ල වසයෙන් හා චින්තාමය-සුතමය-භාවනාමය වසයෙන් ද, චතුස්සත්‍ය චතුපටිසම්භිදාදී වසයෙන් ද, ප්‍රඥාවෙහි ප්‍රභෙද බොහෝ වුවත් ඒ පිළිබඳ විස්තරයක් කිරීමට මෙහි අවකාශ නැත. එහෙයින් මේ දක්වනු ලබන්නේ සාමාන්‍ය හැඳින්වීමකි. නුවණින් තොරව කරණ ලද දානාදි පුණ්‍යක්‍රියාවෝ පිරිසිදු නොවෙති. එසේම ප්‍රඥාව නැතිකල්හි තෘෂ්ණාදි සංක්ලෙශයන්ගෙන් වෙන් වීමක් නැති හෙයින් පාරිශුද්ධියක් නොලැබේ. නැණැත්තේම ගෘහවාසයෙහි හා පඤ්චකාමයෙහි ආදීනව ද, පැවිද්දෙහි හා ධ්‍යාන සැපතෙහි අනුසස් ද දැන ඊට පැමිණ අන්‍යයන් ද එහි පිහිටුවයි. ප්‍රඥා රහිත වීර්‍ය්‍යයෙන් අභිමතාර්ථ සිද්ධිය නොවන්නාක් මෙන් ම ප්‍රඥානුයාත වීර්‍ය්‍යයෙන් නොලද හැකි සැපයෙක් ද නැත්තේය. දුල්වූ නුවණැස් ඇති මහාබොධිසත්වයෝ ස්වකීය ශරීරාවයව පවා පරිත්‍යාග කොට හිතාහිත කාටත් සමාන ගති ඇති බෙහෙත් ගසක් මෙන් නො වෙනස්ව කාලත්‍රයෙහි සතුටු සිත් ඇත්තාහු දෙලෝ වැඩ

සාදෘ ලිමෙනි පොහොසත් උපාඥනයෙන් ද යුක්ත වෙති. එසේම නුවණැත්තෝ සතුරු මිතුරු හැමදෙනාටම එකසේ හිත සැප එලවීමෙනි සමත් වන අතරම අෂ්ටලොක ධර්මයෙන් කම්පිත ද නොවෙති.

අග්නි ආලොකය-චන්ද්‍රාලොකය-සූර්‍ය්‍යාලොකය-ප්‍රඥාලොකය යි ආලොක සතරෙකි. එයින් අග්නි-චන්ද්‍ර-සූර්‍ය්‍යාලොකයෝ සීමා සහිත යහ. සඳහිරුගේ ආලෝකය එක සක්වළකට ම ලැබේ. සම්පූර්ණ ප්‍රඥාලොකයෙන් යුත් අප බුදුරජාණන්වහන්සේගේ ඥාණමණ්ඩලය අනන්තාපරිමාණ සක්වලෙහි පැතිර පවත්නා හෙයින් සෙසු චන්ද්‍රාලොකාදීයට වඩා ප්‍රඥාලොකය ශ්‍රෙෂ්ඨ බව කිවමනා නොවේ.

අධිශිල ශික්ෂාදීන් කෙරෙහි නො ඇල්ම හා අලස බවද, ගණිකා කෙරෙහි ඇල්ම හා පමණ ඉක්ම වූ නිද්‍රාව ද, නොසන්සුන් ගතිය හා නුවණ නැත්තවුන් ආශ්‍රය කිරීම ද, ආත්ම ගෞරව යෙන් තොර වීම හා විපරීත අදහස් ඇතිබව ද, බොහෝ කොට ශරීරය ප්‍රණීතමත් කිරීම හා මිථ්‍යා විතර්ක ඇතිබව ද, ප්‍රශ්න නොකි රීම හා ජාති ජරාදීන් ගැණ සංවේග නූපදවන බව ද ප්‍රඥාව වැඩී මට බාධක වෙති. එසේම වයසට පැමිණීමෙන් හා කීර්ති ප්‍රශංසා පරිවාර සම්පත් ලැබීමෙන් ද, නැවත නැවත ප්‍රශ්න විචාරීමෙන් හා සත්පත් ගුරු ආශ්‍රයෙන් ද, යොනිසො මනසිකාරයෙන් හා ධර්ම සාකච්ඡාවෙන් ද, හිත වතුන් ඇසුරු කිරීමෙන් හා නුනුරුවන් පවත්නා සුදුසු ප්‍රදෙශවල වාසය කිරීමෙන් ද යන මේ කරුණු වලින් ප්‍රඥාව වැඩෙන බැව් දත යුතුයි. එබැවින් සසර කතරින් එතර වනු කැමැත්තන් විසින් උභය ලොකාර්ථසිද්ධියට මහොප කාරි වූ ප්‍රඥාව දියුණු කරගැණීමට උත්සාහවත් වියයුතු.

මෙසේ ඉතා සංක්ෂෙපයෙන් දක්වනලද මේ ශීල සමාධි ප්‍රඥා වෝ සම්බුද්ධ ශාසනයෙහි ආදි මධ්‍ය පර්‍ය්‍යවසානයෝ යි. ඔවුන් වැඩීමෙන් ම අනුත්තර වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කළ යුත්තේය. එබැ වින් ඔහු ශික්ෂා නාමයෙන් දක්වන ලදහ. ඒ මේ ශික්ෂාත්‍රයෙහි හික්මෙන්නෝ ශෛක්ෂ නම් වෙත්. හික්මී නිමාවට පැමිණි රහ තුන් වහන්සේ අශෛක්ෂ නම් වෙති. උන්වහන්සේ විසින් තවත් කළ යුතු කිසිවක් නොමැත්තේය. එසේ හෙයින් ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මීමෙන් හෙවත් ඒ ගුණ ධර්මයන් වැඩීමෙන් සියලු සසර දුක් දුරු කොට ලැබියයුතු උත්තම වූ නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කර ගැණීමට ආගම භක්තියෙන් විශුද්ධ වූ සියින් යුක්තවූ උත්සාහ කටයුතුයි.

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.